# වාර්ෂික වාර්තාව

# ஆண்டறிக்கை

# ANNUAL REPORT 2014

ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව

இலங்கை ரூபவாஹினிக் கூட்டுத்தாபனம்

SRILANKA RUPAVAHINI CORPORATION

**P.O. Box** : 2204 , Independence Square , Colombo 07 , Sri Lanka

**Telephone** : 0112501050 -53 / 0112599505 – 9

**Fax** : 0112580131

**Email** : chmn@rupavahini.lk

**Website** : www.rupavahini.lk

ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව

இலங்கை ரூபவாஹினிக் கூட்டுத்தாபனம

SRI LANKA RUPAVAHINI CORPORATION

# ගරු ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යතුමා වෙතටයි

ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ සභාපතිවරයා හා සාමාජිකයන් වන අප 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (1) වගන්තිය යටතේ 2014 වර්ෂය සඳහා වන වාර්ෂික වාර්තාව මේ සමඟ ඉදිරිපත් කරමු.

ගිණුම් වාර්තා ද අමුණා ඇත.

ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව වෙනුවෙන්

විමල් රූබසිංහ

සභාපති

ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව

නිදහස් චතුරශ්‍රය

කොළඹ 07

## දැක්ම

ඇසිදිසි මාධ්‍යයේ නිබඳ ශ්‍රී ලාංකේය මුද්‍රාව

## මෙහෙවර

දැනුම විනෝදය අධ්‍යාපනය සපිරි කාලෝචිත අර්ථපූර්ණ ප්‍රතිභාසම්පන්න වැඩසටහන් කැපවීමෙන් යුතුව එක්සත්ව නිර්මාණය කර නව තාක්ෂණයෙන් ඔප්නංවා සිවුදෙස විසිරි ශ්‍රී ලාංකිකයන්ගේ අපේක්ෂා අභිබවමින් විසුරුවා හැරීම.

## ඉලක්ක

- රූපවාහිනී වැඩසටහන්වල ආකෘතිමය වෙනස්කම් තුළින් ආකර්ෂණීයභාවය විවිධත්වය හා අර්ථපූර්ණභාවය වැඩි දියුණු කිරිම.
- නව තාක්ෂණික ක්‍රම යොදා ගනිමින් පර්යේෂකයින් වෙත පහසුවෙන් ළඟාවීම.
- ආයතනයේ භෞතික හා මානව සම්පත් ඵලදායි ලෙස වැඩි දියුණු කිරීම.
- ආයතනයට අතිරේක ආදායම් උත්පාදන මාර්ග හඳුන්වාදීම.
- තරඟකාරීත්වයට ගැලපෙන පරිදි ආයතනයේ ව්‍යවස්ථාපිත රාමුව සංශෝධනය කිරීම.

# පටුන


| | |
|---|---|
| සභාපතිතුමාගෙන් | 06 |
| සංස්ථා අධ්‍යක්ෂ මණ්ඩලය | 07 |
| ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය | 08 |
| අධ්‍යක්ෂවරු | 11 |
| සම්මානනීය ජයග්‍රහණ | 12 |
| වැඩසටහන් අංශය | 17 |
| අධ්‍යාපන වැඩසටහන් අංශය | 27 |
| ප්‍රවෘත්ති හා කාලීන සිදුවීම් අංශය | 32 |
| නිෂ්පාදන සේවා අංශය | 35 |
| ඉංජිනේරු අංශය | 44 |
| අලෙවි අංශය | 53 |
| පරිපාලන අංශය | 55 |
| මුදල් අංශය | 67 |
| අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් පිළිබඳ ප්‍රකාශනය | 68 |
| මූල්‍ය වාර්තාව | 69 |
| විගනණ වාර්තාව | 119 |

## සභාපතිතුමාගෙන් ...

ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ 2014 වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීමට ලැබීම පිළිබඳව සභාපතිවරයා ලෙස සතුටු වෙමි.

2015 ජනවාරි මාසයේ මෙරට සිදුවූ දේශපාලන පෙරලියෙන් පසු ඇති වූ යහපාලන පරිසරය තුළ මා විසින් මෙම ආයතනයේ වගකීම බාර ගැනිණ.දේශපාලන අර්බුද හා මැතිවරණය මැද ගෙවී ගිය වසරක් වුවත් 2014 වසර තුළ ජාතික ආයතනයක් ලෙස රූපවාහිනී සංස්ථා කාර්ය මණ්ඩලය කැපවීමෙන් ලබාගත් ජයග්‍රහණ මෙහිදී සටහන් කරන්නේ ඔවුන්ට ගෞරවයක් ලෙසිනි.

උක්ත කාලය තුළ විකාශය වූ හා නිෂ්පාදනය කළ වැඩසටහන් සඳහා ජාතික මට්ටමෙන් සම්මාන 20 කට වැඩි ප්‍රමාණයක් හා අන්තර්ජාතික සම්මාන රැසක් ද ලබා ඇත.

රූපවාහිනී මාධ්‍යයේ ප්‍රමුඛ කාලය ආවරණය කරන ප්‍රසාංගික ටෙලි නාට්‍ය රැසක් ද නිර්මාණය වී ඇත. ඒ අතර රූපවාහිනියට අලුත් අත්දැකීමක් වූ "භාව තීර්ථ" වැනි ටෙලි චිත්‍රපට  නිර්මාණය වීම ද  වැදගත් පියවරකි.

සියලු අභියෝග හමුවේ තම ආයතනය වෙනුවෙන් කැපවී කටයුතු කරන කාර්ය මණ්ඩලයට මාගේ ස්තූතිය පුදකරන  අතර එළඹ ඇති වාතාවරණය ප්‍රයෝජනයට ගනිමින් වඩාත් අර්ථවත් හා ඵලදායි ජාතික මාධ්‍ය මෙහෙවරක යෙදීමට සැමගේ සහය අපේක්ෂා කරමි. ගිලිහී ගිය ප්‍රේක්ෂක විශ්වාසය යළි තහවුරු කරගැනීමට අදිටන් පෙරදැරිව කටයුතු කිරීම අපගේ අපේක්ෂාවයි.

නීතීඥ රවී ජයවර්ධන

සභාපති

ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව

## සංස්ථා අධ්‍යක්ෂ මණ්ඩලය

2014 වර්ෂයේ සංස්ථා අධ්‍යක්ෂ මණ්ඩලය හෙබ වූ සමාජිකයින් පහත දැක්වේ.

- විමල් රූබසිංහ මහතා - සභාපති/සංස්ථා මණ්ඩල සාමාජික
- මහාචාර්ය රෝහණ ලක්ෂ්මන් පියදාස මහතා - සංස්ථා මණ්ඩල සාමාජික
- එඩ්වඩ් ජයකොඩි මහතා - සංස්ථා මණ්ඩල සාමාජික
- හඩ්සන් සමරසිංහ මහතා - සංස්ථා මණ්ඩල සාමාජික
- අශෝක සේරසිංහ මහතා - සංස්ථා මණ්ඩල සාමාජික
- ඩී. කරුණාරත්න මහතා - සංස්ථා මණ්ඩල සාමාජික
- නිමල් බෝපගේ මහතා - සංස්ථා මණ්ඩල සාමාජික
- ඩී එම් අනුලා හරස්ගම මිය - සංස්ථා මණ්ඩල සාමාජික

(මෙම වර්ෂය තුළ සංස්ථා අධ්‍යක්ෂ මණ්ඩලය 11 වතාවක් රැස් වී තිබේ.)

## 2014 වර්ෂයේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය

සභාපති

විමල් රුබසිංහ මහතා

අධ්‍යක්ෂ ජනරාල්

චන්ද්‍රපාල ලියනගේ මහතා

ක්‍රියාකාරී අධ්‍යක්ෂ

ඩී. කරුණාරත්න මහතා

ප්‍රධාන විධායක නිලධාරී

ගාමිණී රාසපුත්‍ර මහතා

නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (වැඩසටහන්)

නිශාන්ත උභයවංශ මහතා

නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (ඉංජිනේරු)

රොහාන් පෙරේරා මහතා

නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (නිෂ්පාදන සේවා)

සුමේධ අතුලසිරි මහතා

අධ්‍යක්ෂ (පරිපාලන)

ජී.ජී.එස්.සී රෝෂන් මහතා

ප්‍රධාන ගණකාධිකාරී

**එම්.එස් දළුගොඩ මහතා**

අධ්‍යක්ෂ (අලෙවි)

**සනත් දළුවත්ත මහතා**

අධ්‍යක්ෂ (නේත්‍රා / චැනල් අයි / එන්ටීවී)

**පාලිත විජේසිංහ මහතා**

අධ්‍යක්ෂ (අධ්‍යාපන වැඩසටහන්)

**එරින් විජේකෝන් මිය**

අධ්‍යක්ෂ (පර්යේෂණ හා පුහුණු)

**ටී.එම්.ජී චන්ද්‍රසේකර මහතා**

අධ්‍යක්ෂ (සැපයීම්)

**ජී.පී.ජී තිස්ස මහතා**

අධ්‍යක්ෂ (ඉංජිනේරු)

**පාලිත ගාල්ලගේ මහතා**

අධ්‍යක්ෂ (හඬකැවීම්)

**අතුල රන්සිරිලාල් මහතා**

**අධ්‍යක්ෂ (නාට්‍ය)**

**විමලරත්න අදිකාරි මහතා**

**අධ්‍යක්ෂ (නිෂ්පාදන සේවා)**

**ෂර්ලි අනිල් ද සිල්වා මහතා**

**ප්‍රධාන අභ්‍යන්තර විගණක**

**පාලිත කුලසිංහ මහතා**

**ප්‍රධාන ඉංජිනේරු**

**කපිල දසනායක මහතා**

## 2014 වර්ෂයේ සංස්ථාවේ අධ්‍යක්ෂවරු

| | |
|---|---|
| අධ්‍යක්ෂ (පරිපාලන) - | ජී.ජී.එස්.සී රෝෂන් මහතා |
| ප්‍රධාන ගණකාධිකාරී - | එම්.එස් දළුගොඩ මහතා |
| අධ්‍යක්ෂ (අලෙවි) - | සනත් දළුවත්ත මහතා |
| අධ්‍යක්ෂ (නේත්‍රා / චැනල් අයි / එන්ටීවී) - | පාලිත විජේසිංහ මහතා |
| අධ්‍යක්ෂ (අධ්‍යාපන වැඩසටහන්) - | එරින් විජේකෝන් මිය |
| අධ්‍යක්ෂ (පර්යේෂණ හා පුහුණු) - | ටී.එම්.ජී චන්ද්‍රසේකර මහතා |
| අධ්‍යක්ෂ (සැපයීම්) - | ජී.පී.ජී තිස්ස මහතා |
| අධ්‍යක්ෂ (ඉංජිනේරු) - | පාලිත ගාල්ලගේ මහතා |
| අධ්‍යක්ෂ (හඬකැවීම්) - | අතුල රන්සිරිලාල් මහතා |
| අධ්‍යක්ෂ (නාට්‍ය) - | විමලරත්න අදිකාරි මහතා |
| අධ්‍යක්ෂ (නිෂ්පාදන සේවා) - | ෂර්ලි අනිල් ද සිල්වා මහතා |
| අධ්‍යක්ෂ (නිෂ්පාදන සේවා) - | ඥානසිංහ අධිකාරි මහතා |
| අධ්‍යක්ෂ (විවිධ වැඩසටහන්) - | දයාරත්න රටගෙදර මහතා |
| අධ්‍යක්ෂ - | විජය දිසානායක මහතා |

## සම්මානනීය ජයග්‍රහණ

| අංකය | වැඩසටහන | හිමි වූ ස්ථානය / සම්මානය / ඇගයීම | සම්මානලාභී |
|---|---|---|---|
| | **සුමති සම්මාන උළෙල** | | |
| 1 | "බිසෝවරුන්ගේ ජනපදය" | හොඳම වාර්තා වැඩසටහන | නාමල් ප්‍රසන්න |
| 2 | "අරුම පුදුම රෝද හතර" | හොඳම සඟරාමය වැඩසටහන | නාමල් සූරියබණ්ඩාර<br>චන්දන සෙනෙවිරත්න |
| 3 | "සල්මල් ලන්ද" | හොඳම ටෙලි නාට්‍ය ගීත රචනය | යූ.බී රත්නායක |
| 4 | "සල්මල් ලන්ද" | හොඳම ටෙලි නාට්‍ය ගායනය | අමරසිරි පීරිස්<br>දනෝද්‍යා අයෝනි |
| 5 | "බොරලු පාර" | හොඳම නිළිය | පබෝධා සන්දීපනී |
| 6 | "බොරලු පාර" | කුසලතා සම්මාන | ජෙහාන් ශ්‍රීකාන්ත අප්පුහාමි |
| 7 | "බොරලු පාර" | සහය නළුවා | ජගත් මනුවර්ණ |
| 8 | "ආලකමන්දාව" | හොඳම සංගීත වැඩසටහන | විනීතා කරුණාරත්න |
| 9 | "මාලිමා" | ජූරියේ විශේෂ සම්මාන | සුමින්ද තිලකසේන |
| 10 | "පොඩි හාමුදුරුවෝ" | වසරේ විශිෂ්ටතම ළමා වැඩසටහන | අතුල රත්සිරිලාල් |
| 11 | "ටිං පැටව්" | හොඳම ඒකාංගික ටෙලිනාට්‍යය | මොහාන්ජි රංගනාත් |
| 12 | "රිවිදින අරුණැල්ල" | හොඳම කාලීන වැඩසටහන | සිරිමලී අලහකෝන් |
| | **රයිගම් සම්මාන උළෙල** | | |
| 13 | "අරුම පුදුම රෝද හතර" | හොඳම සඟරාමය වැඩසටහන | නාමල් සූරියබණ්ඩාර<br>චන්දන සෙනෙවිරත්න |

| | | | |
|---|---|---|---|
| 14 | "බිසෝවරුන්ගේ ජනපදය" | හොඳම වාර්තා වැඩසටහන | නාමල් ප්‍රසන්න |
| 15 | " සීත දිය බඹන" | වසරේ විශිෂ්ටතම අධ්‍යාපන වැඩසටහන | ගාමිණී ජයන්ත අබේවික්‍රම |
| 16 | "මිහි මඩලේ ගීතය" | වසරේ විශිෂ්ටතම සංගීත වැඩසටහන | ශිරාන් රත්නායක |
| 17 | "පොඩි හාමුදුරුවෝ" | හොඳම ළමා වැඩසටහන | අතුල රන්සිරිලාල් |
| 18 | "ලියක මහිම" | හොඳම කාන්තා වැඩසටහන | කුමාරි මානෙල් |
| 19 | | හොඳම ප්‍රවෘත්ති නිවේදක | චමින්ද ගුණරත්න |
| | **රාජ්‍ය සම්මාන උළෙල** | | |
| 20 | "ආයුබෝ වේවා" | හොඳම සඟරාමය වැඩසටහන | සන්ධ්‍යා විතානවසම් |
| 21 | "රංගභූමි" | විශිෂ්ටතම බහු කැමරා නිෂ්පාදනය | රංග බණ්ඩාරනායක |
| 22 | "බොරලු පාර" | හොඳම නළුවා | වසන්ත කුමාරසිරි |
| 23 | "බොරලු පාර" | හොඳම නිළිය | තිසුරි යුවනිකා |
| 24 | "ආලකමන්දාව" වැඩසටහන් මාලාව | ජූරියේ විශේෂ ඇගයීම | විනීතා කරුණාරත්න |
| 25 | "පොඩි හාමුදුරුවෝ" | ප්‍රසාංගික ළමා වැඩසටහන | අතුල රන්සිරිලාල් |
| 26 | "කඳාවළලු" | වසරේ විශිෂ්ටතම ළමා වැඩසටහන | අතුල රන්සිරිලාල් |
| 27 | "අලවක්කරෙයි" (දෙමළ) | හොඳම ඒකාංගික නාට්‍යය | එස්.එම් මවුලානා |
| 28 | "චෝගම් "(දෙමළ) | හොඳම ගීතය | අසාරියා බෙගම් |
| 29 | "තිත්තික්කුම් දීපාවලී" (දෙමළ) | හොඳම සංස්කෘතික වැඩසටහන | බී නිත්‍යානන්දන් |
| 30 | "ෆිල්ම් සිටි"(දෙමළ) | කෙටි චිත්‍රපට සඟරාමය වැඩසටහන | එස් කෝනේෂ්වරන් |

| | | | |
|---|---|---|---|
| 31 | | හොඳම ග්‍රාෆික සජීවකරණ නිර්මාණය | හසිත හේරත් / තිරංජය දිල්හාන් |
| 32 | | හොඳම සම්ප්‍රවේශක | චමින්ද ගුණරත්න |
| 33 | "ටිං පැටව්" | අධ්‍යක්ෂණය සඳහා කුසලතා සම්මාන | මොහාන් ජී රංගනාත් |
| | **Japan Prize** | | |
| 34 | "පහේ පංතියේ සින්ඩරෙල්ලා" | Unicef Prize | නාමල් ප්‍රසන්න |

**සම්මාන සඳහා නිර්දේශික වැඩසටහන්**

| **අංකය** | **වැඩසටහන** | **සම්මානය** | **නිර්දේශිතයන්** |
|---|---|---|---|
| | **රයිගම් සම්මාන උළෙල** | | |
| 1 | "සුදු පෙණ මත පහුරු පැන්වීම" | වසරේ හොඳම ක්‍රීඩා වැඩසටහන. | මයුරි වානගුරු |
| 2 | "මාලිමා" | විශේෂ ජූරි සම්මානය | සුමින්ද තිලකසේන |
| 3 | "රූපාවලෝකනය" | හොඳම සඟරාමය වැඩසටහන. | සුනේත්‍රා කුමාරි |
| 4 | | හොඳම සම්ප්‍රවේශක | ආමන්ත විජේසූරිය |
| 5 | "ටිං පැටව්" | හොඳම ඒකාංගික ටෙලිනාට්‍යයට | මොහාන් ජී රංගනාත් |

| | | | |
|---|---|---|---|
| | **සුමති සම්මාන උළෙල** | | |
| 6 | "අකුරු සිරිත " | හොඳම අධ්‍යාපන වැඩසටහන | මංගලා විජේරත්න |

**ජාත්‍යන්තර සම්මාන සඳහා නිර්දේශිත වැඩසටහන්**

| අංකය | වැඩසටහන | සම්මානය | නිර්දේශිතයන් |
|---|---|---|---|
| 1 | "ටිං පැටව්" | කොරියාව සෝල් ටෙලිනාට්‍ය ජාත්‍යන්තර සම්මාන උළෙල හොඳම නිළියන් හයදෙනා අතරට තේරීම | අසදි දෙව්තිලිණි |
| 2 | "ටිං පැටව්" | ජර්මනියේ මියුනික් නගරය Prix - Jeunesse සම්මාන උළෙල අවසන් වටයට තේරීම | |
| | **Japan Prize** | | |
| 3 | "සීත දිය බඹන" | හොඳම අධ්‍යාපන වැඩසටහන | ගාමිණී ජයන්ත අබේවික්‍රම |
| | **ABU** | | |
| 4 | "සීත දිය බඹන" | හොඳම අධ්‍යාපන වැඩසටහන | ගාමිණී ජයන්ත අබේවික්‍රම |
| 5 | "මා දැල් කර්මාන්තය" | අවසන් නිර්මාණ තුන අතරට | ජයමිණී ඉලේපෙරුම ගම්ලත් |

| | | | |
|---|---|---|---|
| | **සෝල් රූපවාහිනී සම්මාන උළෙල** | | |
| 6 | "ටිං පැටව්" | කොරියානු සෝල් රූපවාහිනී ටෙලිනාට්‍ය ජාත්‍යන්තර සම්මාන උළෙලේ විශේෂ සම්මානය | මොහාන්ජී රංගනාත් |
| | **ඇගයීම්** | | |
| 7 | "ටිං පැටව්" | සංස්කෘතික අමාත්‍යාංශය ටෙලිනාට්‍ය අනුමණ්ඩලය ලෝක රූපවාහිනී දිනය නිමිත්තෙන් පිදුනු ඇගයීම් සම්මානය | මොහාන්ජී රංගනාත් |

## වැඩසටහන් අංශය

### නාට්‍ය ඒකකය

එකිනෙකට වෙනස් තේමා අනුව යමින් ප්‍රාසාංගික හා ඒකාංගික ටෙලි නාට්‍ය නිෂ්පාදනය වඩා වැඩි ප්‍රේක්ෂක අවධානයකට යොමු වන අතර ටෙලිනාට්‍ය ආරම්භක අවධියේ සිට මේ දක්වා පවත්වාගෙන ආ ටෙලි නාට්‍යයේ ප්‍රමිතීන් රැක ගනිමින් නිෂ්පාදනය මෙහෙයවීමට හැකියාව ලැබීම ජයග්‍රහණයකි. අදාල වසර තුළ ඒකකයේ නිෂ්පාදිත නාට්‍ය සම්මානයට පාත්‍ර වීම ප්‍රේක්ෂක ඉලක්ක සපුරා ගැනීමට වැදගත් විය.

**2014 වසර තුළ විශේෂයෙන් සිදු කළ කාර්යයන් සහ ව්‍යාපෘති**

1. විමලරත්න අදිකාරි අධ්‍යක්ෂණය කළ“ ඉසිවරුණ ” ටෙලිනාට්‍යය කොටස් 50න් කොටස් 12 ක් 2014.01.04 – 2014.04.09 දක්වා විකාශය විම.
2. සන්තුස ලියනගේ අධ්‍යක්ෂණය කළ “භාව තීර්ථ ” ටෙලි නාට්‍ය මාලාව කතාංග 12ක් ලෙස 2014.08.01 – 2014.10.24 දක්වා විකාශය විම.
3. මාවෝ ලක්ෂිත අධ්‍යක්ෂණය කළ “උඩු සුළඟ ” ටෙලි නාට්‍යයේ කොටස් 45 න් කොටස් 24 ක් 2014.01.05- 2014.09.14 දක්වා විකාශය වීම.
4. ගයා රම්‍ය අල්විස් අධ්‍යක්ෂණය කළ “කොළඹ අහස ” ටෙලිනාට්‍යය 2014.01.23- 2014.07.24 දක්වා කොටස් 100ක් විකාශය වීම.
5. රංග බණ්ඩාරනායක අධ්‍යක්ෂණය කළ කොටස් 35ක් වු “භවාන්තර” ටෙලි නාට්‍යය 2014.04.26 - 2014.12.27 දක්වා විකාශය විය.
6. “සෙනෙහෙ මාතා ” අවුරුදු ඒකාංගික ටෙලි නාට්‍යය 2014.04.12 විකාශය වීම.
7. “ ගින්න ” වෙසක් ඒකාංගික ටෙලි නාට්‍යය 2014.05.15 විකාශය වීම.
8. “ මැණික් වෙළෙන්දා” නත්තල් ඒකාංගික ටෙලි නාට්‍යය 2014.12.25 විකාශය වීම.
9. රූපවාහිනී රාජ්‍ය සම්මාන උළෙලේ සහ සුමති සම්මාන උළෙලේ රූපවාහිනී නිෂ්පාදන කටයුතු සිදු කිරීම සහ අලුත් අවුරුදු සජීව විකාශය නිෂ්පාදනය කිරීම.

10. වාසුලිය වැඩසටහන නිෂ්පාදනය රිදම් හිට් , නුගසෙවණ , ඉරිදා ආයුබෝවන් හා රංගභූමි යන වැඩසටහන් සජීව විකාශ පවත්වාගෙන යාම.

11. වාහල්කඩ වාර්තා රංග වැඩසටහන නිෂ්පාදනය කිරීම.

## සංගීත ඒකකය

රූපවාහිනී වැඩසටහන් අතර ජනප්‍රිය අංගයක් වන සංගීත වැඩසටහන්, ප්‍රවීන හා නවීන ගීත නිර්මාණ ශිල්පීන්ගේ සහභාගීත්වයෙන් යුතුව සිංහල සංගීත ක්ෂේත්‍රෙය් ප්‍රමිතීන් ආරක්ෂා කරමින් ප්‍රේක්ෂක රසඥතාව වෙනුවෙන් ඉදිරිපත් කිරීම රූපවාහිනී සංගීත ඒකකයේ මුඛ්‍ය කාර්ය භාරයයි. එසේම ගීත රචකයින්, ගායන ශිල්පීන් සංගීත අධ්‍යක්ෂකවරුන් හා නව ගායන ශිල්පීන් හඳුන්වා දෙමින් සංගීත වැඩසටහන් අන්තර් ජාතික තලය දක්වා වර්ධනයට කටයුතු කිරීම සංගීත ඒකකය මගින් සිදුවේ.

රාජ්‍ය සංගීත ප්‍රසංග, වෙළඳ අනුග්‍රාහකත්වය යටතේ පැවැත්වෙන සංගීත ප්‍රසංග, බාහිරව සංවිධානය කෙරෙන ජනප්‍රිය ශිල්පීන්ගේ සංගීත ප්‍රසංග, දේශිය හා විදේශීය සංගීතඥයින්ගේ නිර්මාණ රැගත් ප්‍රසංග නිෂ්පාදනය සහ විශිෂ්ඨ කලාකරුවන් උදෙසා උපහාර වැඩසටහන් ඉදිරිපත් කිරීමේ ජාතික මෙහෙවරද සංගීත ඒකකය මගින් සිදුවේ.

2014 වසරේ සංගීත ඒකකය විසින් නිෂ්පාදනය කර විකාශය වූ වැඩසටහන් අතර රජත සර, ඉරශ්මි, රිදම් ටු රිදම්, සිත් ගත් ගී, ගී සර, ත්‍රී තාල්, පාරමිතා, කුංකුම පොට්ටු, ඉරිදා ආයුබොවන්, බදාදා නුග සෙවණ හා කවි සරණිය යන වැඩසටහන් වේ.

ඊට අමතරව කාලීන අවශ්‍යතා අනුව පහත වැඩසටහන් ද නිෂ්පාදනය කෙරිණි. බක් මහට පෙර සැළලිහිණි හඬ, ජාතික යොවුන් ප්‍රසංගය, ඩයලොග් සංගීත ප්‍රසංගය, මලියදේව ගී තරු ප්‍රසංගය, පූජා වෙසක් කලාපය, බොදු බැති ගී, දියවන්නා පොසොන් බැති ගී, බුද්ධාභි වන්දනා, සමුපකාර සංගීත ප්‍රසංගය, අමරගුරු රණවිරු උපහාර සංගීත වැඩසටහන, මියැසි විශාකා, තක් ජිත්, අනුල සර, අපේ හැන්දෑව, මියුරැසි සහ නිල් හීන දැල ඒ අතර වැදගත් වේ.

## ක්‍රීඩා ඒකකය

1. දේශීය විදේශීය වශයෙන් සිදුවන ක්‍රීඩා ඉසව් අළලා නිෂ්පාදනය කරන ලද "ක්‍රීඩා විසිතුරු" වැඩසටහන සතිපතා විකාශය කෙරිණි.

2. ජාත්‍යන්තර ක්‍රීඩා ඉසව් අළලා නිෂ්පාදනය කරන ලද "වර්ල්ඩ් ස්පෝර්ට්ස්" වැඩසටහන සතිපතා චැනල් අයි නාලිකාව ඔස්සේ ඉංග්‍රීසි මාධ්‍යයෙන් විකාශය විය.(2014 ජනවාරි මස සිට 2014 මැයි මස දක්වා)

3. "ඔෆ් ද ෆීල්ඩ්" වැඩසටහන ක්‍රීඩා ක්ෂේත්‍රයේ සිදුවන ගැටළුකාරී තත්වයන් හා අදාල ක්ෂේත්‍රය පිළිබඳව ප්‍රවීණයන් ගේ සහභාගීත්වයෙන් සකසන ලද සජීව වැඩසටහනක් වේ.(2014 පෙබරවාරි මස සිට 2014 මැයි මස දක්වා)

**2014** වසර තුළ සජීව ලෙස විකාශය කර ඇති වැඩසටහන්

1. දැයට කිරුළ පාපැදි සවාරිය 2014
2. ගුවන් හමුදා පාපැදි සවාරිය
3. ටුවර් ද යූත් පාපැදි සවාරිය (Tour De Youth Cycle Race)
4. ෆොක්ස් හිල් සුපර් ක්‍රොස් ( Motor Race )
5. බ්‍රැඩ්බි ෂීල්ඩ් – 1st Leg
6. බ්‍රැඩ්බි ෂීල්ඩ් – 2 nd Leg
7. සීගිරි සුපර් ක්‍රොස් ( Motor Race )
8. ගනර් සුපර් ක්‍රොස්
9. වලවේ සුපර් ක්‍රොස්
10. ක්ලිෆර්ඩ් කුසලාන රගර් අවසන් තරඟය

11. කැවල්රි සුපර් ක්‍රොස්

12. BOC පාපැදි සවාරිය

13. ගජබා සුපර් ක්‍රොස්

14. ලංකා ප්‍රීමියර් ලීග් ක්‍රිකට් තරඟාවලිය (LPL)

15. අසියානු තරඟාවලිය – Lncheon

16. පොදු රාජ්‍ය මණ්ඩලීය තරඟාවලිය – Glasgow

17. ශ්‍රී ලංකා බංගලාදේශ ක්‍රිකට් සංචාරය

18. ෆීෆා ලෝක කුසලාන පාපන්දු තරඟාවලිය– 2014

19. රොදර්හැම් සර්කිට් මීට්

20. ඒෂියන් පැරා ගේම්

මෙයට අමතරව පහත සඳහන් වැඩසටහන් නිෂ්පාදනය කර විකාශය කෙරිණ.

1. සන්ඩේ ඔබ්සර්වර් - මොබිටෙල් පාසල් ක්‍රිකට් සම්මාන

2. ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායමේ පැමිණීම.

3. කොකා කෝලා ක්‍රිකට් පාත්වේ සීසන් 04 – සුපර් කැම්ප්

2014 වසර තුළ ක්‍රීඩා ඒකකයේ ගුවන් පැය 633.1 ක ක්‍රීඩා වැඩසටහන් විකාශය කර තිබේ. මෙම ගුවන් කාළය අයි නාලිකාව තුළින් ගුවන් පැය 449.4 සහ රූපවාහිනිය තුළින් ගුවන් පැය 183.7 වෙයි.

## හඬකැවීම් ඒකකය

කොරියානු තානාපති කාර්යාලය සමග එක්ව කොටස් 21 කින් යුක්ත ''කොයිකා සේවා'' වැඩසටහන් පෙළ නිෂ්පාදනය කෙරිණි.

හඬ කැවීම් ඒකකයෙන් නිෂ්පාදනය වන වැඩසටහන් සඳහා නව ශිල්පීන් බඳවා ගැනීමට අයදුම්පත් කැඳවා 5000 පමණ පිරිස අතරින් 326 දෙනෙකු පමණ දැනටමත් තෝරාගෙන ඇත. මෙමගින් හඬ රංගන ශිල්පීන් මෙරටට බිහිවනු ඇත.

ජපන් සංස්කෘතික ආධාර යටතේ, ජපන් රජය සමග ජපන් තානාපති කාර්යාලයද එක්ව ජපන් වාර්තා වැඩසටහන් නොමිලේ ලබා ගැනීමේ ව්‍යාපෘතියේ කටයුතු සිදු කෙරිණි.

2014 වර්ෂයේ දී වැඩසටහන් 1835 ක් හඬ කැවීම් සහ උපසිරැසි යොදා නිෂ්පාදනය කර විකාශය කර ඇත.

ප.ව. 6.30 වේලාව අඛණ්ඩව පවත්වාගෙන යන ලද අතර ඉන් ඉපැයූ ශුද්ධ ලාභය රු. 122,876,165/- කි.

(ඒකකය සතු සම්පත් ප්‍රවර්ධනය හඬ කැවීම් මැදිරි, ත්‍රිමාන මැදිරිය)

වෙසක්, පොසොන් සඳහා ''ධම්ම පදය'' ආශ්‍රිතව කෙටි කාටූන් පට සැකසීමද මෙම වසරේදී සිදු විය මෙම ඒකකය මගින් අමාත්‍යාංශ බදු නිදහස් කර ගැනීමේ කාර්යය ඉටුකළ අතර ඉන් සංස්ථාවට විශාල මුදලක් ඉතිරි විය.

## වැඩසටහන් පරිපාලන ඒකකය

මෙම ඒකකයේ මූලික කාර්යය වනුයේ සංස්ථාවේ සියලුම වැඩසටහන් නිෂ්පාදන අංශ සහ ඒකක වලට අදාල වැඩසටහන් වල පිරිවැය ඇස්තමේන්තු පරීක්ෂාකර ඒ සඳහා නිෂ්පාදන අංක නිකුත් කිරීමේ සිට එම වැඩසටහන් නිෂ්පාදනය කර අවසන් වන තෙක් සියලුම පරිපාලනමය කාර්යයන් සහ වැඩසටහන් සඳහා අවශ්‍ය සේවා සැපයීම සම්බන්ධීකරණයයි.

2014 වසර තුල වැඩසටහන් පරිපාලන ඒකකය මගින් විවෘත කරන ලද වැඩසටහන් ලිපිගොනු සංඛ්‍යාව 1992 කි.

මෙම ලිපිගොනු සංඛ්‍යාව පහත පරිදි අංශ අතර බෙදී ඇත.

| | |
|---|---|
| විවිධ වැඩසටහන් අංශය | 634 |
| අධ්‍යාපන වැඩසටහන් අංශය | 483 |
| ප්‍රවෘත්ති හා කාලීන සිදුවීම් අංශය | 308 |
| අලෙවි අංශය | 47 |
| චැනල් අයි | 520 |
| **මුළු එකතුව** | **1992** |

## ආගමික වැඩසටහන් ඒකකය

<u>සද්ධර්ම වර්ෂා පෝ දින සජීව විකාශය</u>

| | | |
|---|---|---|
| 1. | ජනවාරි | -නාගදීප රජමහා විහාරය |
| 2. | පෙබරවාරි | -අම්බලන්තොට වඳුරුප්ප රජමහා විහාරය |
| 3. | මාර්තු | -ශ්‍රී පාදස්ථානය |
| 4. | අප්‍රේල් | -ඇඹිලිපිටිය දේවාලේ පන්සල |
| 5. | මැයි | -පොළොන්නරුව ගල් විහාරය |
| 6. | ජූනි | -ජය ශ්‍රී මහා බෝධිය / තන්තිරිමලේ රජමහා විහාරය |
| 7. | ජූලි | -කතරගම කිරිවෙහෙර |
| 8. | අගෝස්තු | -අත්තරගම රජමහා විහාරය |
| 9. | සැප්තැම්බර් | -වැල්ලවාය සුදර්ශනාරාම රජමහා පෙරහැර |
| 10. | ඔක්තෝබර් | -සිත්තම්ගල්ලෙන රජමහා විහාරය |
| 11. | නොවැම්බර් | -කරමඩ රජමහා විහාරය |

<u>සජීව විකාශ හා අනුග්‍රාහක ව්‍යාපෘති</u>

1. රූපවාහිනී 32 වෙනි සංවත්සරය නිමිත්තෙන් අසිරිමත් කිරිවෙහෙර වන්දනාව , නෙළුම් මල් ලක්ෂයක් පූජා කිරීම සහ ආලෝක පූජාව
2. රාජ්‍ය පොසොන් උත්සවය පොළොන්නරුව පොසොන් උත්සවය නිමිති කරගෙන දින 03 ක් තන්තිරිමලේ රජමහා විහාරය කේන්ද්‍ර කර ගනිමින් පොසොන් කලාපයක් නිර්මාණය කිරිම.
3. ඌව වෙසක් කලාපය
4. උඩුගම ශ්‍රී බෝධිරාජ පෙරහැර
5. යුධගනාව රජමහා විහාරයේ පෙරහැර

6. පිච්චමල් පූජාව - ශ්‍රී මහා බෝධිය

7. දසමහ බෝ සෙනසුන - අකුරුස්ස ආගමික වැඩසටහන

8. සෝමාවතී රජමහා විහාර පෙරහැර

9. නවගමුව පත්තිනි දේවාල පෙරහැර

10. කෝට්ටේ රජමහා විහාර පෙරහැර

11. නුගසෙවණ වැඩමුළුව - වැල්ලවාය

12. සපරගමුව මහසමන් දේවාල පෙරහැර - රත්නපුරය

13. රත්මල් දෙවියනි සිත්තම්ගල්ලෙන - සිත්තම්ගල්ලෙන පෙරහැර

14. 105 ක් කිරි අම්මාවරුන් උදෙසා දානමය පුන්‍ය කර්මය

## තරුණ වැඩසටහන් ඒකකය

තරුණ වැඩසටහන් ඒකකයේ නිෂ්පාදනය කරනු ලැබූ වැඩසටහන්

| නම | වැඩසටහන | අන්තර්ගතය |
| --- | --- | --- |
| විනීතා කරුණාරත්න | ආලකමන්දාව ( 12)<br><br>සුභාණි රාත් ( 18) | කලාවේ නව මං සොයාගිය විශිෂ්ඨයන් පිළිබඳ සොඳුරු ආවර්ජනය<br><br>භාරතීය සිනමාවේ එදා මෙදා තුර ජනප්‍රිය සිනමා නිර්මාණ හා ගීත පිළිබඳ විවරණය |
| සුනේත්‍රා කුමාරි | රූපාවලෝකනය (48) | දේශිය විදේශීය සිනමාව සහ කලාකරුවන් පිළිබඳ තොරතුරු |

| | | |
|---|---|---|
| නිපුණ රාජපක්ෂ | බෞද්ධ ප්‍රවෘත්ති (05))<br><br>ලෝක තරුණ සම්මේලනය සමාරම්භක උළෙල සහ සමාප්ති වැඩසටහන<br><br>බෞද්ධාලෝක වෙසක් කලාපය - Up date<br><br>මහ රහතුන් වැඩි මහ ඔස්සේ | ප්‍රවෘත්තිමය වටිනාකමක් ඇති වැඩසටහනකි.<br><br>ලෝකයේ තරුණ තරුණියන් අතරේ අන්‍යෝන්‍ය අදහස් හුවමාරුව<br><br>බුදු තෙමඟුල නිමිත්තෙන් බෞද්ධාලෝක මාවතේ පැවති වෙසක් කලාපය<br><br>බුද්ධ ධර්මයේ ආදීනව පහදා දීම. |
| සුමින්ද තිලකසේන | සඳුදා නුග සෙවණ වැඩසටහන් (4 9)<br><br>මාලිමා වැඩසටහන් ( 18) | උදේකාලයේ නිවසේ රැඳී සිටින කාන්තාවන්ට අවශ්‍ය දැනුම , අවබෝධය විනෝදාස්වාදය ලබා දීම.<br>දෙස් විදෙස් තාක්ෂණික නව නිපැයුම් සහ විද්‍යාත්මක තොරතුරු |
| රංග ප්‍රේමරත්න | විනිවිද වැඩසටහන් ( 03 ) | පක්ෂ විපක්ෂ මත සහ චෝදනා ඇතුළත් කාලීන දේශපාලන සංවාද |
| රංග ප්‍රේමරත්න / සුනේත්‍රා කුමාරි | Feeling of Youth (02)<br><br>විශේෂ නත්තල් සංගීත වැඩසටහන | තාරුණ්‍යය ඉලක්ක කොට ගත් ඉලෙක්ට්‍රොනික සංගීතයෙන් මිදුණු නව පරම්පරාවේ සංගීත රටා සහ ගීතය මුසු වූ සජීව මියැසිය<br>නත්තල් උත්සවය නිමිත්තෙන් කිතු දහමේ හරය කියවෙන ගී ප්‍රසංගය |

| | | |
|---|---|---|
| චූලාංගනී හපුහින්න | අපි අපි වැඩසටහන් (13)<br>ගුරුකුල කලා මංගල්‍යය<br><br>බදාදා නුග සෙවන වැඩසටහන් (05) | විවිධ ආයතනයන්හි සහ පුද්ගලයන්ගේ ක්‍රියාකාරකම් තොරතුරු ඇතුළත් වැඩසටහනකි.<br><br>කැලණිය ගුරුකුල විද්‍යාලයේ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ කලා උළෙල<br><br>උදේ කාලයේ නිවසේ රැඳී සිටින කාන්තාවන්ට අවශ්‍ය දැනුම , අවබෝධය, විනෝදාස්වාදය ලබා දීම. |

## වැඩසටහන් ඉදිරිපත් කිරීමේ ඒකකය

ජාතික නාලිකාව දෛනිකව පෙ.ව. 3.55 සිට රාත්‍රී 12.15 දක්වා (පැය 20 විනාඩි 20) සහ නේත්‍රා/අයි නාලිකාව දෛනිකව පෙ.ව. 5.30 සිට රාත්‍රී 11.30 දක්වා (පැය 18) ක් විකාශය වේ. NTV නාලිකාව පෙ.ව. 6.00 සිට රාත්‍රී 10.30 දක්වා (පැය 16 විනාඩි 30) විකාශය විය. ජාතික නාලිකාව, නේත්‍රා/අයි සහ NTV නාලිකාවල දෛනික විකාශන කටයුතු මැනවින් පවත්වාගෙන යාම මෙම ඒකකයේ ප්‍රධාන අරමුණ වේ.

දෛනිකව විකාශය වන ටෙලි නාට්‍ය හා අනෙකුත් වැඩසටහන් වල පූර්ව ප්‍රචාරක පට සැකසීම, විකාශය සඳහා කෙටි පූරක ගීත සැකසීම, විකාශයට පෙර බාහිර වැඩසටහන් පූර්ව නිරීක්ෂණය කිරීම මෙම ඒකකය මගින් සිදු කරනු ලබයි.

ප්‍රේක්ෂක ජනතාව වෙත සමබර වැඩසටහන් පෙළගැස්මක් ලබාදීම මෙම ඒකකයේ අරමුණයි. මෙම පෙළගැස්ම අනෙකුත් නාලිකාවන්හි විකාශය වන වැඩසටහන් හා සසඳා බලා වඩාත් සුදුසු ආකාරයෙන් විකාශය කිරීමද, පවුලේ සැමට එක්ව නැරඹිය හැකි වැඩසටහන් ලේඛනගත කිරීමද මෙම ඒකකයේ කාර්යය භාරය වේ.

# අධ්‍යාපන වැඩසටහන් අංශය

## අධ්‍යාපන සේවා ඒකකය

අධ්‍යාපන අංශයේ අධ්‍යාපන සේවා ඒකකය මගින් 2014 වර්ෂයේ අ.පො.ස(උසස් පෙළ) අ.පො.ස (සා.පෙළ) හා ශිෂ්‍යත්ව විභාගයට මුහුණදෙන දූදරුවන් වෙනුවෙන් විෂයානුබද්ධ විධිමත් වැඩසටහන් විකාශය කළ අතර ඊට අමතරව නොවිධිමත්, අවිධිමත් සහ සහ සඟරාමය වැඩසටහන් රාශියක්ද විකාශය කරන ලදී.

**ජාතික පාසල - අ.පො.ස (උසස් පෙළ)**

විද්‍යා, කලා, වානිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල විෂයයන් 18ක් සෑම සති 02කට වරක්ම විකාශය කරන ලදී. මෙහිදී මෙම විෂයයන් නිෂ්පාදනය කර විකාශය කිරීමෙන් අනතුරුව ජාතික පාසල වෙබ් අඩවියෙන් දූදරුවන්ට නැවත බලා ගැනීමටද අවස්ථාව සලසන ලදී. මෙම විෂයයන් ශිෂ්‍ය ශිෂ්‍යාවන් අතර ජනප්‍රිය වැඩසටහන් වූ අතර උසස් පෙළ නාට්‍ය හා රංගකලාව වෙනුවෙන් වසරේ හොඳම අධ්‍යාපන වැඩසටහන සඳහා සුමති සම්මානයද හිමි විය.

උසස් පෙළ විෂය ධාරාවන්ට අලුතින් හඳුන්වා දුන් තාක්ෂණවේදය විෂයයන් සඳහාද ප්‍රවීණ විශ්ව විද්‍යාල ආචාර්යවරුන් හා තාක්ෂණික ආයතන වල ප්‍රවීණ ගුරුභවතුන් ප්‍රායෝගික පරීක්ෂණ සහිතව මෙම වැඩසටහන් මාලාව වසර පුරා විකාශය නරන ලදී.

**ජාතික පාසල - අ.පො.ස (සා.පෙළ)**

2014 දෙසැම්බර් මස අ.පො.ස (සා.පෙළ) විභාගයට පෙනී සිටින දූදරුවන් වෙනුවෙන් ප්‍රධාන විෂයයන් 06ක් සඳහා වැඩසටහන් 2014 ජනවාරි මස සිට සතියේ දිනවල උදෑසන නිෂ්පාදනය කර විකාශය කරන ලදී. මීට අමතරව එම වැඩසටහන් ඩීවීඩී ගත කර අලෙවි කිරීමටද කටයුතු යොදන ලදී. ජාතික පාසල අ.පො.ස(සා.පෙළ) වැඩසටහන් සාමාන්‍ය පෙළ සිසු දූදරුවන් අතර වඩාත් ජනප්‍රිය වූ අතර විද්‍යාව හා ගණිතය විෂයයන් සඳහා ඉලක්ක ප්‍රශ්නෝත්තර කට්ටලයක් තෝරාගෙන සම්මන්ත්‍රණ මාලාවක්ද 2014 වසරේ සංවිධානය කරන ලදී.

**පුංචි අපේ නැණ මිහිර ශිෂ්‍යත්ව වැඩසටහන් මාලාව හා නැණ මිහිර ශිෂ්‍යත්ව ජයමඟ - 2014**

2014 අගෝස්තු මස පැවැත්වූ පස්වන ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගයට පෙනී සිටින දූදරුවන් වෙනුවෙන් සෑම අඟහරුවාදාකම හා බදාදා දිනකම සවස විකාශය කළ නැණ මිහිර ශිෂ්‍යත්ව වැඩසටහන් මාලාව දූදරුවන් හා දෙමාපියන් අතර ජනප්‍රිය වැඩසටහන් මාලාවක් විය.

එම වැඩසටහන හා සමගාමීව සකස් කළ 2014 නැණ මිහිර ශිෂ්‍යත්ව ජයමඟ ප්‍රශ්නෝත්තර සංග්‍රහයද එකසේ ජනප්‍රිය විය. එහි කට්ටල 20,000 ක් අලවියෙන් ලක්ෂ 15 කට අධික ශුද්ධ ලාභයක් ආයතනයට ලබා ගැනීමට හැකිවිය.

**නැණ මිහිර සෞන්දර්ය සම්මන්ත්‍රණ මාලාව**

2014 වර්ෂයේ නැණ මිහිර සෞන්දර්ය වැඩමුළු 40ක් දිවයින පුරා දුෂ්කර පලාත්වල දූදරුවන් වෙනුවෙන් සංවිධානය කරන ලදී.

එක් සම්මන්ත්‍රණයක් සඳහා දහසකට අධික දුෂ්කර පලාත්වල දූදරුවන් සහභාගී වූ අතර දූදරුවන්ගේ දෙමාපියන් හා ප්‍රදේශයේ ගුරුභවතුන් ද මෙම සම්මන්ත්‍රණය වෙනුවෙන් කැපවී කටයුතු කිරීම විශේෂත්වයකි. මෙම වැඩසටහන්වලට අමතරව රූපවාහිනී අධ්‍යාපන සේවා ඒකකය සිය සුපුරුදු වැඩසටහන් වූ සුක්කානම ,රිවිදින අරුණැල්ල, රංගභූමි හා දේදුන්න, නිෂ්පාදනය කොට විකාශනය කරන ලදී.

## **ළමා ඒකකය**

සුපුරුදු වැඩසටහන් පෙළ ගැස්ම "මුතු පවුර" යටතේ මේ වර්ෂයේද ළමා වැඩසටහන් විකාශය විය.සුපුරුදු කාල සීමාව සතියේ දිනවල (සඳුදා සිට ඉරිදා තෙක් ) ප.ව 17.00- 18.00 දක්වා ද සෑම පොහෝදිනකම සවණක් රැස් හා දහම් බිම වැඩසටහන ද විකාශය විය.එලෙසම ආයතනයට දෛනික ස්ථිර ආදායමක් ලබා දීමට මෙම වැඩසටහන් පෙළ ගැස්ම සමත් වී ඇත.

| දිනය | වැඩසටහන | අන්තර්ගතය |
|---|---|---|
| සඳුදා | "පැහැසරණිය" | පාසල් ළමුන්ගේ ගායන,වාදන, නර්තන හැකියාවන් ඉදිරිපත් කරන වැඩසටහනකි. |
| අඟහරුවාදා | "මං ආසයි මට කියන්න" | 6,7,8,9 ශ්‍රේණි වල පාසැල් දරුවන් ඉලක්ක කරගත් මෙම වැඩසටහන විද්‍යා ගණිත,විෂය ධාරාවන්ට අනුකූලව අවිධිමත් අධ්‍යාපනය නාට්‍යානුසාරීව ඉදිරිපත් කෙරේ. |
| බදාදා | "හුරු බුහුටි" | ළමුන්ගේ පෞර්ෂය ය වර්ධනයට , භාෂා ඥානය දියුණු කිරීම සඳහා ක්‍රියාකාරම් ඇතුලත්ය. |
| බ්‍රහස්පතින්දා | "පුංචි අපිත් කෑම හදමු" | පුංචි දරුවන් සඳහා වූ සූපශාත්‍ර වැඩසටහනකි. |
| සිකුරාදා | "අපේ පැය" | ළමුන්ගේ කායික හා මානසික සංවර්ධනය මෙන්ම පෞරුෂය සංවර්ධනය ඉලක්ක කර ගනිමින් දරුවන්ගේ වික්‍රමාන්විත ක්‍රියාදාමයන් ඇතුලත් වැඩසටහනකි. |
| සෙනසුරාදා | " පාට පාට" | ළමුන් සඳහා වූ සජීව සඟරාමය වැඩසටහනකි. |
| ඉරිදා | "මුතුහර" | දිවයින පුරා ව්‍යාප්තව තිබෙන මුතුහර ළමා සමාජ ජාලය ඔස්සේ එයට සම්බන්ධ දරුවන්ගේ දස්කම්, හුරුබුහුටි කවි,සෞන්දර්යාත්මක අත්දැකීම් රටට හඳුන්වාදෙන වැඩසටහනකි. |
| පෝය දින | "දහම් බිම , සවනක් රැස්" | ආගමික වැඩසටහනකි. |

## වාර්තා හා විචිත්‍රාංග ඒකකය

මූලිකවම වාර්තා වැඩසටහන් නිෂ්පාදනය සිදු කළද ප්‍රශ්න විචාරාත්මක වැඩසටහන් , සජීව සාකච්ඡා හා වැඩසටහන්ද සඟරාමය වැඩසටහන්ද මෙම ඒකකය මඟින් නිෂ්පාදනය කෙරේ. මෙම ඒකකයෙන් පවත්වාගෙන යන "ධාරා" වැඩසටහන් මාලාව ඉරිදා 19.30 ට විකාශයවේ. 2010 සිට මෙය අඛණ්ඩව අවුරුදු හතරක් පමණ පවත්වාගෙන යනු ලබයි. සොබාදහම,පුද්ගල චරිත, සංස්කෘතිය, ජන වර්ග ආදී මාතෘකාවන්ගෙන් මෙම වාර්තා වැඩසටහන් සමන්විත වේ .මේ වසරේදී වැඩසටහන් 40ක් පමණ නිෂ්පාදනය කරන ලදී. ඒකකයේ සියලුම නිෂ්පාදකවරු මේ සඳහා දායක වෙති.

- "සැරිසර "සංචාරක වාර්තා වැඩසටහනකි. එයද මේ වන විට අඛණ්ඩව හතර වන වසර පසුකරමින් තිබේ. දකුණු ලක කිරින්දෙන් ආරම්භ වූ වැඩසටහන් මාලාව ලංකාව වටා වූ මුහුදු තීරය ආවරණය කරමින් වැඩසටහන් 105ක් පමණ නිෂ්පාදනය කර අවසන් වී ඇත. 2014 අවසන් වන විට මඩකලපුවට ආසන්න කායන්කනී මුහුදු තීරය වෙත අවතීර්ණය වී තිබුණි. මෙහි නිෂ්පාදකවරයා කාංචන මාරසිංහයි.

- LMRB වාර්තාවලට අනුව ජාතික රූපවාහිනියෙන් විකාශනය වන වැඩසටහන් අතර ජනප්‍රියම වැඩසටහනක් ලෙස මෙම ඒකකය මඟින් නිෂ්පාදනය වන "අරුම පුදුම රෝද හතර" වැඩසටහන දැක්විය හැකිය. මෙහි ජනප්‍රියභාවය මෙන්ම ගුණාත්මකභාවය නිසා 2014 වසරේදී විවිධ සම්මාන උළෙලෙවලදී සම්මානයට පාත්‍ර විය. සෑම ඉරිදාවකම 21.00 විකාශය වන මෙහි නිෂ්පාදකවරුන් වන්නේ නාමල් සූරියබණ්ඩාර හා චන්දන සෙනෙවිරත්න යි.

- සති දෙකකට වරක් "ආයුබෝවේවා" නමින් විකාශය වන සෞඛ්‍ය සඟරාමය වැඩසටහන සන්ධ්‍යා විතානවසම් නිෂ්පාදනය කරයි.

- ශ්‍රී ලංකා මහ බැංකුව සමඟ " ඉකෝන් අයිකෝන්" නමින් ප්‍රශ්න විචාරාත්මක වැඩසටහන් මාලාවක් මේ වසරේදී සිංහල හා දෙමළ බසින් නිෂ්පාදනය කරන ලදී. අනුග්‍රාහක වැඩසටහනක් වූ මෙය සංස්ථාවට ලාබදායි වැඩසටහනක් විය. මයුරි වානගුරු එහි නිෂ්පාදකවරිය වේ.

- කතෝලික හා ක්‍රිස්තියානි උපදේශක සභාව ක්‍රියාත්මක වන්නේ වාර්තා වැඩසටහන් ඒකකය මඟිනි. නත්තල් හා පාස්කු සජීව දේව මෙහෙයන් මෙන්ම සුදසුන හා සුපුවත ලෙසින් කතෝලික හා ක්‍රිස්තියානි වැඩසටහන් ද සුපුරුදු පරිදි නිෂ්පාදනය කෙරිණි. කොළඹ අගරදගුරු පදවිය සංවිධානය කළ ලූර්දු වන්දනාව වැඩසටහන නිෂ්පාදනය සඳහා ඒකකයේ රංජුල සේනාධීර මහතාට ප්‍රංශයට යාමට අවස්ථාව උදාවිය.

- "සුදු පෙණ මත පහුරු පැන්වීම " (White Water Rafting) ක්‍රීඩාව ජනමාධ්‍යයට හඳුන්වා දුන්නේ වාර්තා වැඩසටහන් ඒකකයයි. මයුරි වානගුරු මෙම වැඩසටහන නිෂ්පාදනය කළ අතර වසරේ හොඳම ක්‍රීඩා වැඩසටහන ලෙස රයිගම් සම්මාන උළෙලේදී නිර්දේශ විය.

- අධ්‍යාපන සේවා ඒකකයට අමතරව වාර්තා වැඩසටහන් ඒකකයද විධිමත් අධ්‍යාපන වැඩසටහන් නිෂ්පාදනය කරයි.

- මසකට වරක් ඉරිදා "ආයුබෝවන්" සජීව වැඩසටහන නිෂ්පාදනය කිරීමද මෙම ඒකකය මගින් සිදු කෙරේ.

- කුලියාපිටියේ පැවති දැයට කිරුළ ප්‍රදර්ශනයේ රූපවාහිනී ප්‍රදර්ශන කුටිය හා එහි සිට නිෂ්පාදනය කරන ලද වැඩසටහන් මෙහෙයවීමද සිදු කරනු ලැබුයේ වාර්තා ඒකකය මගිනි.

- පසුගිය වසරේ ජපන් ත්‍යාග (Japan Prize) තරගාවලියේ දී හොඳම අධ්‍යාපනික වැඩසටහන් යෝජනාව ලෙස හොසේ බුන්කා ත්‍යාගය දිනූ අතුල ප්‍රියංකර දිසානායකගේ "වන මං දිගේ අකුරට " වැඩසටහන නිෂ්පාදනය කර ජපන් ත්‍යාග කමිටුව වෙත යැවීමද සිදු විය.

- 2015 ජනාධිපතිවරණයේදී අපේක්ෂක දේශපාලන කථා පටිගත කිරීම ප්‍රශස්ත අන්දමින් සිදු කිරීමට මෙම ඒකකයට හැකි විය.

- ඒකකයේ නිෂ්පාදක අතුල දිසානායක මහතාට රූපවාහිනී වාර්තා වැඩසටහන් හුවමාරු වැඩමුළුවක් සඳහා මැලේසියාවට යාමට අවස්ථාව උදා විය. අදාළ ආයතන සමඟ වැඩසටහන් හුවමාරු කර ගන්නා ලදී.

# ප්‍රවෘත්ති හා කාලීන සිදුවීම් අංශය

## ප්‍රවෘත්ති ඒකකය

**ප්‍රවෘත්ති විකාශ පෙළගැස්ම**

ප්‍රධාන ප්‍රවෘත්ති විකාශ 07 ක් ඇතුළුව ප්‍රවෘත්ති විකාශ 24 ක් දෛනිකව විකාශය කෙරිණි.

පැයෙන් පැය - පැයෙන් පැය සිංහල ප්‍රවෘත්ති පෙ.ව 7.55 සිට පස්වරු 5.55 දක්වා පැයකට වරක් විනාඩි 5 බැගින් දිනකට 09 වරක් විකාශය කෙරිණි.

දමිළ ප්‍රවෘත්ති පෙ.ව 8.25 සිට ප.ව 5.25 දක්වා පැයෙන් පැය

ඉංග්‍රීසි ප්‍රවෘත්ති දහවල් 12.00ට

**<u>ප්‍රධාන ප්‍රවෘත්ති විකාශ 07 යි</u>**

| | |
|---|---|
| දහවල් 12.30 - | සිංහල |
| රාත්‍රී 8.00 - | සිංහල |
| රාත්‍රී 10.00 - | සිංහල |
| දහවල් 1.30 - | දෙමළ |
| රාත්‍රී 7.00 - | දෙමළ |
| දහවල් 12.30 - | ඉංග්‍රීසි |
| රාත්‍රී 9.00 - | ඉංග්‍රීසි |

මීට අමතරව සෑම දිනකම උදෑසන 5.55 සිට 6.25 දක්වා කාලීන හා විදෙස් ප්‍රවෘත්ති වෙනුවෙන් දෛනිකව විනාඩි 30 බැගින් වෙන් විය.

මේ අනුව සියලු ප්‍රවෘත්ති විකාශ වෙනුවෙන් මසකට පැය 105 කට ආසන්න ප්‍රමාණයක් වෙන්කර තිබිණි.

මෙයට අමතරව විශේෂ අවස්ථාවලදී විශේෂ ප්‍රවෘත්ති විකාශයන් සඳහා අතිරේක කාලයක් යොදා ගැනීම සිදුවූ අතර විශේෂ මැතිවරණ විකාශ පවත්වාගෙන යාමද සිදුවිය.

මැදිරි ප්‍රවෘත්ති විකාශයේ  දිනක පැය ගණන වෙනුවෙන් පිරිවැය වශයෙන් මුදලින් රුපියල් එක් ලක්ෂ හැට දහසක මුදලක් වැය විය.

මාසයකට ප්‍රවෘත්ති කැමරා ඒකකය මගින් පටිගත කරනු ලබන ප්‍රවෘත්ති ආවරණ සංඛ්‍යාව 350 ක් පමණ විය. ඒ සඳහා කැමරා කැඳවුම් පත්‍රවලට අනුව ඇස්තමේන්තු ගත මුදල  රුපියල් ලක්ෂ 07 කි. මීට අමතරව ප්‍රාදේශීය වාර්තාකරුවන්ගෙන් ලබා ගන්නා ප්‍රවෘත්ති දිනකට 20 ක් පමණ විය. ඒ අනුව දිනකට ප්‍රාදේශීය වාර්තාකරුවන් සඳහා වැය වූ මුදල රුපියල් 35,000.00 කි. එය මාසයකට දසලක්ෂ පනස් දහසකි.

## කාලීන සිදුවීම් ඒකකය

**සතියේ දින** පෙ.ව 6.30 - 7.00  අලුත්ම පිටුව

පෙ.ව 7.00  - 8.00 ආයුබෝවන් සුභ දවසක්

ප.ව 14.00 – 14.30  ව්‍යාපාරික ලෝකය

ඇත්ත නැත්ත

ආයුබෝවේවා

**සති අන්ත**

ශනිදා ආයුබෝවන්, තිරසාර, රසමොහොත මෙම ඒකකය විසින් නිෂ්පාදනය කරන ලද අතර මීට අමතරව ජාතික මෙන්ම ජාත්‍යන්තර වශයෙන් ඉසව් හා අතිගරු ජනාධිපතිතුමාගේ සහභාගීත්වයෙන් සිදුවන දැවැන්ත ජාතික උළෙල ඇතුළු අතිශය වැදගත් උත්සව සජීව ආවරණ කටයුතු ද කාලීන සිදුවීම් ඒකකයෙන් සිදු කෙරේ.

කාලීන සිදුවීම් ඒකකයේ දෙමළ ඒකකය, රූපවාහිනී නේත්‍රා නාලිකාව සඳහා දෙමළ භාෂාවෙන් දිනපතා "Naledugalil Indru" පුවත්පත් සිරස්තල වැඩසටහනද , රජයේ සංවර්ධනය පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා "Vidiyalai Nokki " වැඩසටහනද " Kandathum Kattathum " නමින් සතිපතා සඟරාමය වැඩසහනද "Ulagavalam " ලෝක දේශපාලන වැඩසටහනද විකාශය කරයි.

සති අන්තයේදී ".Sadurangam" පැය 01 ක දේශපාලන සංවාද වැඩසටහනද " Vilayattu Manjari" ක්‍රීඩා වැඩසටහනක් ද මීට අමතරව කාලීන වශයෙන් වැදගත් වන දෙමළ භාෂාවෙන් නිෂ්පාදිත විශේෂ වැඩසටහන් හා ජනාධිපතිතුමාගේ විදේශ සංචාර හා ජාතික අවස්ථා සම්බන්ධ තොරතුරුද දෙමළ භාෂාවෙන් නිෂ්පාදනය කරනු ලබයි.

## නිෂ්පාදන සේවා අංශය

සංස්ථාව මගින් නිෂ්පාදනය කරනු ලබන මැදිරි සහ බාහිර වැඩසටහන් සඳහා නිර්මාණාත්මක සේවා දායකත්වය ලබාදෙන්නන් ලෙස ඉදිරියෙන්ම සිටින්නේ නිෂ්පාදන සේවා අංශයයි. නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (නිෂ්පාදන සේවා) ගේ අධීක්ෂණය යටතේ පවත්වාගෙන යන මෙම අංශය කැමරා, හඬ පටිගත කිරීම් හා බහු කැමරා, ආලෝකකරණය , වේශනිරූපය, මාධ්‍ය රූප, විශේෂ මාධ්‍යරූප, පසුතල ඊ.එෆ්.පී උපකරණ, රජත මැදිරිය, සහ ඊ.එන්.ජී සහයක යන ඒකක දහයකින් සමන්විත වේ. 2014 ඔක්තෝබර් මස සිට මාධ්‍යරූප සහ විශේෂ මාධ්‍යරූප යන ඒකක දෙක අධ්‍යක්ෂ ජනරාල්තුමා යටතට පවරා ගන්නා ලදී.

වැඩසටහන් නිෂ්පාදනය සහ සජීව විකාශයන් සඳහා වැයවන විදුලි බලය අවම කිරීම සහ ප්‍රවාහන වියදම් අවම කරගැනීමට රජත මැදිරිය සෘජුවම දායකත්වයක් දක්වයි.

ඉතා සීමිත ශිල්පීන් පිරිසකගේ දායකත්වය සහිත අඩු වියදම් ක්ෂේත්‍ර ක්‍රියාවලිය 2014 වසර තුළදීත් ඉහළ සාර්ථකත්වයක් ලබා ඇත. 2015 වසර සඳහා අත්‍යාශ්‍යව තිබූ කැමරා හතරෙන් කැමරා 2ක් මිලදී ගැනීමට අවශ්‍ය සියළු කටයුතු යොදා ඇති අතර බාහිර විකාශ රථය මගින් 2014 වසර තුළ පටිගත කිරීම් සහ සජීව විකාශ 15 ක් නිමවා ඇත.

### කැමරා ඒකකය

2013 වසරේ ගෙන්වන ලද HD කැමරා සඳහා අවශ්‍ය වන HD Field Monitors 04ක් 2014 වසර තුළ දී ලැබීම නිසා එම කැමරා මගින් කෙරෙන පටිගත කිරීම්වල ගුණාත්මක භාවය ක්ෂේත්‍රයේදී නිසිලෙස නිරීක්ෂණය කිරීමේ හැකියාව ඇති විය. තවද නව කැමරා සඳහා ත්‍රිපාදකයන් ද මිළ දී ගැනීමට හැකි විය.

නිෂ්පාදන සේවා අංශයේ කැමරා ශිල්පීන් 2014 වසරේ සාර්ථකව ඉටු කළ කාර්යයන් අතර 3G තාක්ෂණය යොදා ගනිමින් යතුරුපැදි සහ හෙලිකොප්ටර් යානාවල සිට අඛණ්ඩව සිදු කරන ලද පාපැදි සවාරිය, නිදහස් උළෙල වැනි රාජ්‍ය උත්සව ආවරණ විදේශීය රටවල කරන ලද රූගතකිරීම් ඇතුළු බොහෝ වැදගත් ආවරණ රාශියක් වේ.

2013 වර්ෂයේ දී වහලය නවීකරණයෙන් පසු රජත මැදිරිය තුළ සජීව විකාශ සංගීත වැඩසටහන් විශාල ප්‍රමාණයක් ඉතා සාර්ථකව සිදු කරන ලදී. රජත මැදිරිය තුළ දහවල් කාලයේදී පටිගත කරන ලද වැඩසටහන් සඳහා විදුලි ලාම්පු භාවිත ආලෝකකරණය සිදු නොවන හෙයින් විදුලිය සඳහා වැයවන මුදල් විශාල වශයෙන් සංස්ථාවට ඉතිරි වෙයි. තවද ප්‍රවාහන වියදම් සහ පසුතල සඳහා ස්වාභාවික පරිසරය වැඩි වශයෙන් භාවිත වන හෙයින් ඒ වෙනුවෙන් වැය වන වියදම ද අවම වී ඇත.

## පටිගත කිරීම් සහ නිෂ්පාදන සේවා ඒකකය

ශිල්පීන් 13 දෙනෙකුගෙන් සමන්විත මෙම ඒකකය නියෝජ්‍ය අධ්‍යක්ෂ (පටිගත කිරීම්) යටතේ අධීක්ෂණය වේ. නිෂ්පාදන සේවා බාහිර විකාශ රථය මගින් කරනු ලබන සජීව විකාශ සහ පටිගත කිරීම් වල ශබ්ද පරිපාලනය ශ්‍රව්‍ය සංකලනය , ආලෝකකරණය ඇතුළු සියළුම තාක්ෂණික කටයුතු මෙහෙය වීම සහ සංස්ථාව විසින් තනි කැමරා භාවිතයෙන් නිෂ්පාදනය කරනු ලබන සියලු ක්ෂේත්‍ර වැඩසටහන් සඳහා ශබ්ද සංකලනයෙන් දායක වේ.

මෙම ඒකකය මගින් ඒකාංගික සහ මාලානාට්‍ය, වාර්තා , වැඩසටහන් , ක්‍රීඩා වැඩසටහන් , ළමා වැඩසටහන්, අධ්‍යාපන වැඩසටහන් දමිළ වැඩසටහන් සහ ටෙලි නාට්‍ය, කාලීන වැඩසටහන් , වෙළඳ වැඩසටහන් , ඉංග්‍රීසි වැඩසටහන් සහ නිෂ්පාදන සේවා බාහිර විකාශ රථය යොදා ගනිමින් කරනු ලබන සජීව සහ සජීව නොවන රූ ගත කිරීම් සඳහා දායක වේ. 2014 වසර තුළ වැඩසටහන් 1613 කට අධික සංඛ්‍යාවකට සහ නිෂ්පාදන සේවා බාහිර විකාශ රථය යොදා ගනිමින් කරනු ලැබූ සජීව සහ සජීව නොවන රූගත කිරීම් 115 කට නිර්මාණමය දායකත්වය ලබා දී ඇත. වැඩසටහන් කිහිපයක් සඳහා සම්මානද හිමි විය. මෙම වසරේ උපකරණ සංචිතයට එකතු වූ CH 24 කින් යුත් ශ්‍රව්‍ය මිශ්‍රකය උපයෝගී කරගැනීමෙන් විශේෂයෙන්ම සංගීතමය වැඩසටහන්වල තාක්ෂණික හා ගුණාත්මක බව ඉහළ දැමීමට සහ වැඩි පහසුකම් ප්‍රමාණයක් ලබා දීමට හැකි විය.

## ආලෝකකරණ ඒකකය

නියෝජ්‍ය අධ්‍යක්ෂවරයකු යටතේ ක්‍රියාත්මක වන ආලෝකකරණ ඒකකය සංස්ථාව විසින් ඉටු කරනු ලබන සියලුම ක්ෂේත්‍ර නිෂ්පාදනවල ආලෝකකරණ නිර්මාණ කටයුතු සඳහා දායක වේ. මෙම ඒකකය විසින් නාට්‍ය, වාර්තා වැඩසටහන් , අධ්‍යාපන විචිත්‍රාංග , සඟරාමය, ළමා සහ වෙළඳ දැන්වීම් වැනි සියළුම ආකාරයේ ක්ෂේත්‍ර නිර්මාණ සඳහා ආලෝකකරණයෙන් දායකත්වය සපයනු ලබයි. ඊට අමතරව අතිගරු ජනාධිපතිතුමා සහ අගමැතිතුමා සහභාගි වන සියලුම උත්සව සහ රාජ්‍ය උත්සව සඳහා ආලෝකකරණ කටයුතු සිදු කරනු ලබන්නේද මෙම ඒකකයෙනි. 2014 වසර තුළ වැඩසටහන් 1613 කට අධික සංඛ්‍යාවක් සහ නිෂ්පාදන සේවා අංශයේ බාහිර විකාශන රථයෙන් කිෂ්පාදනය කරනු ලැබූ වැඩසටහන් සහ සජීව වැඩසටහන් 115කට ශිල්පීය දායකත්වය ලබා දී ඇත.

සේවක ඇස්තමේන්තුවට අනුව ආලෝකකරණ ශිල්පීන් 15 දෙනෙකු සිටිය යුතු අතර දැනට මෙම ඒකකය පවත්වාගෙන යනු ලබන්නේ ජ්‍යෙෂ්ඨ ආලෝකකරණ ශිල්පීන් 06 දෙනෙකු සහ ආලෝකකරණ ශිල්පීන් 03 දෙනෙකු විසිනි. මෙවැනි ශිල්පීන් හිඟයක් පවතිද්දී නිෂ්පාදන 1685 කට සහ බාහිර සජීව වැඩසටහන් 115කට අධික ප්‍රමාණයකට දායක වී ඇත. 2014 වසර තුළ මෙම සේවක හිඟය යතාවත් කර ගැනීමට යෝජනා කොට ඇති අතර තිදෙනෙකු ලබා ගැනීම සඳහා ඉහළ කලමනාකාරිත්වයේ අනුමැතිය ලැබී ඇත. ආලෝකකරණයට අවශ්‍ය සියලුම උපකරණ සහ උපාංගයන්ගෙන් සමන්විත උපකරණ සංචිතය නඩත්තු කොට පවත්වාගෙන යනු ලබන අතර එළඹෙන වසර තුළ මෙම උපකරණ වල නවීකරණ කටයුතු සිදු කිරීමටත් නව තාක්ෂණික උපකරණ ලබා ගැනීමටත් සැලසුම් කොට ඇත.

## වේශ නිරූපණ ඒකකය

වේශ නිරූපණ ඒකකයද නිෂ්පාදන සේවා අංශයට අයත් වේ. රූපවාහිනී වැඩසටහන් සඳහා වූ වේශ නිරූපණ මෙම ඒකකයෙන් සිදුකෙරේ. වේශ නිරූපණ ඒකකයේ සහකාර අධ්‍යක්ෂ ඇතුලුව වේශ නිරූපණ ශිල්පීහු 12 දෙනෙක් සේවයේ යෙදී සිටිති.

## පසුතල නිර්මාණ ඒකකය

ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව මගින් නිෂ්පාදනය කරනු ලබන මැදිරි හා බාහිර පටිගත කිරීම් සහ සියලුම සජීව වැඩසටහන්වල ආයතනික අනන්‍යතාව ඉහළ මට්ටමක පවත්වා ගනිමින් ගුණාත්මක භාවයෙන් උසස් වැඩසටහන් නිෂ්පාදනය සඳහා අවශ්‍ය පසුතල නිර්මාණ සහ කලා අධ්‍යක්ෂණ කටයුතු වලින් දායකත්වය ලබාදීම මෙම ඒකකයේ ප්‍රධාන අරමුණ සහ කාර්යභාරය වෙයි.

**<u>2014 වර්ෂයේ විශේෂ පසුතල යෙදවුම්</u>**

- ප්‍රධාන මැදිරි 1,2,3 සහ රජත මැදිරි පසුතල යෙදවුම් සහ ඉවත් කිරීම - 2050 පමණ
- ඒකාංගික නාට්‍ය (පෝය නාට්‍ය) - 11
- ළමා නාට්‍ය - 01
- අවුරුදු ඒකාංගික නාට්‍ය - 01
- වෙසත් ඒකාංගික නාට්‍ය - 01
- ටෙලි මාලා නාට්‍ය - 01
- නත්තල් නාට්‍ය - 01

**<u>2014 වසරේ විශේෂ ප්‍රදර්ශන කුටි සහ විශේෂ පසුතල නිර්මාණ</u>**

- අලුත් සහල් මංගල්‍ය විශේෂ පසුතලය - 2014 ජනවාරි
- තෛපොංගල් විශේෂ පසුතලය - 2014 ජනවාරි
- ප්‍රවෘත්ති නව පසුතලය - 2014 පෙබරවාරි
- දැයට කිරුළ ප්‍රදර්ශන කුටිය සහ පසුතලය - 2014පෙබරවාරි - කුළියාපිටිය
- දැයට කිරුළ - ව්‍යාපාරික කිරුළ - 2014 පෙබරවාරි - වයඹ පලාත
- 32 සංවත්සර විශේෂ පිරිත් මණ්ඩප පසුතලය - 2014 පෙබරවාරි
- ශ්‍රී ලංකා - බංගලිදේශ / ආසියානු කුසලතා මැදිරි පසුතල - 2014 පෙබරවාරි
- ලෝක කාන්තා දිනය විශේෂ පසුතලය - ගම්පහ - 2014 මාර්තු
- පලාත් පාලන මැතිවරණය - විශේෂ විකාශ පසුතලය - 2014 මාර්තු - ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව
- ජාතික අවුරුදු උදානය - සිරිලක පිරි අවුරුදු සිරි - 2014 අප්‍රේල් - ඇඹිලිපිටිය
- වසන්ත උදානය - නුවරඑළිය - 2014 අප්‍රේල්
- ද්‍රවිඩ අවුරුදු උදානය මඩකලපුව - 2014 අප්‍රේල්
- ලෝක තරුණ සමුළුව බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාව - 2014 අප්‍රේල්
- බුද්ධාභි වන්දනා - 2014 නෙළුම් පොකුණ
- සෞඛ්‍ය සිසුපැණ විශේෂ පසුතලය - 2014 මැයි - සරසවි චිත්‍රාගාරය
- ජාතික වෙසක් උත්සවය - 2014 දියවන්නාව
- ජාතික පොසොන් කලාපය - තන්තිරිමලය - 2014 තන්තිරිමලය
- සද්ධර්ම වර්ෂා පොසොන් කලාපය - අනුරාධපුරය
- පොසොන් බැති ගී ජනාධිපති මන්දිරය - 2014 අනුරාධපුරය
- ඉකෝන් අයිකෝන් විශේෂ පසුතලය - 2014
- ඌව මැතිවරණ විශේෂ පසුතලය - 2014 - ජනමාධ්‍ය අමාත්‍යාංශය
- ලෝක ළමා දින විශේෂ පසුතලය - රන්මිණිතැන්න
- ලෝක ළමා දින විශේෂ පසුතලය - ද්‍රවිඩ - මඩකලපුව
- රණවිරු රියල්ස්ටාර් 04 - රත්මලාන ගුවන් හමුදා කඳවුර

- ගිරුවායේ අභිමානය - නිදහස් චතුරශ්‍ර පරිශ්‍රය
- ඩී.ඒ රාජපක්ෂ ගුණ සැමරුම - තංගල්ල සහ මැදමුලන
- අපේ ගමන විශේෂ රූපවාහිනී ප්‍රවර්ධන රථ - 2014 දෙසැම්බර්
- විශේෂ නත්තල් පසුතලය - 2014 දෙසැම්බර්

## මාධ්‍යරූප හා සජීවකරණ ඒකකය

මාධ්‍යරූප හා සජීවකරණ ඒකකයේ සේවක සංඛ්‍යාව 19කි. සියලුම වැඩසටහන් සඳහා තේමා නිර්මාණ හා පූර්ව ප්‍රචාරක පට නිර්මාණය වන්නේ මෙම ඒකකයයෙනි. රණවිරු රියල් ස්ටාර් ආකර්ෂණීය ලෙස ප්‍රේක්ෂකයා අතරට ගෙන යන්නට මාධ්‍යරූප ශිල්පීන්ගේ නිර්මාණ දායකත්වය බෙහෙවින් ප්‍රයෝජනවත් විය. අධ්‍යාපන සේවයේ සියලුම පාඩම්මාලා නිර්මාණාත්මකව ඉදිරිපත් කිරීම මෙන්ම ළමා ඒකකයේ වැඩසටහන් සඳහා මාධ්‍යරූප නිර්මාණයද මෙම ඒකකයෙන් සිදුකෙරේ. නේත්‍රා සහ අයි නාලිකා සඳහාද මාධ්‍යරූප ශිල්පීන්ගේ නිර්මාණ දායකත්වය සැපයේ.

මෙම වසරේදී මාධ්‍ය රූප නිර්මාණ ශිල්පීහු රාජ්‍ය හා පුද්ගලික රූපවාහිනී සම්මාන උළෙලවලදී සම්මාන වලින් පුදනු ලැබූහ.

## පුස්තකාලය

රූපවාහිනී පුස්තකාලය සාමාන්‍ය පුස්තකාලවලින් සුවිශේෂී වේ. එහි පවත්වාගෙන යනු ලබන තොරතුරු, මුද්‍රිත හා ශ්‍රව්‍ය දෘශ්‍ය යන මාධ්‍ය දෙකෙන්ම නිෂ්පාදන ක්‍රියාවලියට දායකත්වය දීමත් විශේෂයෙන් ශ්‍රව්‍ය දෘෂ්‍ය මාධ්‍යයේ පුස්තකාලයක් වීමත් මෙම සුවිශේෂී බවට හේතු වේ.

**<u>2014 වසරේ ව්‍යාපෘති</u>**

- 2013 වසරේ ආරම්භ කරන ලද ව්‍යාපෘති මෙම වසරේද පවත්වාගෙන යන ලදී.

රූපවාහිනී සංස්ථාව 1982 සිට මේ දක්වාම විකාශය කරන ලද වැඩසටහන් අතුරින් සංරක්ෂණය සඳහා සුදුසු වැඩසටහන් තෝරා ඒවා ශ්‍රව්‍ය දෘෂ්‍ය සංරක්ෂණ වැඩපිළිවෙළක් යටතේ සකස් කිරීම සඳහා ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයට ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කර ඇත.( Project Proposal for Audio Visual Achiving) මෙම ව්‍යාපෘතිය සඳහා බාහිර අංශයකින් හෝ ප්‍රතිපාදන ලබාගෙන ක්‍රියාත්මක කිරීමට නියමිතව තිබේ.

# අයි නාලිකාව / නේත්‍රා / එන්ටීවී

## අයි නාලිකාව

අයි නාලිකාව හා නේත්‍රා නාලිකාව එකම සංඛ්‍යාත පරාසයක ක්‍රියාත්මක වේ.

සිදුකළ කාර්යයන් සහ ව්‍යාපෘති

1. Rice & Shine උදෑසන සජීව විකාශය - සෑම දිනකම පෙ.ව 06.00 සිට 07.30
2. Rice & Shine 4th Anniversary – (01.12.2014) - පෙ.ව 06.00 සිට 07.30
3. Skills for Life - Rice & Shine Segment
4. Eye Shuffle – සජීව සංගීත වැඩසටහන (අලුත් ඉංග්‍රීසි ගීත) - සඳුදා 21.30 සිට 22.30
5. Cafe Classics – සජීව සංගීත වැඩසටහන (පැරණි ඉංග්‍රීසි ගීත) - අඟහරුවාදා 21.30 සිට 22.30
6. Dhamma & You – පටිගත කළ බෞද්ධ සාකච්ඡාමය වැඩසටහන - පොහොය දින 21.30 සිට 22.30
7. Crosscurrent – කාලීන සිදුවීම් පිළිබඳ සාකච්ඡාමය වැඩසටහන - සිකුරාදා 22.00 සිට 23.00
8. National Day Messages (INDIA/ IRAN/ PAKISTAN/ BANGLADESH) – පටිගත කළ වැඩසටහන්
9. Special Discussions – පටිගත කළ සාකච්ඡාමය වැඩසටහන්

## දෙමළ වැඩසටහන් ඒකකය - නේත්‍රා නාලිකාව

නේත්‍රා නාලිකාව මෙරට දෙමළ කතා කරන ප්‍රේක්ෂකයන් ඉලක්ක කරගෙන වැඩසටහන් විකාශය කරයි. ඒ අනුව 2014 වසර තුළ විකාශය කරන ලද වැඩසටහන් පහත පරිදි වේ.

- වනක්කම් නේත්‍රා - සතියේ දිනයන්හි විකාශය වන සජීව සාකච්ඡාමය වැඩසටහනකි.
- උදය දර්ශනම් - සතියේ දිනයන්හි විකාශය වන සජීව සඟරාමය වැඩසටහනකි.
- ලන්ච් ටයිම් මියුසික් - සතියේ දිනයන්හි විකාශය වන සජීව සංගීතමය වැඩසටහනකි.
- අධ්‍යාපන වැඩසටහන - අ.පො.ස (සා.පෙළ) සහ අ.පො.ස (උ.පෙළ) සිසුන් වෙනුවෙන් - දිනපතා, සජීව

- සයිවනීදි - හින්දු ආගමික වැඩසටහනකි
- පට්ටම් පූදූකාලෙෙ - ළමා විනෝදාත්මක වැඩසටහනකි.
- පුදම් පුතු කලායි - සඟරාමය වැඩසටහනකි - සති අන්ත - සජීව
- එම් 9.30 - සංගීතමය වැඩසටහනකි
- කෝඩෙඩ මලෙෙ - සංගීත සඟරාමය වැඩසටහනකි
- ඉප්පදික්කු සට්ටම් - සාමාන්‍ය ජනතාව වෙනුවෙන් නීති පිළිබඳව වූ වැඩසටහනකි.
- සමයාල් ගැලරි - ඉවුම් පිහුම් වැඩසටහනකි
- බ්‍රින්දාවනි - සම්භාව්‍ය සංගීතමය වැඩසටහනකි
- ෆිල්ම් සිටි - දේශීය කෙටි චිත්‍රපට නිෂ්පාදන සම්බන්ධ වැඩසටහනකි
- දේශීය ටෙලි නාට්‍ය - දෙමළ ටෙලි නාට්‍ය - දේශීය
- ඉකෝන් අයිකෝන් -පාසල් දරුවන්ගේ ප්‍රශ්න විචාරාත්මක වැඩසටහනකි.

**අනෙකුත් විශේෂ වැඩසටන්**

- අලුත් අවුරුදු සහ නේත්‍රා සංවත්සරය
- තෛපොංගල් - විශේෂ සජීව සංස්කෘතික සහ සාම්ප්‍රදායික වැඩසටහන මඩකපපුවේ සිට තෛපොංගල් විශේෂ සංගීතමය වැඩසටහන
- මාතලේ තේර් උත්සවය
- මහා ශිව රාත්‍රී දිනය
- සිංහල සහ හින්දු අලුත් අවුරුද්ද
- වෙසක් උත්සවය
- පොසොන් උත්සවය
- නල්ලූර් වාර්ෂික තේර් උත්සවය
- ලෝක ළමා දිනය
- දීපාවලී උත්සවය
- නත්තල් දින වැඩසටහන

## මුස්ලිම් වැඩසටහන් ඒකකය

නේත්‍රා අයි නාලිකාව සහ එන්.ටී.වී අංශය යටතේ මුස්ලිම් වැඩසටහන් ඒකකය ක්‍රියාත්මක වේ. මෙම ඒකකය නියොජ්‍ය අධ්‍යක්ෂවරයෙක්,නිෂ්පාදකවරු දෙදෙනෙක්, නිෂ්පාදන සහකාරවරයෙක් සහ ජොෂ්ඨ කළමනාකරණ සහකාරවරයෙකුගෙන් සමන්විත වේ. නේත්‍රා නාලිකාව මගින් දේශිය සහ විදේශීය මුස්ලිම් වැඩසටහන් විකාශය කෙරේ. මෙම වැඩසටහන් මුස්ලිම් ප්‍රජාව ඉලක්ක කර ගනිමින් නිෂ්පාදනය කරනු ලබන අතර ඉස්ලාම් ආගම සහ සංස්කෘතිය වඩා හොඳින් එම ජනතාවට සමීප කරවීමට එමගින් කටයුතු කරනු ලැබේ. මෙම ඒකකය නිෂ්පාදනය කළ පහත වැඩසටහන් 2014 වර්ෂය තුළදී විකාශය කරන ලදී.

- යාත්තිරෙෙ
- ඉසෙෙ තෙන්ඩ්‍රල්
- නේත්‍රා එක්ස්ප්‍රස්
- නම්ම සන්ඩේ

**විශේෂ වැඩසටහන්**

- රාමලාන් ඉෆ්තාර්
- රාමලාන් උත්සවය
- හජ්ජි උත්සවය
- මීලාදුන් නබි උත්සවය

## එන්ටීවී නාලිකාව

NTV නාලිකාව දෛනිකව පැය 16 1/2 ක් විකාශය විය. විකාශන පරාසය කොළඹ නගරය තුලට පමණක් සීමා විය. NTV නාලිකාව වැඩිපුරම විකාශයට යොදා ගනු ලැබුවේ විදේශිය වැඩසටහන් නැවත විකාශයන්ය. ඉංග්‍රීසි ප්‍රවෘත්ති සහ Rise and Shine වැඩසටහන අයි නාලිකාව සමඟ සමගාමීව විකාශය වූ අතර රාත්‍රී 9.30 ට අයි නාලිකාවේ විකාශය වූ ඉංග්‍රීසි වැඩසටහන් නැවත විකාශයක් ලෙස NTV නාලිකාවේ විකාශය විය.

## ඉංජිනේරු අංශය

සංස්ථාවේ වැඩසටහන් නිෂ්පාදනය හා විකාශන කටයුතු උසස් අන්තර් ජාතික තාක්ෂණික ප්‍රමිතීන් අනුව ගුණාත්මකව කරගෙන යාමට සෘජු දායකත්වයක් මෙම අංශයෙන් ලැබේ. මෙම අංශය ප්‍රධාන පාලක මැදිරිය, මැදිරි හා බාහිර විකාශන, සම්ප්‍රේෂණ , නඩත්තු , තොරතුරු තාක්ෂණය , විදුලි හා වායු සමීකරණ සහ සිවිල් යන ඒකක වලින් සමන්විත වේ.

මෙයට අමතරව විවිධ ව්‍යාපෘති හා උපදේශන සේවා බොහෝ රජයේ ආයතනවල තාක්ෂණික අවශ්‍යතාවන් පදනම් කරගෙන සපයා ඇත. අංකන තාක්ෂණය යටතේ වූ ජපානයේ ISDB - T භෞතික විකාශන ක්‍රමයේ පර්යේෂණ සම්ප්‍රේක්ෂණ කටයුතු සම්පූර්ණයෙන්ම සිදු කරන ලදී. ජාතික සේවාවක් ලෙස කාර්මික විද්‍යාලවල ඩිප්ලෝමා සිසුන්ට හා විශ්ව විද්‍යාලවල ඉංජිනේරු උපාධි අපේක්ෂකයන්ට නොමිලේ සේවාස්ථ පුහුණුව සැපයේ. 2014 වසර තුළ මාස 03 සහ මාස 06 සීමාවන්ට යටත්ව එවැනි සිසුන් 53 දෙනෙක් සඳහා සේවාස්ථ පුහුණුව ලබා දී ඇත.

රූපවාහිනී වැඩසටහන් නිෂ්පාදනය සඳහා මැදිරි 5ක් ද , ජංගම බාහිර විකාශන රථ 03ක් ද උපයෝගී වන අතර විකාශනය සඳහා සම්ප්‍රේෂණාගාර 11 ක් පිදුරුතලාගල, දෙනියාය, සූරියකන්ද, හන්තාන, ප්‍රිම්රෝස්, නමුණුකුල, පලාලි , පාදගල, කොකාවිල්, බම්බලපිටිය, ටොරින්ටන් යන ස්ථාන වල ස්ථාපනය කර ඇත.

එසේම රූපවාහිනී වැඩසටහන් ඩයලොග් චන්ද්‍රිකා විකාශනය ඔස්සේද (Dialog TV ) ශ්‍රී ලංකා ටෙලිකොම් පියෝ ටීවී ( PEO TV) සේවාව ඔස්සේ සහ WWW.rupavahini.lk වෙබ් අඩවිය මගින් අන්තර්ජාලය ඔස්සේ ද ලෝකයේ ඕනෑම තැනක සිට නැරඹිය හැක.

මෙම අංශය නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (ඉංජිනේරු) යටතේ පාලනය වේ. ඉහත සඳහන් කරන ලද ඒකක හා උප ඒකක මගින් වසර පුරා පිරිනමන ලද විවිධ සේවා සංක්ෂිප්තයක් ලෙස පහත දැක්වේ.

## ප්‍රධාන පාලක මැදිරිය

රූපවාහිනී, අයි,නේත්‍රා සහ එන් ටී වී රූපවාහිනී නාලිකා හතරේම වැඩසටහන් විකාශන පාලන කටයුතු සිදු කරන ප්‍රධාන පාලක මැදිරිය ඉංජිනේරු අංශය සතු ඉතා වැදගත්ම කාර්ය බහුල ස්ථානයකි. සාමාන්‍ය සම්ප්‍රේෂණ කාල සීමාව දිනකට පැය 60ක් වේ. එසේම රූපවාහිනී වැඩසටහන් වල පසු නිෂ්පාදන කටයුතු සිදු කිරීම සඳහා යොදා ගන්නා රේඛීය හා රේඛීය නොවන සංස්කරණ පද්ධති 12 ක්ද ප්‍රධාන පාලක මැදිරිය යටතේ ක්‍රියාත්මක වේ.

2014 වර්ෂය තුළ නව ස්ථාපිත කිරීම් හා වැඩි දියුණු කිරීම් පිළිබද විස්තර පහත දැක්වේ.

1. XDCAM වෘත්තිමය තැටි ධාවන යන්ත්‍ර 04 ක්, විකාශන නාලිකා 02ක් , ප්‍රධාන පුවරු 2ට ඇදිය හැකි වන පරිදි E/G, F/H යන ස්ථාන වල ස්ථාපනය කරන ලදී.

2. වැඩසටහන් පූරක වැඩසටහන් ඉදිරිපත් කිරීමේ ඒකකයේ සිට MCR හි Playbox හා Doremi යන සේවා දායක යන්ත්‍ර දෙක හා හුවමාරු කර ගැනීම සඳහා දෘෂ්‍ය ගොනු හුවමාරු ජාල පහසුකම සපයා දෙන ලදී.

3. මැදිරි අංක 3 ආලින්දයේ ඉදිකරන ලද මැදිරිය මගින් World Cup Cricket ඇතුළු අනිකුත් ජාත්‍යන්තර සජීව ක්‍රිකට් විකාශන සඳහා සජීව සාකච්ඡා වලට අවශ්‍ය පහසුකම් සපයාදෙන ලදී.

4. වැදගත් ප්‍රවෘත්ති ආවරණයන්ගේ සජීව විකාශන කටයුතු සඳහා උපයෝගී කර ගැනීමට දෙවන Live U Base Station එක MCR හි ස්ථාපනය කරන ලදී.

5. Intelligent LED Light ආලෝකනයන් 05ක් MCR හි ඇති මැදිරි අංක 04 හි ස්ථාපනය කරන ලදී.

6. PPU 9 හා 11 හි ඇති රේඛීය නොවන සංස්කරණ පද්ධතිය සඳහා Avid Media Composer සංස්කරණ මෘදුකාංගය ස්ථාපනය කරන ලදී. දෛනික විකාශ හා සංස්කරණ කාලයන් පහත සඳහන් පරිදි වේ.

| | |
|---|---|
| • දෛනික විකාශන කාලය | පළමු නාලිකාව (රූපවාහිනිය) පැය 22 |
| | දෙවන නාලිකාව (Eye / නේත්‍රා ) පැය 18 |
| • දෛනික සංස්කරණ කාලය | එක් පද්ධතියකට පැය 14 බැගින් (දළ වශයෙන්) |

## මැදිරි මෙහෙයුම්

සජීව වැඩසටහන් මෙන්ම වැඩසටහන් පටිගතකිරීම් සඳහාද මැදිරි අංක i, ii, iii, iv (හඬකැවීම් මැදිරිය) හා රජත එළිමහන් මැදිරිය තුළ පහසුකම් සපයා ඇත.

වසර 2014 දී සිදුකරන ලද වැඩසටහන් දළ වශයෙන් පහත දැක්වේ.

- සජීව වැඩසටහන් 7600
- සජීව ප්‍රධාන ප්‍රවෘත්ති ප්‍රකාශ 2100
- සජීව පැයෙන් පැය ප්‍රවෘත්ති ප්‍රකාශ 3400
- ලොතරැයි ඇදීම 1750
- අධ්‍යාපන වැඩසටහන් 850

ප්‍රවෘත්ති ප්‍රකාශ හැරුණු කොට ඉහත වැඩසටහන් සඳහා දෛනික සාමාන්‍ය සජීව විකාශන කාලය පැය 32 ක් වන අතර මෙම කාර්ය භාරය අතිශයින් අවම කාර්ය මණ්ඩලය මගින් සිදු කර ගෙන යන ලදී.

පහත සඳහන් උත්ශ්‍රේණි කිරීම් 2014 දී සිදු කෙරිණි.

- XDCAM දෙමුහුන් පටිගත කිරීමේ යන්ත්‍ර 3ක් මැදිරි 1,2 හා 3 හි ස්ථාපනය කරන ලදී.
- ප්‍රවෘත්ති අංශය හා මැදිරි අංක දෙක අතරේ ප්‍රවෘත්ති දෘෂ්‍ය ගොනු හුවමාරු කිරීම සඳහා ටෙරා බයිට් 1 ක ධාරිතාවක් ඇති Server යන්ත්‍රයක් දෘෂ්‍ය තන්තු ජාලයක් ඔස්සේ ස්ථාපිත කිරීම.

## බාහිර විකාශ

බාහිර විකාශ ට්‍රක් රථ 2 හා මන්දගාමී චලනය සඳහා වූ බස්රථය භාවිතයෙන් පසුගිය වසර තුළ බාහිර සජීව විකාශන හා පටිගත කිරීම් 134 ක් සිදුකර ඇත. ජාතික සිදුවීම්, ක්‍රීඩා තරඟ වැඩසටහන්, ආගමික වැඩසටහන් මීට ඇතුලත් වේ.

ඒ පිළිබඳ දළ විස්තර පහත දැක්වේ.

- බාහිර විකාශ බස්රථ අංක 1 — 31 (දින 50)
- බාහිර විකාශ බස්රථ අංක 2 — 92(දින 70)

- බාහිර විකාශ බස්රථ අංක 2 සමඟ මන්දගාමී චලනය සඳහා වූ බස්රථය 11 (දින 22)

මීට අමතරව බාහිර විකාශ බස්රථ අංක 2 හි Samsung LED 45" බහු නැරඹුම් තිර දෙකක් ස්ථාපනය කිරීමෙන් උත්ශ්‍රේණි කරනු ලැබිණි.

## සම්ප්‍රේෂණ ඒකකය

ගත වූ වසරේ සම්ප්‍රේෂණ ඒකකයෙන් පහත සඳහන් ප්‍රධාන කාර්යයන් ඉටු කරන ලදී.

- දිවයින පුරා ඵලදායි ආවරණයක් සිදුවන පරිදි විකාශනාගාර 11කින් සමන්විත දීප ව්‍යාප්ත භෞතික විකාශන ජාලයේ මෙහෙයුම් හා නඩත්තු කටයුතු ඉතා උසස් මට්ටමෙන් පවත්වාගෙන යාම.
- දිවයින පුරා බාහිර විකාශ 150 ක් සඳහා සජීව සබැඳි පහසුකම් සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම.

විකාශ පිරිවැය අවම කිරීමේ අරමුණින් උපකරණ හා පහසුකම් ලබාගත හැකි භාවය සැලකිල්ලට ගෙන මෙම සජීව සබඳතා පහත සඳහන් ක්‍රම ඔස්සේ ක්‍රියාවට නැංවීම.

i. අතේ ගෙන යා හැකි ක්ෂුද්‍ර තරංග සබැඳි උපකරණ භාවිතය
ii. ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයේ දත්ත පරිපථ ඔස්සේ දෘෂ්‍ය තන්තු සැබැඳි උපකරණ භාවිතය
iii. අංකන චන්ද්‍රිකා තාක්ෂණය ඔස්සේ ප්‍රවෘත්ති රැස්කිරීම සඳහා චන්ද්‍රිකා තාක්ෂණ උපකරණ භාවිතය

- දේශීය හා විදේශීය විකාශනකරුවන් සඳහා ක්ෂුද්‍ර තරංග සබැඳි උපකරණ හා අංකන චන්ද්‍රිකා ප්‍රවෘත්ති රැස්කිරීමේ උපකරණ කුලියට දීමෙන් රු 3,041,500 ක අමතර ආදායමක් උත්පාදනය කරන ලදී.
- දකුණු හා මධ්‍යම පලාත්වල රූපවාහිනී, EYE, නේත්‍රා යන නාලිකා වල සංඥා ග්‍රහණය කිරීමේ ග්‍රහණාත්මකභාවය වැඩි දියුණු කිරීම සඳහා නව විකාශනාගාර දෙකක් හුන්නස්ගිරිය හා ගොන්ගල යන ස්ථානවල ස්ථාපනය කරන ලදී.

## නඩත්තු ඒකකය - 1 (පද්ධති හා උපකරණ නඩත්තු කටයුතු)

- ප්‍රධාන පාලක මැදිරිය, මැදිරි හා බාහිර විකාශන බස්රථ වල ස්ථාපනය කර ඇති උපකරණ හා පද්ධති වල දෝෂ නිවාරණ හා දෝෂ නිරාකරණ නඩත්තු කටයුතු ඉටු කරනු ලබයි.
- සංස්ථාවේ අංශ හා ඒකක සඳහා දූරකථන ස්ථාපනය කිරීම හා ඒවායේ නඩත්තු කටයුතු සිදු කිරීම.
- ජනාධිපතිතුමාගේ ටෙලිප්‍රොම්ටර් රාජකාරි සඳහා කාර්ය මණ්ඩලය යෙදවීම.

2014 වර්ෂය තුළ නඩත්තු -1 ඒකකය මගින් ඉටුකරන ලද සුවිශේෂ කාර්ය පහත දැක්වේ.

1. ප්‍රධාන අලුත්වැඩියා කටයුතු - 224
2. ජනාධිපතිතුමාගේ හා ආරක්ෂක ලේකම්තුමාගේ ටෙලිප්‍රොම්ටර් කටයුතු (නේපාල හා ඇමෙරිකා එක්සත් ජනපද විදේශ සංචාර ඇතුලත්ය.) - 156
3. දූරකථන ආශ්‍රිත අලුත්වැඩියා කටයුතු - 247
4. නව දූරකථන ස්ථාපිත කිරීම - ප්‍රධාන විධායක කාර්යාලය, නාට්‍ය හා, තරුණ, දෙමළ හා ක්‍රීඩා ඒකකය
5. නව PEO TV සබඳතා ස්ථාපිත කිරීම - විශේෂ ඒකකය හා පර්යේෂණ හා පුහුණු ඒකකය.
6. නව සමීප පරිපථ රූපවාහිනී පද්ධතිය ස්ථාපිත කිරීම.
7. නඩත්තු කාර්ය මණ්ඩලය මගින් ඉටු කරන ලද බාහිර විකාශන ආවරණ - 63

ඉන් ප්‍රධාන බාහිර විකාශන ආවරණ කටයුතු අතර නිදහස් දිනය, ජනපති ජන හමුව, දක්ෂිණ අධිවේගී මාර්ගය විවෘත කිරීම, සජීව අලුත් අවුරුදු විකාශනය, සීගිරිය, පොක්ස් හිල්, පන්ගොල්ල ගනර්ස්, වලව ගජබා සහ කටුකුරුන්ද මොටර් රථධාවන තරඟය, IPL ක්‍රිකට් තරඟාවලිය, බ්‍රැඩ්ලි රග්බි තරග මාලාව, සජීව නත්තල් රාත්‍රී දේව මෙහෙය වේ.

8. දැයට කිරුළ 2014 අධ්‍යාපන ප්‍රදර්ශන කුටිය
9. පහත සඳහන් විකාශන කටයුතු සඳහා මැදිරි තාක්ෂණික පහසුකම් පුළුල් කිරීම සිදු කෙරිණි.

- ගුවන් හමුදා පාපැදි සවාරිය
- 2014 FIFA කුසලාන පාපන්දු තරගාවලිය

- 2014 ආසියානු ක්‍රීඩා උළෙල
- යුවර් ඔප් යූත් තරගාවලිය

10. විශාකා විද්‍යාලීය අධ්‍යාපනික ප්‍රදර්ශන කුටිය

11. මැදිරි දෙකෙහි ප්‍රවෘත්ති විකාශන පිහිටුවීම සකස්කර නැවත ස්ථාපිත කිරීම.

12. ජනපති ජනහමුව සඳහා ප්‍රධාන පාලක මැදිරිය හා මැදිරිවල තාක්ෂණික පහසුකම් පුළුල් කිරිම.

13. බස්නාහිර , දකුණු හා ඌව පලාත් සභා ඡන්ද ප්‍රතිඵල සජීව විකාශය සඳහා මැදිරි තාක්ෂණ පහසුකම් පුලුල් කිරීම.

**නඩත්තු ඒකකය - 2** (ක්ෂේත්‍ර උපකරණ හා නිෂ්පාදන සේවා අංශයට අදාල බාහිර විකාශ බස් රථයේ නඩත්තු කටයුතු)

- විද්‍යුත් ප්‍රවෘත්ති රැස් කිරීමේ, විද්‍යුත් ක්ෂේත්‍ර නිෂ්පාදන උපකරණ හා නිෂ්පාදන සේවා ඒකකයට අදාළ බාහිර විකාශ බස්රථයේ සියලුම උපකරණ වල දෝෂ නිවාරන හා නිවැරදි කිරීමේ නඩත්තු කටයුතු මෙම ඒකකය මගින් සිදුකෙරේ. කැම්කෝඩර් දෘෂ්‍ය,ශ්‍රව්‍ය සංකලන පුවරු, දෘෂ්‍ය නිරීක්ෂණ තිර, ශ්‍රව්‍ය අධීක්ෂණ උපකරණ, අතේ ගෙනයා හැකි වීඩියෝ කැසට් පටිගත කරන යන්ත්‍ර , මයික්‍රොෆෝන් , ශ්‍රව්‍ය වර්ධක, විද්‍යුත් කෝෂ, විද්‍යුත් කෝෂ ආරෝපක, ප්‍රත්‍යාවර්ථ, - සරල ධාරා, පරිවර්තක, ආලෝකකරණ උපකරණ හා රැහැන් මේ අතර වේ.

- නව උපකරණ මිලදී ගැනීම සඳහා තාක්ෂණික ශක්‍යතාව ඇගයීමට ලක්කිරීම සිදුවේ.
- ප්‍රසම්පාදන ක්‍රියාවලිය සඳහා තාක්ෂණික පිරිවිතර සකස් කිරීම හා තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තා සකස් කිරීම.
- අලුතින් මිලදී ගන්නා ලද උපකරණ තත්ව පරීක්ෂණයට ලක් කිරීම සහ ස්ථාපනය කිරීම.

2014 වසරේ ඉටු කරන ලද සේවා පිළිබඳ සංඛ්‍යාත්මක විස්තරයක් පහත දැක්වේ.

| | | | |
|---|---|---|---|
| • කැම්කෝඩර්ස් | : | දෝෂ නිවාරණ නඩත්තු කටයුතු - | 67 |
| | | විශේෂ නඩත්තු කටයුතු | - 07 |

දෝෂ නිවැරදි කිරීමේ නඩත්තු කටයුතු - 66

- අතේ ගෙන යා හැකි දෘෂ්‍ය / ශ්‍රව්‍ය පටිගතකරණ
  : දෝෂ නිවාරණ නඩත්තු කටයුතු - 11
  විශේෂ නඩත්තු කටයුතු - 03
  දෝෂ නිවැරදි කිරීමේ නඩත්තු කටයුතු - 04

- කැමරා කාව : දෝෂ නිවැරදි කිරීමේ නඩත්තු කටයුතු - 14
- දෘෂ්‍ය නිරීක්ෂක තිර : දෝෂ නිවැරදි කිරීමේ නඩත්තු කටයුතු - 13
- ශ්‍රව්‍ය අධීක්ෂණ උපකරණ : දෝෂ නිවැරදි කිරීමේ නඩත්තු කටයුතු - 07
- සරල ධාරා සැපයුම් හා විද්‍යුත් කෝෂ ආරෝපක:
  දෝෂ නිවැරදි කිරීමේ නඩත්තු කටයුතු - 09
- ආලෝකරණ උපකරණ : දෝෂ නිවැරදි කිරීමේ නඩත්තු කටයුතු - 29
- තාක්ෂණික පිරිවිතර පිළියෙල කිරීම් - 04
- ප්‍රසම්පාදන ටෙන්ඩර් ඇගයීම් - 08
- අලුත් උපකරණ තාක්ෂණික තත්ව පරීක්ෂාව - 24

## තොරතුරු තාක්ෂණ හා සන්නිවේදන ඒකකය

රූපවාහිනී සංස්ථාවේ පරිගණක ජාලය හා එයට සම්බන්ධ උපාංග නඩත්තු හා මෘදුකාංග යාවත්කාලීන කිරීම මෙම ඒකකයේ කාර්ය භාරයයි. පරිගණක යන්ත්‍ර 295 ක් මුද්‍රණ යන්ත්‍ර 90 ක් හා පරිගණක සර්වර් 15 ක් වෙබ් හා මේල් ඇතුලත්ව පූර්ණ නඩත්තුව හා අලුත් වැඩියාවද දෝෂ නිරාකරණය ද මෙම ඒකකය මගින් සිදුකෙරේ.

තවද ප්‍රධාන නාලිකාවල වෙබ් අඩවි පවත්වාගෙන යාම හා නඩත්තුවද පණිවිඩ සම්බන්ධීකරණයද ඒකක සඳහා අවශ්‍ය මෘදුකාංග නිපදවීමද සජීව ක්‍රීඩා ඉසව් සඳහා මෘදුකාංග නිපදවීම හා සජීව විකාශයන්ට සම්බන්ධව ඒවා ඉදිරිපත් කිරීමද තොරතුරු තාක්ෂණ හා සන්නිවේදන ඒකකය විසින් සිදු කරනු ලබයි.

- රූපවාහිනී වෙබ් අඩවි නැවත සැලසුම් කිරීම හා (CMP) භාවිතය සහ ඒ හා සමගාමීව නේත්‍රා හා චැනල් අයි වෙබ් අඩවි සකස් කිරීම.
- ත්‍රි භාෂා ප්‍රවෘත්ති වෙබ් අඩවිය සැලසුම් කිරීම හා සකස් කිරීම.

- වෙබ් අඩවි හරහා නාලිකා වල සජීව විකාශයන් වඩාත් හොඳ තත්වයෙන් ආරම්භ කිරීම.
- ප්‍රවාහන ඒකකය, ප්‍රධාන පාලක මැදිරිය , මාධ්‍ය රූප ඒකකය සම්බන්ධ වන (Fiber Optic) පරිගණක ජාලය යාවත්කාලීන කිරීම.
- සමාජ ජාල වෙබ් අඩවි භාවිතය පිළිබඳ වැඩමුළු පැවැත්වීම හා පුහුණු වැඩසටහන් පැවැත්වීම.
- නව ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතයට හඳුන්වා දීම.
- පරිගණක හා මෘදුකාංග යන්ත්‍ර අලුත්වැඩියාව හා නඩත්තුව .
- මැතිවරණ ප්‍රතිඵල හා ක්‍රීඩා තරග , ප්‍රශ්න විචාරාත්මක වැඩසටහන් සඳහා මාධ්‍ය රූප ලබාදීම හා ඒ සඳහා මෘදුකාංග සකස් කිරීම.

## විදුලි හා වායු සමීකරණ ඒකකය

කොළඹ මැදිරි සංකීර්ණයේ හා දිවයින පුරා විකාශනාගාරවල ස්ථාපනය කර ඇති විදුලි හා වායු සමීකරණ උපකරණ හා පද්ධතිවල දෝෂ නිවාර නිවැරදි කිරීම් හා නඩත්තු කටයුතු නිත්‍ය ලෙස මෙම ඒකකය මගින් ඉටු කරනු ලබයි.

- 1250 KVA ඩීසල් විදුලි ජනක යන්ත්‍රය
- 250 KVA ඩීසල් විදුලි ජනක යන්ත්‍රය
- මධ්‍යම වායුසමීකරණ බලාගාරය
- බෙදුනු වර්ගයේ වායු සමීකරණ ඒකක 180 ක්
- බාහිර විකාශ බස්රථවල වායු සමීකරණ පද්ධති
- අඛණ්ඩ විදුලි සැපයුම් පද්ධති
- අලුත් බෙදුනු වර්ගයේ වායු සමීකරණ ඒකක කිහිපයක් හා නව පිටාර වායු පද්ධතියක් මැදිරි සංකීර්ණයේ වූ අට්ටාල අවකාශයේ ස්ථාපිත කරන ලදී.
- 90 KVA ඩීසල් විදුලි ජනක යන්ත්‍රයක්
- 40 KVA තෙකලා අඛණ්ඩ විදුලි සැපයුම් පද්ධතියක්
- විදුලි ඇණ ආරක්ෂක පද්ධතියක් / අකුණු නිවාරණයක්
- විදුලි පාලක පුවරුවක්

කොළඹ මැදිරි සංකීර්ණය, හන්තාන, සූරියකන්ද සහ අභිනවයෙන් ඉදිකරන ලද හුන්නස්ගිරිය යන විකාශනාගාරවල විදුලි ඇණ නිවාරන පද්ධති ස්ථාපිත කරන ලදී.

15 KVA එකලා අඛණ්ඩ විදුලි සැපයුම් පද්ධතියක් හා විදුලි පාලක පුවරුවක් හුන්නස්ගිරිය විකාශනාගාරයේ ස්ථාපනය කරන ලදී. මෙහිදී සඳහන් කළ යුතු විශේෂ කරුණ වනුයේ ඉංජිනේරු හා කාර්මික කාර්ය මණ්ඩලයේ උග්‍ර හිඟයක් මාධ්‍යයේ වුවද ඉතාමත් සීමිත උපකරණ හා පහසුකම් සහිතව විදුලියේ කිසිදු බිඳවැටීමකින් තොරව සියලු නාලිකාවල විකාශන කටයුතු කරගෙන යාමට විදුලි හා වායු සමීකරණ ඒකකයේ දායකත්වයලැබීමයි.

වායු සමීකරණ පද්ධතිවල සිදු කරන ලද දෝෂ නිවාරණ නඩත්තු කටයුතු පහත පරිදිවේ.

- මැදිරි සංකීර්ණයේ මධ්‍යම වායු සමීකරණ පද්ධතිය හා ඊට අදාළ උපකරණ
- මැදිරි සංකීර්ණයේ වාතාශ්‍ර පද්ධතිය
- බාහිර විකාශ බස්රථ අංක 1,2 හෙඩ් ලයින් බස්රථය හා මන්දගාමී චලන සඳහා වූ බස් රථයේ වායු සමීකරණ පද්ධති.
- රූපවාහිනී පරිශ්‍රයේ හා විකාශනාගාරවල ඇති බෙදුනු වර්ගයේ වායු සමීකරණ ඒකක 200
- කාර්ය මණ්ඩලය සඳහා වූ ආපන ශාලාවේ ඇති ශීතකරණ හා අධිශීතකරණ උපකරණ
- විද්‍යුත් වායු පිරිසිදුකරණය

මීට අමතරව පහත සඳහන් කාර්යයන් ද ඉටු කරන ලදී.

වායු සමීකරණ ඒකක හා අදාළ උපකරණවල බිඳවැටීම් 181 ක් දෝෂ නිවැරදි කරන ලදී. ගොන්ගල හා හුන්නස්ගිරිය විකාශනාගාර සඳහා පිටාර වාත පද්ධති ස්ථාපනය කරන ලදී.

සංස්කරණ මැදිරි සංකීර්ණයේ අංක 6 දරන වායු සමීකරණ යන්ත්‍රයේ ප්‍රධාන සංරචකයන් ප්‍රතිස්ථාපනය කොට පූර්ණ ප්‍රතිසංස්කරණයකට භාජනය කරන ලදී.

ශීත කාමරයේ ඇති ශීත ජල නල මාර්ග අර්ධ වශයෙන් නැවත පරිවරණය කරන ලදී.

ප්‍රධාන පාලක මැදිරියේ සිවිලිමේ ඇති පියන් අර්ධ වශයෙන් පරිවරණය කරන ලදී. බෙදුනු වර්ගයේ වායු සමීකරණ ඒකක 18 පහත පරිදි ස්ථාපනය කරන ලදී.

- මැදිරි 1 හා 2 වේශ නිරූපණ කාමරය - 03
- නාට්‍ය, තරුණ හා දෙමළ ඒකක - 05
- ගොන්ගල විකාශනාගාරය - 03
- හුන්නස්ගිරිය විකාශනාගාරය - 02

# අලෙවි අංශය

අලෙවි අංශයේ අංශ ප්‍රධානී අධ්‍යක්ෂ (අලෙවි) වේ. කළමණාකරණයෙහි පහසුව සඳහා මෙම අංශය පහත ඒකක වලින් සමන්විත වේ.

1. අලෙවි ඒකකය
2. උපලේඛන ඒකකය
3. අලෙවි ප්‍රවර්ධන ඒකකය
4. ප්‍රචාරක හා මාධ්‍ය ඒකකය
5. අලෙවි වැඩසටහන් නිෂ්පාදන ඒකකය
6. පරිපාලන ඒකකය

2014 වසරේ අලෙවි අංශය රූපවාහිනී සහ චැනල් අයි නාලිකාවල ගුවන් කාලය විකිණීමෙන් ලබා ඇති සමස්ත ආදායම රුපියල් 1,889,721,887.36 වන අතර සමස්ත අරමුදල් ගලා ඒම රුපියල් 1,961,499,717.45 කි.

2014 වසරේ ආදායම වර්ධනය කර ගැනීමෙහිලා පහත වැඩසටහන් විශේෂයෙන් දායක වී ඇත.

- සිංහල හා දෙමළ අලුත් අවුරුද්ද
- වෙසක් / පොසොන් උත්සව
- පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උත්සවය / ආසියානු ක්‍රීඩා උත්සවය
- FIFA ලෝක කුසලාන තරගාවලිය
- ළමා දිනය
- රණවිරු රියල් ස්ටාර් වැඩසටහන
- මෝටර් රථ ධාවන තරග

ඉහත වැඩසටහන් අතරින් සිංහල හා දෙමළ අලුත් අවුරුදු වැඩසටහන වෙනුවෙන් (ජාතික රූපවාහිනිය/ නේත්‍රා නාලිකාව - නුවර එළිය සැළලිහිණි වසන්තය සඳහා ) රු. මිලියන 43.271 ක ඉහළ ආදායමක් ලබා ගැනීමට හැකිවිය.

සේවාදායකයන්ගේ ප්‍රවර්ධන වැඩසටහන් සංවිධානය කර ප්‍රචාරය කිරීමෙන් හා විවිධ මාධ්‍ය අනුග්‍රාහකයන් ලබා ගැනීමෙන් අමතර ආදායම් ලබා ඇත.

සේවාදායක ආයතන සමග මනා සම්බන්ධතාවක් පවත්වා ගෙන යාම තුළින් සේවා දායකයන්ගෙන් ලබා ගන්නා වෙළඳ දැන්වීම් නිවැරදිව උපලේඛන ගතකර විකාශය කිරීමට

කටයුතු සලස්වා ඇත. ආදායම් ඉලක්ක සපුරා ගැනීමට සහායවීම උපලේඛන ඒකකයෙහි කාර්යය භාරය වේ. 2014 වසරේ දී උපලේඛන ඒකකය විසින් දැන්වීම් 377,683 ක් උපලේඛන ගතකර ඇත.

තවද සංස්ථාවේ වැඩසටහන් අඩංගු ඩී වී ඩී / වී සී ඩී පිටපත් නිෂ්පාදනය සහ අලෙවිය තුළින් රුපියල් 2,717,918.93 ක පමණ වාර්ෂික ආදායමක් උපයාගෙන තිබේ. එමෙන්ම නැණ මිහිර ශිෂ්‍යත්ව ප්‍රශ්න පත්‍ර කට්ටල අලෙවි අංශයෙන් විකිණීමෙන් පමණක් රුපියල් 3,612,254.07 ක ආදායමක් ලබාගෙන ඇත.

රූපවාහිනියේ විකාශය වූ වැඩසටහන්වල පිටපත් සහ පුස්තකාල දර්ශන අලෙවියෙන් ලැබූ ආදායම රුපියල් 1,196,788/- කි.

ව්‍යාපාරික කිරුළ 2014, සුන්දර නුවර එළිය 2014, සිරිලක පිරි අවුරුදු සිරි අවුරුදු උදානය 2014 - ඇඹිලිපිටිය, පූජා වෙසක් කළාපය - දෙහිවල, රජරට පොසොන් නමස්කාරය, සූරිදූනි කතරගම 2014, දැයට කිරුළ 2014, FIFA Foot Ball Promotion, පින්බර ගැටබරුව - 2014, අපේ ගමන ප්‍රවර්ධන චාරිකාව, ලෝක ළමා දිනය 2014 - රන්මිණි තැන්න ආදී ප්‍රවර්ධන කටයුතු සාර්ථකව නිම කරන ලදි.

පසුගිය වසරවල මෙන්ම 2014 වසර තුළ ද නාලිකා ප්‍රවර්ධනය සහ රූපවාහිනී වැඩසටහන් ප්‍රචාරය සඳහා ප්‍රචාරක හා මාධ්‍ය ඒකකය මඟින් මුද්‍රිත මාධ්‍ය ඔස්සේ ප්‍රචාරක කටයුතු දියත් කෙරිණි. මේ සඳහා පහත සඳහන් ආයතන සමග පැවති ප්‍රති වෙළඳ ගිවිසුම් යටතේ දැන්වීම් පළ කරනු ලැබීය.

- ලේක් හවුස් ආයතනය
- උපාලි පුවත්පත් සමාගම
- සුමති පුවත්පත් සමාගම

වර්ෂය පුරා විධිමත් සැලසුමක් යටතේ අලෙවි ප්‍රවර්ධනය හා ප්‍රේක්ෂක වර්ධනය සඳහා මෙම ප්‍රචාරක දැන්වීම් සිංහල, ඉංග්‍රීසි හා දෙමළ යන මාධ්‍යවලින් පළ කෙරිණි.

ලොතරැයි වැඩසටහන්, සේවාදායක ප්‍රවර්ධන වැඩසටහන් නිෂ්පාදනය හා ඒ ඒ වැඩසටහන්වලට අදාළ පූර්ව ප්‍රචාරක පට සැකසීම අලෙවි වැඩසටහන් නිෂ්පාදන ඒකකය මඟින් සිදුකෙරේ. තවද දිනපතා ලොතරැයි දිනුම් ඇදීමේ නිෂ්පාදන කටයුතු සිදුවන අතර වසරකට දිනුම් ඇදීමේ වැඩසටහන් 1508 ක් නිෂ්පාදනය කර ඇත.

# පරිපාලන අංශය

සංස්ථාවේ සියලුම පරිපාලන කටයුතු සභාපති සහ අධ්‍යක්ෂ ජනරාල්ගේ අධීක්ෂණය යටතේ පරිපාලන අංශය මගින් සිදු කරනු ලබයි. පරිපාලන අංශය අධ්‍යක්ෂ (පරිපාලන ) යටතේ පාලනය වේ.

**පරිපාලන අංශය යටතේ ඇති ඒකක**

1. පරිපාලන ඒකකය
2. මහජන සම්බන්ධතා හා පිළිගැනීමේ ඒකකය
3. ලේඛනාගාරය
4. ප්‍රවාහන ඒකකය
5. ආරක්ෂක ඒකකය
6. පර්යේෂණ හා පුහුණු ඒකකය - සභාපති සහ අධ්‍යක්ෂ ජනරාල්ගේ අධීක්ෂණය යටතේ
7. නීති හා පරිපාලන ඒකකය
8. සිවිල් ඉංජිනේරු ඒකකය
9. අභ්‍යන්තර විගණන ඒකකය - සභාපතිතුමාගේ සෘජු අධීක්ෂණය යටතේ

**පරිපාලන ඒකකය සිදු කරන කාර්යයන්**

1. සංස්ථාවේ සියලුම නිලධාරීන්ගේ පෞද්ගලික ලිපිගොනු පවත්වාගෙන යාම.
2. සංස්ථා කාර්ය මණ්ඩලය සඳහා නව නිලධාරීන් බඳවා ගැනීම.
3. සංස්ථා නිලධාරීන්ගේ උසස්වීම්, වාර්ෂික වැටුප් වැඩිවීම සහ ස්ථාන මාරුවීම් ලබාදීම.
4. ජනමාධ්‍ය අමාත්‍යාංශය ඇතුළු බාහිර ආයතන විසින් ඉල්ලුම් කරනු ලබන තොරතුරු හා වාර්තා ලබා දීම.
5. සංස්ථාවේ සියලුම උත්සව සංවිධානය කිරීම.

6. සංස්ථාවේ නිලධාරීන්ගේ විනය පාලනය සම්බන්ධ රාජකාරි සිදු කිරීම.

7. විදේශීය පුහුණු පාඨමාලා , සම්මන්ත්‍රණ, සමුළු, රැස්වීම්, අධ්‍යාපන චාරිකා, වැඩමුළු, ආවරණ කටයුතු සඳහා නිලධාරීන් යොමු කිරීම සම්බන්ධ රාජකාරි කටයුතු කිරීම.

8. සංස්ථාවේ සියලුම නිලධාරීන්ගේ නිවාඩු , හදිසි අනතුරු නිවාඩු , ප්‍රසූත නිවාඩු, විශේෂ හා රාජකාරි නිවාඩු, රටින් බැහැර පෞද්ගලික හා රාජකාරි නිවාඩු සම්බන්ධ රාජකාරි සිදු කිරීම.

9. සංස්ථා නිලධාරීන්ගේ සුභ සාධනය සඳහා වෛද්‍ය රක්ෂණ පහසුකම්, ණය පහසුකම් ලබාදීම ඇතුළු අනෙකුත් සුභසාධන කටයුතු සිදු කිරීම.

10. සංස්ථා නිලධාරීන්ගේ සේවක අර්ථසාධක අරමුදල හා සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල් සම්බන්ධ රාජකාරි කටයුතු සිදු කිරීම.

11. නිල හැඳුනුම්පත් , නිල ඇඳුම් ලබාදීම සම්බන්ධ රාජකාරි කටයුතු කිරීම.

12. සංස්ථාවේ විවිධ අංශවලට අවශ්‍ය පානීය ජලය සහ පුවත්පත්3
ගෙන්වීම හා බෙදාහැරීම.

13. සංස්ථා දුරකථන හා තැපැල් සම්බන්ධ රාජකාරි කටයුතු කිරීම.

<u>**2014 වර්ෂය අවසානයේ සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු**</u>

| **සේවා පදනම** | **සේවක සංඛ්‍යාව** |
|---|---|
| ස්ථිර කාර්ය මණ්ඩලය | 935 |
| කොන්ත්‍රාත් කාර්ය මණ්ඩලය | 49 |
| සේවා පැවරුම් කාර්ය මණ්ඩලය | 14 |
| **මුළු කාර්ය මණ්ඩලය** | **998** |
| අනුමත කාර්ය මණ්ඩලය | 985 |

**2014 වර්ෂයේ නව බඳවා ගැනීම්**

| | |
|---|---|
| ස්ථිර පදනම මත | 29 |
| කොන්ත්‍රාත් පදනම මත | 27 |
| සේවා පැවරුම් පදනම මත | 17 |
| **මුළු බඳවා ගැනීම්** | **73** |

**2014 වර්ෂයේ විශ්‍රාම යාම සම්බන්ධ තොරතුරු**

| | |
|---|---|
| 2014 වර්ෂයේ විශ්‍රාම ලැබූ නිලධාරීන් සංඛ්‍යාව | 06 |

**රක්ෂණ ප්‍රතිලාභ**

2014 වසරේ ජනවාරි 01 දින සිට දෙසැම්බර් 31 දින දක්වා කාලය සඳහා සංස්ථාව ගිවිසගත් වෛද්‍ය රක්ෂණාවරණය, ගිනි රක්ෂණය හා සියලු අවදානම් රක්ෂණ ක්‍රම ක්‍රියාත්මක කෙරිණි.

එ මගින්;

- රෝහල් හා සැත්කම් රක්ෂණ ආවරණය( නේවාසික රෝහල් බිල්පත්, ඇස්කණ්නාඩි බිල්පත්)
- අසාධ්‍ය රෝග රක්ෂණය
- හදිසි අනතුරු රක්ෂණය
- ගිණි රක්ෂණය හා සියලු අවදානම් රක්ෂණ

යන ක්ෂේත්‍ර ආවරණය වේ.

**2014 වර්ෂයේ මෙම සංස්ථාවේ නිලධාරීන් සහභාගි වූ විදේශ නිල සංචාර**

| **විදේශ ගමන් අවස්ථා** | **සහභාගි වූ නිලධාරීන් සංඛ්‍යාව** |
|---|---|
| පුහුණු පාඨමාලා | 22 |
| රැස්වීම් හා සම්මන්ත්‍රණ | 23 |
| රාජ්‍ය නායක නිල සංචාර සහ ආවරණ කටයුතු | 68 |

**<u>2014 වර්ෂයේ සිදු කරන ලද විශේෂ ව්‍යාපෘති</u>**

- ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථා නිලධාරීන්ගේ කාර්ය සාධනය ඇගයීම සඳහා නව කාර්යඵල ඇගයීමේ ක්‍රියා පටිපාටියක් සකස් කිරීම.
- උත්සව සංවත්සරික කටයුතු
- 2014 වර්ෂයේ යෙදුනු රූපවාහිනී 32 වන සංවත්සරය වෙනුවෙන් පැවැත්වුණු පිරිත් පිංකම සහ දානමය පිංකම පෙබරවාරි මස 14 සහ 15 සිදු කිරීම.
- වසර 20ක සේවා කාලයක් සම්පූර්ණ කල සංස්ථා නිලධාරීන් සඳහා රන් තිළිණ ප්‍රදානය.
- රූපවාහිනී සංස්ථා නිලධාරීන්ගේ සහභාගිත්වයෙන් වාර්ෂික අලුත් අවුරුදු උත්සවය ක්‍රීඩා සංගමය හා එක්ව සංවිධානය කිරීම.

## මහජන සම්බන්ධතා සහ පිළිගැනීමේ ඒකකය

2014 වර්ෂයේ මහජන සම්බන්ධතා ඒකකයෙන් ඉටුකරන ලද රාජකාරි

1. පාසල් ළමුන් හා වෙනත් ආයතනවලට අයත් පුද්ගලයන් 75,000 කට පමණ ආයතනය පිළිබඳව හා එහි ක්‍රියාකාරිත්වය පිළිබඳව අධ්‍යාපනිකව කරුණු කියාදෙමින් ආයතනය නැරඹීමට අවශ්‍ය පහසුකම් සලසා දීම.

2. සංස්ථා නිලධාරීන්ට පහසු මිළට භාණ්ඩ හා සේවා ලබා ගැනීම සඳහා අවශ්‍ය පහසුකම් සහිතව සුභසාධන පොල පැවැත්වීම.

3. සංස්ථා නිලධාරීන්ගේ සෞඛ්‍ය තත්වය නංවාලීමට සෞඛ්‍ය කඳවුරු පැවැත්වීම.

4. සංස්ථාවෙන් සේවා ලබා ගැනීමට පැමිණෙන බාහිර පුද්ගලයන්ට අවශ්‍ය කටයුතු පහසුවෙන් කරගැනීමට සහය වීම.

5. සංචාරක නිවාස පිහිටවීමට ඉඩම් ලබා ගැනිමට කටයුතු කිරීම.

## ප්‍රවාහන ඒකකය

ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ දෛනික ප්‍රවාහන රාජකාරි වන ප්‍රවෘත්ති පටිගත කිරීම, වැඩසටහන් පටිගත කිරීම්, ඉසව් සමීක්ෂණ කටයුතු සහ කොළඹින් බැහැරව ඇති ප්‍රතිවිකාශන මධ්‍යස්ථානයන්හි අවශ්‍යතා මත ප්‍රවාහන පහසුකම් සැපයීම සහ සංස්ථාවේ අනෙකුත් රාජකාරි සඳහා ප්‍රවාහන පහසුකම් සැපයීම මෙම ඒකකයේ ප්‍රධාන කාර්ය වේ.

ප්‍රවාහන නිලධාරීන් දෙදෙනෙකුගේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වූ මෙම ඒකකයේ කාර්ය මණ්ඩලය 64 කි. රූපවාහිනී සංස්ථාවට අයත් වාහන 43 ක් සහ කුලී පදනම මත ලබාගත් වාහන 13ක් උපයෝගි කර ගනිමින් ඉහත අවශ්‍යතාව සපුරා දීමට කටයුතු කර තිබේ. ඒ අනුව යථෝක්ත වර්ෂය තුළ වාහන ධාවනය කර ඇති දුර ප්‍රමාණය කි.මී 1,736,674 ක් වූ අතර ඉන් කි.මී1,314,880 ක් සංස්ථා වාහනවලින්ද කි.මී 421,794ක පුද්ගලික වාහනවලින්ද ධාවනය කර තිබේ. මෙය පසුගිය වසරේ ධාවනය කර ඇති කි.මී සංඛ්‍යාව හා සසඳා බැලීමේදී කි.මී 106,485 ක වැඩි වීමකි.

සංස්ථා වාහන 43 ක් වසරක ධාවනය සඳහා ඉන්ධන වියදම ලෙස රු 17,478,323/= ක් සහ කුලී පදනම මත ලබාගත් වාහන 13ක් සඳහා කුලිය ලෙස රු 16,702,274.52 /= ක මුදලක් වැයවී ඇත.

සංස්ථා වාහනවල අළුත්වැඩියා කටයුතුවලින් 80% ක ප්‍රමාණයක් සංස්ථා ගරාජය තුළ ඉටු කිරීමෙන් වඩාත් විශ්වාසදායක නඩත්තු සේවාවක් සහ මුදල් ඉතිරියක් ලබා ගැනීමටද හැකි වී තිබේ.

**සේවයෙන් ඉවත්වීම් හා බඳවා ගැනීම්**

කොන්ත්‍රාත් පදනම මත සේවය කළ එක් රියදුරෙකුගේ සේවය අවසන් කර ඇති අතර සේවා පැවරුම හා කොන්ත්‍රාත් පදනම මත නව රියදුරන් පස්දෙනෙකු බඳවාගෙන ඇත.

## ආරක්ෂක ඒකකය

පුද්ගලික ආරක්ෂක අංශයේ සහ සංස්ථා නිලධාරීන්ගේ සේවාව ලබා ගනිමින් දවසේ පැය 24 පුරා සංස්ථා කාර්ය මණ්ඩලය සහ ආයතන දේපල ආරක්ෂා කිරීම සහ ආයතනයේ විනය පවත්වාගෙන යාම ආරක්ෂක ඒකකයේ කාර්ය භාරය වේ.

ප්‍රධාන ආරක්ෂක නිලධාරී ඇතුළුව 8 දෙනෙකුගෙන් සමන්විත ආයතනිත නිලධාරීන් කණ්ඩායමකගෙන් සහ රක්නා ලංකා ආරක්ෂක සමාගමෙන් සේවය ලබා ගන්නා අතර දිවා සේවය සඳහා ආරක්ෂක නිලධාරීන් 11කු සහ කාන්තා ආරක්ෂක නිලධාරීන් 3 කු සේවය කරන අතර රාත්‍රී සේවය සඳහා ආරක්ෂක නිලධාරීහු 10 දෙනෙක් සිටිති.

## නීති පරිපාලන ඒකකය

නීති පරිපාලන ඒකකය පරිපාලන අංශයට අයත් කුඩා ඒකකයක් වන අතර එය නිලධාරීන් 5 දෙනෙකුගෙන් සමන්විතය.

සංස්ථාව වෙනුවෙන් ශ්‍රේෂ්ඨාධිකරණය, අභියාචනාධිකරණය, මහාධිකරණය, දිසා අධිකරණය සහ මහේස්ත්‍රාත් අධිකරණය ඉදිරියේ පෙනී සිටීම හා අවශ්‍ය අවස්ථාවලදී ඒ සඳහා ජ්‍යෙෂ්ඨ නීතිඥ මහතුන් සම්බන්ධ කර ගැනීම. කම්කරු අධිකරණය, කම්කරු කොමසාරිස්, මානව හිමිකම් කොමිසන් සභාව, ඔම්බුඩ්ස්මන් ඉදිරියේ සංස්ථාව වෙනුවෙන් පෙනී සිටීම, ඉහල කළමනාකාරිත්වයට අවශ්‍ය නීති උපදෙස් ලබාදීම හා ඊට අමතරව සංස්ථාවට ඇතුළත් වන සංස්ථා සේවකයන් හා බාහිර සේවාදායකයන් සමඟ ගිවිසුම් සකස් කිරීමත් ඒ හා සම්බන්ධ සියළුම කටයුතු සිදුකිරීමත් සංස්ථාවට අයවිය යුතු ණය අයකර ගැනීම වෙනුවෙන් එන්තරවාසි යැවීමත් නීති පරිපාලන ඒකකය මගින් සිදු කරනු ලබයි.

සංස්ථාවට අයවිය යුතු රු 1,058,657.50 ක මුදලක් වෙනුවෙන් ආයතන හතරකට (04) එරෙහිව අධිකරණයේ නඩු පවරන ලද අතර තවත් ආයතන දහයකට (10) එරෙහිව එන්තරවාසි යැවීම, පොළිස් පැමිණිලි සිදු කිරීම 2014වසරේදී නීති පරිපාලන ඒකකය මගින් සිදුවිය.

<u>නඩු පැවරීමෙන් හා නීතිමය පියවර ගැනීමෙන් ලැබූ ප්‍රගති</u>

- 2004.02.29 වන දින රාත්‍රී “විසංවාදය” නැමැති වැඩසටහනේදී විමල් වීරවංශ මහතා කළ ප්‍රකාශයකින් තමාට අපහාස වූයේ යැයි පවසමින් රුපියල් මිලියන 75ක වන්දි මුදලක් ඉල්ලා මේජර් ජෙනරාල් වසන්ත පෙරේරා මහතා විසින් සංස්ථාවට එරෙහිව පවරන ලද නඩු අංක 46636/MR//2004 දරණ නඩුවේදී සංස්ථාවේ වාසියට තීන්දු ප්‍රකාශයක් ලබා ගැනීමට සමත් විය. එනම් එම වැඩසටහන මගින් ඔහුට අපහාසයක් නොවූ බව තීරණය විය.
- CTV ආයතනය වෙතින් සංස්ථාවට අයවීමට තිබූ රුපියල් 7,678,643.74 ක මුදල අයකර ගැනීම වෙනුවෙන් 2011 වර්ෂයේ පවරා තිබූ නඩු 07 ක් සම්බන්ධයෙන් සංස්ථාවේ වාසියට තීන්දු ප්‍රකාශ ලබා ගන්නා ලදී.
- තවද චම්පික විජේසූරිය මහතාගෙන් සංස්ථාවට අය වීමට තිබූ රු 105,106.56 ක මුදල අයකර ගැනීම පිණිස DMR/698/2011 දරණ නඩුව පවරා තිබුණි. ඒ අනුව මෙම වසරේදී එම මුදල් සංස්ථාවට අය කර ගැනීමෙන් පසුව එම නඩුව අවසන් කිරීමට හැකි විය.

මීට අමතරව සේවා දායක ණයගැතියන්ට එරෙහිව නඩු පැවරීම, එන්තරවාසි යැවීම සහ පොලිස් පැමිණිලි සිදු කිරීම වැනි නීතිමය ක්‍රියාමාර්ග ගැනීම මගින් 2014 වර්ෂය තුළදී රු 5,753,749.60 ක මුදලක් අයකර ගැනීමට හැකිවීම වැදගත් කරුණකි.

## අභ්‍යන්තර විගණන ඒකකය

සංස්ථා සභාපති / අධ්‍යක්ෂ ජනරාල්ගේ ඍජු අධීක්ෂණය යටතේ අභ්‍යන්තර විගණන ඒකකය ක්‍රියාත්මක වේ. ගිණුම් හා අභ්‍යන්තර පාලන ක්‍රම සමාලෝචනය කිරීමත්, ඒවායේ ක්‍රියාකාරීත්වය, මෙහෙයවීම් පිළිබඳ දෝෂ සහගත තත්වයන් පිළිබඳව අදාල අංශ ප්‍රධානීන් වෙත අභ්‍යන්තර විගණන විමසුම් යොමු කිරීමත්, තවදුරටත් අවශ්‍ය අවස්ථා වලදී වැඩි දියුණු කිරීම් හා පවතින තත්වයන් පිළිබඳව ඉහළ කළමනාකාරීත්වය වෙත වාර්තා කිරීමත් අභ්‍යන්තර විගණන ඒකකයේ ප්‍රධාන කාර්යභාරය වේ.

2014 වර්ෂය සඳහා පිළියෙල කරන ලද හා සංස්ථා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අභ්‍යන්තර විගණන වැඩසටහන, පවත්නා මානව හා භෞතික සම්පත් ප්‍රයෝජනයට ගනිමින් පවත්නා කාල වේලාවන් අනුව පූර්ණ වශයෙන් හා නියදි වශයෙන් පරීක්ෂාකර පාලනාධිකාරය වෙත වාර්තා කර ඇත.

ඒ අනුව සංස්ථාවේ ප්‍රධාන අංශ කිහිපයකින් ආවරණය වන පරිදි විගණන විමසුම් නවයක් (09) විගණන වාර්තා දාහතරක් (14) හා වෙනත් වාර්තා පහළොවක් (15) පමණ ඉදිරි පත් කොට ඇති අතර 2014 වර්ෂය තුළ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් හතරක් (04) පවත්වා ඇත.

## පර්යේෂණ හා පුහුණු ඒකකය

දෛනික වැඩසටහන් පිළිබඳ ප්‍රේක්ෂක ප්‍රතිචාර හා තරගකාරි නාලිකාවන්හි හැසිරීම පිළිබඳ පර්යේෂණ දත්ත ලංකා මාර්කට් රිසර්ච් බියුරෝ (LMRB) වෙතින් ලබා ගැනීම සිදු කෙරිණි. 2014 වසරේ මෙම තොරතුරු ලබා ගැනීම සිදු නොවුණි.

නමුත් ආයතන විධායක නිලධාරීන්ගේ සහායෙන් රූපවාහිනිය හා තරගකාරී නාලිකාවන්ගේ වැඩසටහන් පිළිබඳව සංසන්දනාත්මකව ඇගයුමක් සිදු කෙරිණි. මෙම සමීක්ෂණයේදී අඛණ්ඩව සති තුනක් වැඩසටහන් නැරඹීම් සිදු කරන ලදී.

විකාශයේදී සිදුවන දෝෂ අවම කරගැනීම හා විකාශය සඳහා සුදුසු නුසුදුසු වැඩසටහන් හඳුනා ගැනීම මෙහි අරමුණ විය.

මේ අතර 2014 දැයට කිරුළ ප්‍රදර්ශන භූමිය පාදක කර ගනිමින් ද සමීක්ෂණයක් සිදුකෙරිණි. මෙමගින් ද ප්‍රේක්ෂක ප්‍රතිචාර පිළිබඳ විමසුමක් සිදුකෙරිණි. පුද්ගලයන් 1000 කගේ අදහස් මෙහිදී සැලකිල්ලට ගැනින.

රූපවාහිනී මාධ්‍ය භාවිතයේදී ප්‍රේක්ෂක ප්‍රතිචාර සොයා බැලීම අත්‍යවශ්‍ය වේ. විවිධ නාලිකා වටා රැස්ව ඇති ප්‍රෙක්ෂක සංඛ්‍යාව වැඩසටහන් පෙළ ගැස්ම සඳහාත් නිර්මාණකරණය සඳහාත් වැදගත් වේ. එම සමීක්ෂණ දත්ත විශ්ලේෂණය කර කළමනාකාරිත්වය සහ නිෂ්පාදන කාර්ය මණ්ඩලය දැනුවත් කිරීම මෙම ඒකකයෙන් සිදු කරනු ලබයි.

<u>පර්යේෂණ කටයුතු</u>

වැඩසටහන් විකාශය වූ ගුවන් කාල විශ්ලේෂණය කිරීමද මෙම ඒකකයෙන් සිදු කරන තවත් කාර්යයකි. ජාතික නාලිකාව සහ අයි නාලිකාවන්හි විකාශිත වැඩසටහන් වර්ගීකරණය කර ගුවන් කාලය වෙළඳ හා අනුග්‍රාහක වැඩසටහන් ලෙස වෙන් වෙන් වශයෙන් ගණනය කරනු ලැබේ.

<u>පුහුණු කටයුතු</u>

ආයතනයේ මානව සම්පත් සංවර්ධනයට සහ තාක්ෂණික ප්‍රගමනයට අවශ්‍ය දැනුම හා පුහුණුව ලබාදීම සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම පර්යේෂණ හා පුහුණු ඒකකයෙන් අඛණ්ඩව සිදු කරනු ලබයි. 2014 වර්ෂයේදී සංවිධානය කරන ලද පුහුණු වැඩසටහන් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| පුහුණු වැඩසටහන් | වැඩසටහන් සංඛ්‍යාව | සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|---|
| දේශීය - පුහුණු වැඩසටහන් | 07 | 143 |
| දේශීය - බාහිර පුහුණු වැඩසටහන් | 12 | 16 |
| විදේශීය පුහුණු ආයතන සමඟ එක්ව සිදු කළ පුහුණු වැඩසටහන් | 02 | 22 |
| බාහිර ආයතන සඳහා පැවැත්වූ පුහුණු වැඩසටහන් | 03 | 37 |
| විශ්ව විද්‍යාල හා කාර්මික විද්‍යාල වල සිසුන් සඳහා ලබාදුන් පුහුණු අවස්ථා | - | 52 |

## ගුවන් කාල විශ්ලේෂණය

2014 වර්ෂයේ ජාතික නාලිකාවේ සමස්ත ගුවන් කාලය පැය 7443.5 කි. ඉන් පැය 6246.4 ක් වැඩසටහන් සඳහා වෙන් වූ අතර, වෙළඳ දැන්වීම් සඳහා වෙන් වූ කාලය පැය 1197.1කි. අයි නාලිකාවේ මුළු ගුවන් කාලය පැය 5732.4 ක් වූ අතර ඉන් පැය 5371.8 ක් වැඩසටහන් සඳහා වෙන් කෙරිණි. වෙළඳ දැන්වීම් සඳහා වූ කාලය පැය 360.6 කි.

2014 වර්ෂයේ වැඩසටහන් ගුවන් කාලය පහත දැක්වෙන පරිදි වර්ගීකරණය කර දැක්විය හැකිය.

## වැඩසටහන් ගුවන් කාල විශ්ලේෂණය - 2014

| වැඩසටහන් වර්ගීකරණය | ජාතික නාලිකාව | | අයි නාලිකාව | |
|---|---|---|---|---|
| | පැය | % | පැය | % |
| **තොරතුරුමය වැඩසටහන්** | | | | |
| ප්‍රවෘත්ති | 698.9 | 11.2 | 393.7 | 7.4 |
| දේශපාලන | 157.2 | 2.5 | - | - |
| ආර්ථික | 100.7 | 1.6 | - | - |
| සාමාජීය | 545.2 | 8.7 | 308.7 | 5.8 |
| ආයුබෝවන් | 120 | 1.9 | 241 | 4.5 |
| | **1622** | **25.9** | **943.4** | **17.7** |
| **අධ්‍යාපනික වැඩසටහන්** | | | | |
| අධ්‍යාපනික | 529.2 | 8.5 | 161.2 | 3 |
| වාර්තාමය | 212.6 | 3.4 | 62 | 1.2 |
| කෘෂිකාර්මික | 49.8 | 0.8 | - | - |
| ප්‍රශ්න විචාරාත්මක | 20.6 | 0.3 | - | - |
| සඟරාමය | 134 | 2.1 | 417.6 | 7.5 |
| භාෂාව | 19.7 | 0.3 | - | - |
| | **965.9** | **15.4** | **640.8** | **11.7** |
| **ළමා වැඩසටහන්** | | | | |
| ළමා | 222.3 | 3.6 | 73.4 | 1.4 |
| කාටූන් | 39.5 | 0.6 | 77.6 | 1.5 |
| | **261.8** | **4.2** | **151** | **2.9** |
| කාන්තා වැඩසටහන් | 594.1 | 9.5 | 26.5 | 0.4 |

| | | | | |
|---|---|---|---|---|
| **සංස්කෘතික හා ආගමික වැඩසටහන්** | | | | |
| සංස්කෘතික | 59.5 | 1 | 40.9 | 0.8 |
| ආගමික | 418.9 | 6.7 | 160.8 | 3 |
| | **478.4** | **7.7** | **201.7** | **3.8** |
| **විනෝදාත්මක වැඩසටහන්** | | | | |
| නාට්‍ය | 748.6 | 12 | 587.9 | 10.9 |
| මාලා චිත්‍රපට | 115 | 1.8 | - | - |
| චිත්‍රපට | 253.8 | 4.1 | 974 | 18.2 |
| සංගීත | 703.4 | 11.3 | 299.6 | 5.6 |
| විවිධ | 115.9 | 1.9 | 887 | 16.5 |
| | **2415.1** | **38.8** | **2748.5** | **51.2** |
| ක්‍රීඩා වැඩසටහන් | 183.7 | 2.9 | 449.4 | 8.5 |
| ප්‍රචාරාත්මක වැඩසටහන් | 178.5 | 2.9 | 192.8 | 3.6 |
| අනෙකුත් වැඩසටහන් | 25.3 | 0.4 | 17.7 | 0.3 |
| එකතුව | **6246.4** | **100** | **5371.8** | **100** |

## වෙළඳ ගුවන් කාලය - 2014

| වැඩසටහන් වර්ගීකරණය | ජාතික නාලිකාව | | අයි නාලිකාව | |
|---|---|---|---|---|
| | පැය | % | පැය | % |
| මිල ගෙවූ අනුග්‍රාහක වෙළඳ දැන්වීම් | 1172.8 | 98 | 350 | 97 |
| නොමිලේ විකාශිත දැන්වීම් | 24.3 | 2 | 10.6 | 3 |
| එකතුව | **1197.1** | **100** | **360.6** | **100** |

### අනුග්‍රාහක දායකත්වය

ජාතික නාලිකාවේ වැඩසටහන් ගුවන් කාලයෙන් 47.7% (පැය 2981.6) ක් හා අයි නාලිකාවේ වැඩසටහන් ගුවන් කාලයෙන් 21.5% (පැය1143.1) ක් සඳහා අනුග්‍රාහක දායකත්වය තිබේ.

| වැඩසටහන් වර්ගීකරණය | ජාතික නාලිකාව | | අයි නාලිකාව | |
|---|---|---|---|---|
| | පැය | % | පැය | % |
| අනුග්‍රාහක දායකත්වය සහිත | 2981.6 | 47.7 | 1143.1 | 21.5 |
| අනුග්‍රාහක දායකත්වය රහිත | 3264.8 | 52.3 | 4228.7 | 78.5 |
| එකතුව | **6246.4** | **100.0** | **5731.8** | **100** |

### භාෂාව අනුව වැඩසටහන් ගුවන් කාලය

| භාෂාව | ජාතික නාලිකාව | | අයි නාලිකාව | |
|---|---|---|---|---|
| | පැය | % | පැය | % |
| සිංහල | 5686.0 | 91.0 | 271.4 | 5.1 |
| දෙමළ | - | - | 3879.2 | 72.2 |
| ඉංග්‍රීසි | 508.2 | 8.1 | 1120.6 | 20.8 |
| වෙනත් | 52.2 | 0.8 | 100.6 | 1.9 |
| එකතුව | **6246.4** | **100** | **5371.8** | **100** |

### ජාත්‍යන්තර සබඳතා ඒකකය

සංස්ථාවේ විවිධ ඒකකවල සේවයේ නියුතු නිෂ්පාදකවරුන්ගේ වැඩසටහන් අන්තර්ජාතික තරඟ හා උත්සව සඳහා ඉදිරිපත් කිරීම, ශිෂ්‍යත්ව සඳහා සහභාගි කර වීම, විදේශ තානාපති කාර්යාල සම්බන්ධීකරණය, මෙමගින් සිදු කෙරේ.

මලයාසියාවේ AIBD ආයතනය මගින් සංවිධානය කරනු ලැබූ වර්ල්ඩ් ටීවී අවෝර්ඩ්ස් (World TV Award 2014 ) ප්‍රංශයේ යූ.ආර්.ටී.අයි "ග්‍රෑන්ඩ් ෆික්ස් ඕතර්ස් ඩොකියුමන්ට්‍රි" (URTI Grand Prix

Author’s Documentry) ජාත්‍යන්තර වාර්තා වැඩසටහන් තරගය , මලයාසියාවේ ඒ.බී.යූ ප්‍රයිස් (ABU Prize 2014), කොරියාවේ සෝල් නුවර පැවති “ සෝල් ඩ්‍රාමා අවෝර්ඩ්ස් 2014 ” (Seoul Drama Awards – 2014 ), ජපානයේ NHK ආයතනය මඟින් සංවිධානය කරන ලද “ජැපැන් ප්‍රයිස් 2014 ”(Japan Prize 2014) තරඟය ආදිය සඳහා මේ වසරේදීත් රූපවාහිනී වැඩසටහන් ඉදිරිපත් කරන ලදී.

2014 වසරේදී ද ඔස්ට්‍රියාවේ වියානා නුවර සිට සජීව විකාශය කරන ලද ලෝ පසිදු “ VIENNA Phitharmonic New Year Concert ” චන්ද්‍රිකා තාක්ෂණය ඔස්සේ නොමිලයේ ලබාගත් අතර එය සජීව පටිගත කොට පසුව විකාශය කරන ලදී. චීන තානාපති කාර්යාලයේ අනුග්‍රහයෙන් චීනයේ “ චයිනා මූවි චැනල් ”(China Movie Channel ) මගින් නිෂ්පාදනය කරන ලද සම්මානනීය චීන චිත්‍රපට 25 ක් නොමිලේ ලබා ගන්නා ලදී. වියට්නාම තානාපති කාර්යාලයේ අනුග්‍රහයෙන් “ග්‍රෑන්ඩ් මම් ඩසන්ට් ඊට් පීසා” (Grand Mom doesn’t Eat Pizza) කථාංග 26 කින් යුතු ටෙලිනාට්‍ය මාලාවක් හා චීන වාර්තා වැඩසටහන් රාශියක් ද ලබා ගන්නා ලදී.

මෙම වසර තුළ රූපවාහිනී සංස්ථාව ජාතික නාලිකාව ලෙස ජාත්‍යන්තර නාලිකා සමඟ ඉහළ මට්ටමකින් සාර්ථක ලෙස සම්බන්ධීකරණය කිරීමට රූපවාහිනී සංස්ථා ජාත්‍යන්තර සබඳතා ඒකකය සමත් විය.

## ලේඛනාගාරය

1. සංස්ථාවේ සියලු අංශ හා ඒකක වලට අයත් ලිපිගොනු භාර ගැනීම.
2. එම ලේඛන ලේඛනගත කර සංස්ථා ලේඛනාගාරය තුළ ගබඩා කර සංරක්ෂණය කිරීම.
3. ලේඛන අපහරණය සම්බන්ධයෙන් රටේ පවතින නීති රීතිවලට යටත්ව අපහරණ ලැයිස්තු සැකසීම.
4. ආයතන ප්‍රධානියාගේ අනුමැතිය ඇතිව අදාල ලේඛන විධිමත්ව අපහරණය කිරීම
5. නෛතිකමය හෝ පරිපාලනමය අවශ්‍යතා සඳහා අවශ්‍ය ලිපිගොනු නැවත නිකුත් කිරීම.

ඉහත පරිදි කටයුතු කරමින් සංස්ථා ලේඛනාගාරය 2014 වසර තුළද සංස්ථාවේ පරිපාලන කටයුතු කරගෙන යාමට අවශ්‍ය සහයෝගය අඛණ්ඩව ලබාදී ඇත.

## මුදල් අංශය

ආදායම්, ගෙවීම්, වැටුප්, පොත් තැබීම්අයකිරීම් සහ පිරිවැය යන ඒකකවලින් මුදල් අංශය සමන්විතයි. මුදල් අංශය යටතේ සැපයුම් අංශය ද කටයුතු කරයි. මුදල් අංශයෙන් සිදු කිරීමට අපේක්ෂිත මූලික කාර්යය වනුයේ සංස්ථාවේ මූල්‍ය කළමනාකරණය සහ මූල්‍ය වාර්තාකරණයයි.

2014 වර්ෂය තුළ මුදල් අංශයෙහි සෑම ඒකකයක් ම කාර්යක්ෂමව, ඵලදායීව සහ ආර්ථිකමය වශයෙන් උපරිම ප්‍රතිලාභයක් සංස්ථාවට ලැබෙන අයුරින් වගකීමෙන් යුතුව ක්‍රියා කර ඇත. මෙම අංශය සිදු කරන සියලු මූල්‍ය ගනුදෙනු ඉතා අවංකව, විනිවිදභාවයකින් හා ඉලක්කගතව සිදු කර ඇත. සියලු වැඩසටහන් ලිපිගොනු සඳහා නීතිරීතිවලට අනුකූලව, නිෂ්පාදන සහ ප්‍රචාරණ ක්‍රියාවලියට බාධාවක් නොවන පරිදි ගෙවීම් කටයුතු සිදු කර ඇත. වැඩසටහන් අවසන් වූ පසුව ද එම ලිපිගොනු සම්බන්ධයෙන් සොයා බලා බාහිර පාර්ශව වෙත නියමිත වේලාවට අදාළ ගෙවීම් සිදු කර ඇත.

සේවක වැටුප් සහ සියලු අනෙකුත් සේවක ප්‍රතිලාභ කිසිදු ප්‍රමාදයකින් තොරව ගෙවා ඇති අතර වැටුපෙන් අඩු කර වෙනත් ආයතන සඳහා ගෙවිය යුතු වූ ව්‍යවස්ථාපිත ගෙවීම් නියමිත දිනට හෝ ඊට පෙර ගෙවා ඇත.

ප්‍රධාන ආදායම් මූලාශ්‍රය වන ගුවන් කාල විකුණුම් සහ අනෙකුත් ආදායම් යෝග්‍ය ගිණුම්කරණ මූලධර්මයන්ට හා ප්‍රමිතීන්ට අනුකූලව වාර්තා කර ඇත.

සංස්ථාවේ වැඩසටහන් නිෂ්පාදනය, මෙහෙයවීම හා විකාශනය (ප්‍රධාන නාලිකාව වන රූපවාහිනිය, අයි නාලිකාව/ නේත්‍රා සහ එන්ටීවී) සඳහා සහාය වන සියලු මිල දී ගැනීම් (ප්‍රාග්ධන හා ප්‍රාග්ධන නොවන භාණ්ඩ හා සේවා) සම්බන්ධයෙන් ක්‍රියා කිරීමට මුදල් අංශය යටතේ ඇති සැපයුම් අංශය වගකීමෙන් යුක්තව 2014 වර්ෂයේදී ද කටයුතු කර ඇත.

ගිණුම්කරණ මූලධර්මයන්ට හා ප්‍රමිතීන්ට අනුකූලව සකස් කරන ලද නිරවද්‍ය සහ කාලීන මූල්‍ය හා කළමනාකරණ වාර්තා අනෙකුත් අංශ සහ සංස්ථා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත විචක්ෂණ හා ප්‍රතිචාරාත්මක තීරණ ගැනීම සඳහා ඉදිරිපත් කර ඇත. මෙම වාර්තා නිතිපතා ඉදිරිපත් කරනු ලබන වාර්තාවලින් සහ විශේෂිත කටයුතු (ad-hoc) සම්බන්ධයෙන් ඉදිරිපත් කරනු ලබන වාර්තාවලින් සමන්විත වේ. සියලු ප්‍රධාන මූල්‍ය තීරණයන් ඇගයීම් කිහිපයකට භාජනය කිරීමෙන් පසු එහි අවසන් ප්‍රතිඵල මත නීත්‍යානුකූලව තීරණ ගෙන ඇත. සංස්ථාව අනෙකුත් රාජ්‍ය ආයතන හා සසඳා බලන විට දිගුකාලීන ණය ලබාගෙන නොමැති අතර කෙටිකාලීන ණය ද ලබාගැනීම ඉතාමත් අවම මට්ටමක පවතී.පවතින ව්‍යාපාරික හා ආර්ථික තත්ත්වයන් හමුවේ මූල්‍ය කළමනාකරණය අභියෝගාත්මක කාර්යයක් වේ. කෙසේ වුවත් සංස්ථාවෙහි මූල්‍ය ස්ථාවරත්වය සහ මූල්‍ය කළමනාකරණය සාර්ථක අයුරින් මෙහෙයවා ඇත.

## අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් පිළිබඳ ප්‍රකාශනය

1971 අංක 38 දරන මුදල් පනත සහ 1982 අංක 06 දරන රූපවාහිනී සංස්ථා පනතෙහි නියමයන්ට අනුකූලව, සෑම මූල්‍ය වර්ෂයක් සඳහාම ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ (මින් පසු "සංස්ථාව"වශයෙන් දක්වා ඇත.) ක්‍රියාකාරකම් පිළිබඳ සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු වන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ අධ්‍යක්ෂවරුන්ගේ වගකීමකි.

සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී උචිත ගිණුම් ප්‍රතිපත්ති හා ප්‍රමිති තෝරා ගෙන, ඒවා ඒකාකාරී ලෙස වර්ෂයක් පුරා උපයෝගී කර ගෙන ඇති අතර සාධාරණ හා විචක්ෂණ විනිශ්චයන් හා ඇස්තමේන්තු ද ඒ සඳහා භාවිත කර ඇති බව අධ්‍යක්ෂවරු තහවුරු කරති. ප්‍රමාණාත්මක බලපෑමක් මූල්‍ය ප්‍රකාශන මත ඇති කරවන යම් ගිණුම් ප්‍රතිපත්තියක හෝ ප්‍රමිතියක බැහැර යාමක් සිදුවී තිබිණි නම් ඒ බව හෙළිදරව් කොට, ඒ පිළිබඳ කරුණු පැහැදිළි කර ඇත.

සංස්ථා මෙහෙයුම් ක්‍රියාකාරිත්ව අඛණ්ඩව කරගෙන යාමට ප්‍රමාණවත් සම්පත් සංස්ථාව සතුව පවතී ද යන්න බැලීමට සංස්ථාවේ අනාගත මූල්‍ය පුරෝකථන, මූල්‍ය ප්‍රවාහ හා වර්තමාන කාර්ය සාධන යන කරුණු අධ්‍යක්ෂවරුන් සමාලෝචනය කර ඇත. අඛණ්ඩ පැවැත්ම යන සංකල්පය මත පිහිටා අධ්‍යක්ෂවරුන් සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇත. 1982 අංක 6 දරන ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථා පනත හා 1971 අංක 38 දරන මුදල් පනතට අනුකූලව සංස්ථාවේ මූල්‍ය තත්ත්වය පිළිබඳව සත්‍ය හා සාධාරණ බවක් පිළිබිඹු කිරීම සඳහා අවශ්‍ය වන පරිදි සංස්ථාව ගිණුම්කරණ වාර්තාව පවත්වා ගෙන ගොස් ඇති බව අධ්‍යක්ෂවරු සහතික වීමෙන් වගකීම භාරගෙන ඇත.

අධ්‍යක්ෂවරු සංස්ථාවේ වත්කම් ආරක්ෂා කිරීමට සහ වංචා හා අක්‍රමිකතා හෙළිදරව් වන හා වැළැක්වීමට උචිත වන ආකාරයට අභ්‍යන්තර පාලන පද්ධති ස්ථාපනය කිරීමට සාධාරණ ආකාරයකින් කටයුතු කර ඇත.

සිය උපරිම දැනීමේ පරිද්දෙන්, සංස්ථාව විසින් ගෙවනු ලැබිය යුතු සියලුම බදු හා ගාස්තු ද, සේවකයන් වෙනුවෙන් හා ඔවුන් සම්බන්ධයෙන් ගෙවිය යුතු සියලුම දායක මුදල්, ගාස්තු බදු සහ ශේෂ පත්‍රයේ දිනය වන විට ගෙවිය යුතුව තිබෙන විශ්‍රාම පාරිතෝෂික ද ඇතුළුව වෙනත් දන්නා සියලු ව්‍යවස්ථාපිත බැරකම් නිසි ලෙස ගෙවා අවසන් කොට හෝ මූල්‍ය ප්‍රකාශ තුළ උචිත ලෙස වෙන් කිරීම් සපයා ඇති බවට ද අධ්‍යක්ෂ මණ්ඩලය තහවුරු කරති.

අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන්
ආචාර්ය සෝමරත්න දිසානායක
සභාපති
ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව

# ශ්‍රී ලංකා රූපවාහිනී
# මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

රු. වලින්

| | සටහන් | 2014 දෙසැම්බර් 31 | 2013 දෙසැම්බර් 31 |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපල,පිරියත හා උපකරණ | 8 | 603,164,095 | 594,638,596 |
| අස්පෘශ්‍ය වත්කම් | 9 | 246,454,534 | 241,728,529 |
| අවශ්‍ය වූ විට අලෙවි කළ හැකි මූල්‍ය වත්කම් (ආයෝජන) | | 1,104,000 | 1,104,000 |
| විලම්බිත ආදායම් බදු වත්කම් | | 21,321,743 | 3,675,375 |
| සුනාමි අරමුදල | | 1,050,703 | 1,037,094 |
| කල්පිරෙන තෙක් තබාගන්නා මූල්‍ය වත්කම් | 10 | 135,814,574 | 215,694,712 |
| | | **1,008,909,649** | **1,057,878,305** |
| **ජංගම වත්කම්** | | | |
| තොග | 11 | 210,256,140 | 207,722,893 |
| වෙළඳ ලැබිය යුතු දෑ | 12 | 492,464,068 | 516,468,453 |
| ණය සහ ලැබිය යුතු දෑ | 13 | 425,257,298 | 440,228,849 |
| අනෙකුත් ලැබිය යුතු දෑ | 14 | 94,577,655 | 134,821,726 |
| ඉදිරියට කළ ගෙවීම් | | 1,500,112 | 1,505,904 |
| මුදල් හා මුදල් සමාන දෑ | 15 | 1,731,079 | 1,928,280 |
| | | **1,225,786,352** | **1,302,676,103** |
| **මුළු වත්කම්** | | **2,234,696,001** | **2,360,554,409** |

| | | | |
|---|---|---|---|
| **ස්කන්ධය හා වගකීම්** | | | |
| **ප්‍රාග්ධනය හා සංචිත** | | | |
| රජයේ ප්‍රාග්ධන දායකත්වය | | 537,742,424 | 537,742,424 |
| සමුච්චිත ලාභ | | 1,049,214,249 | 1,238,641,810 |
| | | **1,586,956,673** | **1,776,384,234** |
| ජංගම නොවන වගකීම් | | | |
| විදේශ ප්‍රදාන | | 90,281,380 | 106,185,045 |
| ගෙවිය යුතු සුනාමි අරමුදල | | 1,050,703 | 1,037,094 |
| නිශ්චිත පාරිතෝෂික සැලැස්ම | 16 | 131,831,313 | 138,621,178 |
| ජංගම නොවන ගෙවිය යුතු මූල්‍ය කල්බදු ප්‍රමාණය | 21.2 | 12,953,126 | 14,482,092 |
| | | **236,116,522** | **260,325,408** |
| **ජංගම වගකීම්** | | | |
| වෙළඳ ගෙවිය යුතු දෑ | 17 | 102,768,557 | 102,321,689 |
| වෙනත් මූල්‍ය වගකීම් | 18 | 154,427,137 | 137,694,185 |
| වෙනත් ගෙවිය යුතු දෑ | 19 | 17,239,505 | 24,788,215 |
| ජංගම වශයෙන් ගෙවිය යුතු මූල්‍ය කල්බදු ප්‍රමාණය | 21.1 | 1,528,966 | 13,260,468 |
| බැංකු අයිරාව | 20 | 135,658,642 | 45,780,210 |
| | | **411,622,807** | **323,844,767** |
| මුළු වගකීම් | | **647,739,328** | **584,170,175** |
| **මුළු ස්කන්ධය හා වගකීම්** | | **2,234,696,001** | **2,360,554,409** |

මෙම මූල්‍ය වාර්තා පිළියෙල කර තිබෙන්නේ ශ්‍රී ලංකා ගණකාධිකාරී ආයතනය මගින් අනුමත කළ ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතීන්ටත්, 1971 අංක 38 දරන මුදල් පනතට හා 1982 අංක 06 දරන ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථා පනතට අනුකූලව බව මුදල් කළමනාකරු විසින් සහතික වෙන ලදී.

ඒ එච් ඊ ආර් පී එදිරිසිංහ
වැඩබලන ප්‍රධාන ගණකාධිකාරී/ නියෝජ්‍ය මුදල් කළමණාකරු
2015 මාර්තු 13

අධ්‍යක්ෂ මණ්ඩලය මූල්‍ය වාර්තා සැකසීම හා ඉදිරිපත් කිරීම පිළිබඳව වගකීම් භාරගෙන ඇත. මෙම මූල්‍ය වාර්තා 2015 මාර්තු 13 වන දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිකුත් කරන ලදී.

ආචාර්ය සෝමරත්න දිසානායක
සභාපති
2015 මාර්තු 13

# ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව
## විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

රු.'000වලින්

| | සටහන් | 2014<br>දෙසැම්බර් 31 | 2013<br>දෙසැම්බර් 31 |
|---|---|---|---|
| (ආදායම්) විකුණුම් ආදායම | 1 | 1,833,677,681 | 1,955,864,447 |
| විකුණුම් පිරිවැය | 3 | (1,391,887,402) | (1,339,603,675) |
| **දළ ලාභය** | | **441,790,279** | **616,260,772** |
| වෙනත් මෙහෙයුම් ආදායම් | 2 | 163,180,910 | 207,692,717 |
| බෙදාහැරීමේ පිරිවැය | 4 | (253,570,463) | (247,400,493) |
| පරිපාලන වියදම් | 5 | (519,046,780) | (515,981,132) |
| **මෙහෙයුම් ලාභය** | | **(167,646,053)** | **60,571,863** |
| මූල්‍ය පිරිවැය | 6 | (14,834,711) | (12,703,416) |
| **බදු පෙර ලාභය** | | **(182,480,765)** | **47,868,447** |
| ආදායම් බද්ද | 7 | 7,348,904 | (31,318,522) |
| **ලාභය (ආදායම් බදු අඩු කිරීමෙන් පසු)** | | **(175,131,860)** | **16,549,924** |
| වෙනත් විස්තීරණ ආදයම් | | | |
| **විශ්‍රාම ප්‍රතිලාභ සැලැස්මට අනුව ඇති වූ ලාභය** | | | **19,912,273** |
| **කාල පරිච්ඡේදයට අදාල මුළු විස්තීරණ ආදායම** | | **(175,131,860)** | **36,462,197** |

# ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව
# ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශය

**රු.'000 වලින්**

| | රඳවාගත් ලාභය | රජයේ දායකත්වය | මුළු එකතුව |
|---|---|---|---|
| 2014/01/01 දිනට ශේෂය | 1,238,641,810 | 537,742,424 | 1,776,384,234 |
| කාල පරිච්ඡේදයට අදාළ විස්තීරණ ආදායම පූර්ව වර්ෂය සඳහා | (175,131,860) | - | (175,131,860) |
| ප්‍රතිවෙළඳ ගිවිසුම් වියදම් ගැලපීම පූර්ව වර්ෂය සඳහා | (14,455,280) | - | (14,455,280) |
| වෙළඳ ණයගැතියන් - රඳවා ගැනීම් බදු ගැලපීම | 159,579 | - | 159,579 |
| **2014/12/31 දිනට ශේෂය** | **1,049,214,249** | **537,742,424** | **1,586,956,673** |

## ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව
## මුදල් ප්‍රවාහ ප්‍රකාශය

රු. '000වලින්

| | **2014 දෙසැම්බර් 31** | **2013 දෙසැම්බර් 31** |
|---|---|---|
| **මෙහෙයුම් කටයුතු වලින් මුදල් ප්‍රවාහයන්** | | |
| බදු පෙර ශුද්ධ ලාභය | (182,480,765) | 47,868,447 |
| **ගැලපුම්** | | |
| පෙර වර්ෂය සඳහා ගැලපීම් (ගැලපීම් 1) | (14,295,701) | (1,348,655) |
| ආයෝජන පොලී ආදායම | (32,176,410) | (50,484,233) |
| දේපළ,පිරියත හා උපකරණ විකිණීමේ ලාභය | (999) | (439,858) |
| විදේශ ප්‍රදානයන් ක්‍රමක්ෂය | (15,903,664) | (15,903,664) |
| ප්‍රති වෙළඳ ගිවිසුම් ආදායම | (46,566,500) | (80,022,125) |
| ප්‍රති වෙළඳ ගිවිසුම් වියදම | 49,112,441 | 104,335,844 |
| රාජ්‍ය ප්‍රදානයන් | - | (9,000,000) |
| ක්ෂය | 153,518,300 | 160,631,695 |
| අඩමාණ ණය වෙන්කිරීම - සේවාදායක ණයගැතියන් | 6,879,785 | (62,183,625) |
| අඩමාණ ණය වෙන්කිරීම - සේවක ණයගැතියන් | 111,122 | 65,163 |
| අඩමාණ ණය වෙන්කිරීම - විවිධ ණයගැතියන් | 44,084 | (250,225) |
| දේපළ, පිරියත හා උපකරණ විකිණීමේ අලාභය | 63,915 | 3,040 |

| | | |
|---|---|---|
| බැංකු පොළිය | 8,385,155 | 1,669,908 |
| වාහන කල්බදු ණය පොළිය | 2,441,330 | 3,700,623 |
| අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂය | 73,616,002 | 60,366,000 |
| අස්පෘශ්‍ය වත්කම් ගැලපීම් | - | (214,000) |
| සේවක පාරිතෝෂික දීමනා සඳහා වෙන්කිරීම | - | 23,758,779 |
| සේවක පාරිතෝෂික දීමනා ගැලපීම | (18,600) | (6,000) |
| මූල්‍ය හා වෙනත් කපා හැරීම් | 158,468 | - |
| **මෙහෙයුම් කටයුතු වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය කාරක ප්‍රාග්ධන වෙනස්වීම් වලට පෙර** | **2,887,962** | **182,547,113** |
| (වැඩිවීම)/අඩුවීම - නොනිමි වැඩ | 3,500,728 | (308,118) |
| (වැඩිවීම)/අඩුවීම - තොග | (2,533,249) | (848,319) |
| (වැඩිවීම)/අඩුවීම - ලැබිය යුතු දෑ (ගැලපීම් 2) | 60,766,886 | 71,687,889 |
| වැඩිවීම/(අඩුවීම) - ගෙවිය යුතු දෑ (ගැලපීම් 3) | (33,901,970) | (108,910,343) |
| **මෙහෙයුම් කටයුතු වලින් ජනනය වන මුදල් ප්‍රවාහයන් කාරක ප්‍රාග්ධන වෙනස්වීම් වලට පසු** | **30,720,357** | **144,168,222** |
| පොලී ගෙවීම් | (8,385,155) | (1,669,908) |
| පාරිතෝෂික දීමනා ගෙවීම් | (6,771,266) | (4,859,194) |
| අස්පෘශ්‍ය වත්කම් මිලදී ගැනීම් | (72,655,766) | (52,076,000) |

| | | |
|---|---|---|
| ආර්ථික සේවා බදු ගෙවීම් | - | (15,062,000) |
| රඳවාගැනීම් බදු ගෙවීම් | (3,455,787) | (4,979,751) |
| **මෙහෙයුම් කටයුතු වලින් ජනනය වන ශුද්ධ මුදල් ප්‍රවාහය** | **(60,547,617)** | **65,521,369** |
| **ආයෝජන කටයුතු මගින් ජනනය වන මුදල් ප්‍රවාහයන්** | | |
| දේපල පිරියත හා උපකරණ මිලට ගැනීම | (165,621,332) | (112,416,000) |
| දේපල පිරියත හා උපකරණ විකිණීමෙන් ලද ආදායම | 13,890 | 440,859 |
| ආයෝජන ආදායම් ලැබීම් (භාණ්ඩාගාර බිල්පත් සහ ස්ථාවර තැන්පතු) | 40,010,414 | 57,953,384 |
| පරිපාලිත සමාගම්හි ආයෝජන (කල් පිරෙන තෙක් තබා ගන්නා මූල්‍ය වත්කම්) | 79,880,138 | (43,573,450) |
| පරිපාලිත සමාගම් ආයෝජන (භාණ්ඩාගාර බිල්පත් සහ ස්ථාවර තැන්පතු) | 30,274,578 | 43,077,552 |
| **ආයෝජන කටයුතු වලින් ජනනය වූ /භාවිතා වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | **(15,442,312)** | **(54,517,655)** |
| **මූල්‍ය කටයුතු වලින් ජනනය වූ/ගෙවූ මුදල් ප්‍රවාහයන්** | | |
| ගෙවූ ලාභාංශ | ( 827,496) | (921,649) |
| මූල්‍ය කල්බදු ගෙවීම් | (13,260,468) | (13,260,468) |
| **මූල්‍ය කටයුතු වලින් ජනනය වූ/ගෙවූ ශුද්ධ මුදල් ප්‍රවාහයන්** | **(14,087,964)** | **(14,182,117)** |
| වර්ෂය තුළ මුදල් හා මුදල් වලට සමාන දෑහි වැඩිවීම හෝ අඩුවීම | (90,077,893) | (3,178,403) |
| වර්ෂය ආරම්භයේ වැඩිවීම / අඩුවීම | (43,907,403) | (40,729,000) |
| **වර්ෂය අවසානයේ ශේෂය** | **(133,985,296)** | **(43,907,403)** |

| ගැලපීම් 1 | 2014 | 2013 |
|---|---|---|
| | රු. | රු. |
| **පෙර වර්ෂයට අදාල ගැලපීම් 1** | | |
| ප්‍රති වෙළඳ ගිවිසුම් වියදම් | (14,455,280) | - |
| රඳවා ගැනීම් බදු වෙනස්වීම | 159,579 | - |
| නිවාස ණය සඳහා වෙන්කිරීම් වෙනස්වීම | - | (1,405,111) |
| ලාභාංශ බදු ගැලපීම වෙනස්වීම | - | 56,456 |
| | **(14,295,701)** | **(1,348,655)** |

## ගැලපීම් 2

| | 2014 | 2013 |
|---|---|---|
| **ලැබිය යුතු ගිණුම් වල වැඩිවීම/අඩුවීම** | | |
| වෙළඳ ලැබිය යුතු දෑ | 63,691,100 | 153,037,813 |
| ණය හා ලැබිය යුතු දෑ (භාණ්ඩාගාර බිල්පත් හැර) | (15,574,876) | (19,858,962) |
| වෙනත් ලැබිය යුතු | 18,331,112 | (24,550,874) |
| කලින් ගෙවීම් | 5,792 | (598,670) |
| අස්පෘශ්‍ය වත්කම් | (5,686,241) | (36,341,418) |
| | 60,766,886 | 71,687,889 |

## ගැලපීම් 3

| | 2014 | 2013 |
|---|---|---|
| **ගෙවිය යුතු ගිණුම් වල වැඩිවීම්/අඩුවීම** | | |
| වෙළඳ ගෙවිය යුතු දෑ | (48,665,573) | (107,146,560) |
| වෙනත් මූල්‍ය වගකීම් | 17,560,448 | 4,413,216 |
| වෙනත් ගෙවිය යුතු දෑ | (2,796,845) | (6,176,999) |
| | (33,901,970) | (108,910,343) |

# ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව
## මූල්‍ය වාර්තා සැකසීම හා සම්බන්ධ සටහන්

### 1. සාමාන්‍ය තොරතුරු

ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව (මෙහි මින් මතු සංස්ථාව යනුවෙන් හඳුන්වනු ලබන) 1982 අංක 06 දරන ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථා පනත යටතේ සංස්ථාපනය කර ඇත. ශ්‍රී ලාංකීය ජාතියේ දෘශ්‍ය මාධ්‍යයේ පෙරගමන්කරු වශයෙන් කටයුතු කරන සංස්ථාවේ ප්‍රධාන අරමුණ වන්නේ, දැනුම, විනෝදය හා අධ්‍යාපනය ලොව පුරා විසිර සිටින ශ්‍රී ලාංකේය සමාජය වෙත ලබාදීමයි.

2014 වර්ෂයේ දෙසැම්බර් මස 31 දින වනවිට සංස්ථාවේ සිටින සේවක සංඛ්‍යාව 1035 කි. (ස්ථිර, කොන්ත්‍රාත් සහ අනියම් සේවකයින්) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2014 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා මූල්‍ය වාර්තා නිකුත් කරනු ලබන්නේ 2015 මාර්තු 13 වන දින ය.

### 2. ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති (SLFRS) යොදාගැනීම හා පිළියෙල කිරීමේ පදනම

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනය මගින් අනුමත කර ඇති ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව හා 1995 අංක 19 දරන ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිතීන්ගේ අවශ්‍යතා අනුව සංස්ථාව මූල්‍ය වාර්තා පිළියෙල කර ඇත.

2012 ජනවාරි 01 සිට ආයතනවලට අදාළ වන පරිදි ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනය නව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති නිකුත් කරන ලදී.
මූල්‍ය වාර්තා පිළියෙල කිරීම සඳහා යොදා ගත් හා යොදා නොගත් ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති සටහන් 8 මගින් අනාවරණය කර ඇත.

## 3. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

මූල්‍ය වාර්තා පිළියෙල කිරීම සඳහා යොදා ගත් මූලික ගිණුම්කරණ ප්‍රතිපත්ති පහත දක්වා ඇත. මෙම ප්‍රතිපත්ති වෙනත් ආකාරයකට දක්වා ඇති අවස්ථාවලදී හැර සෑම වර්ෂයකදීම නොවෙනස්ව යොදා ගනු ලැබේ.

### 3.1 පිළියෙල කිරීමේ පදනම

සංස්ථාවේ මූල්‍ය වාර්තා පිළියෙල කර තිබෙන්නේ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්ට අනුකූලවය. මූල්‍ය වාර්තා ඓතිහාසික පිරිවැය පදනමට අනුකූලව පිළියෙල කර ඇත. උද්ධමනකාරී සාධක මත ගිණුම්වලට ඇතිවන බලපෑම් සඳහා ගැලපීම් කර නැත. මෙම මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල්වලින් (ඉදිරිපත් කරනු ලබන අතර ආසන්නතම රුපියල් දහසට වටයා) ඉදිරිපත් කර තිබේ.

මූල්‍ය වාර්තා SLFRS වලට අනුකූලව පිළියෙල කිරීමේ දී අවශ්‍ය අවස්ථා වලදී ගිණුම්කරණ ඇස්තමේන්තු භාවිත කිරීමට සිදුවේ. එමෙන්ම සංස්ථාවේ ගිණුම්කරණ ප්‍රතිපත්ති යොදා ගනිමින් කළමනාකරණය ගනු ලබන තීරණ මූල්‍ය වාර්තා පිළියෙල කිරීමේ දී අවශ්‍ය වේ. සටහන් අංක 06 මගින් මූල්‍ය වාර්තා සැකසීමේ දී භාවිත කළ ඉතාමත් වැදගත් තීරණ, සංකීර්ණ තත්ත්වයන්, උපකල්පන හා ඇස්තමේන්තු හෙළිදරව් කර ඇත.

ප්‍රතිපත්ති සංශෝධනයන් සහ අර්ථ නිරූපණය කිරීම් අලුතින් වෙනස් වුව ද 2012 ජනවාරි 01 දිනෙන් ආරම්භ වන වර්ෂයේ දී හා ඊට පෙර ක්‍රියාත්මක නොවූ වෙනස්වීම් පහත දැක්වේ.

1. IFRS 13 ට අනුව "සාධාරණ වටිනාකම ඇගයීමේ" අරමුණ වන්නේ සංගතතාව ඉහළ නැංවීමත්, සංකීර්ණ තත්ත්ව අඩු කිරීමත්ය. ඒ සඳහා සාධාරණ වටිනාකම පිළිබඳ නිරවද්‍ය නිර්වචනයන් ලබාදීමත් , සාධාරණ වටිනාකම මැනීමට මූලාශ්‍රයන් ලබාදීමත්, ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්ට අනුව හෙළිදරව් කිරීමේ නියමයන් ලබාදීමත් සිදු කරයි.

2. IFRS 9 මගින් ප්‍රකාශ කරනු ලබන්නේ "මූල්‍ය සාධන පත්‍ර" හෙවත් මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් වර්ගීකරණය මැනීම හා හඳුනා ගැනීමයි. LKAS 39 මූල්‍ය සාධන පත්‍ර හඳුනාගැනීම හා මැනීම යන ප්‍රතිපත්තිය වෙනුවට IFRS 9 පිහිටුවන ලදී. ඒ අනුව, මූල්‍ය වත්කම් මිනුම් දඬු 2 ක් යටතේ බෙදා වෙන් කිරීම සිදු කෙරේ. එනම්, සාධාරණ අගය හා ක්‍රමක්ෂය පිරිවැය පදනමයි. මූලික හඳුනා ගැනීම මගින් නිර්ණය කිරීම සිදු කෙරේ. බෙදා වෙන් කිරීම රඳා පවතිනුයේ ආයතනයක් තම මූල්‍ය සාධන පත්‍ර කළමනාකරණය කර ගන්නා ව්‍යාපාරික ආකෘතිය අනුව සහ සාධන පත්‍රවල ගිවිසුම් ප්‍රකාර මූල්‍ය

ප්‍රවාහයන්හි ස්වභාවය අනුවය. මූල්‍ය වගකීම් ගැන කතාකිරීමේ දී තවදුරටත් LKAS 39 හි සඳහන් බොහෝ අවශ්‍යතා ඒ ආකාරයෙන් ම පවතී. මෙහි ප්‍රධාන වෙනස නම් සාධාරණ අගය යන විකල්පය, මූල්‍ය වගකීම්වල දී සලකා බැලීම, සාධාරණ අගය වෙනස්වීම ආයතන ගෙවිය යුතු ණය අවදානමේ කොටසක් වශයෙන් ගිණුම්කරණ අයෝග්‍යතාවක් ඇති නොවන පරිදි වාර්තා කිරීම සිදු කළ යුත්තේ විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ ද එසේ නොමැති නම් ආදායම් ප්‍රකාශයේම ද යන්නයි. සංස්ථාව මේ දක්වා IFRS 9 හි මුළු බලපෑම තක්සේරු කර ඇත.

## 3.2 ව්‍යවහාර මුදල්

### (ඒ) ව්‍යවහාර හා ප්‍රකාශිත මුදල් ඒකක

සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශයන්හි ඇතුළත් අයිතමයන් මැනීම සිදු කරන්නේ සංස්ථාව ක්‍රියාත්මක වන මූලික ආර්ථික පරිසරය අනුවය (ක්‍රියාකාරී මුදල් ඒකක). මූල්‍ය වාර්තා ඉදිරිපත් කරන්නේ ශ්‍රී ලංකා රුපියල්වලින් වන අතර එය සංස්ථාවේ ව්‍යවහාර හා ප්‍රකාශිත මුදල් ඒකකය වේ.

### (බී) ගනුදෙනු හා ශේෂයන්

විදේශ මුදල් ගනුදෙනු පරිවර්තනය කරන ලද්දේ ගනුදෙනුවට අදාළ දිනයේ පැවති විනිමය අනුපාතිකය අනුවය. මූල්‍ය වත්කම් හා වගකීම්වලට අදාළ ගනුදෙනු වර්ෂ අවසානයේ පවතින විනිමය අනුපාතිකය අනුව පරිවර්තනය කළ විට එහි ප්‍රතිඵලයක් ලෙස ඇතිවන යම් ලාභයක් හෝ අලාභයක් වේ නම් ආදායම් ප්‍රකාශයේ දැක්විය යුතුය.

ණය ගැනීම්, මුදල් හා මුදල් හා සමාන දෑ සහ ඒ හා සම්බන්ධ විදේශ විනිමය ලාභ හෝ අලාභ විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ "මූල්‍ය ආදායම් හෝ පිරිවැය" වශයෙන් දක්වා ඇත. අනෙකුත් සියලු විනිමය හුවමාරු ලාභ හෝ අලාභ විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ "අනෙකුත් (අලාභ) / ලාභ" ලෙස දක්වා ඇත.

## 3.3 දේපල, පිරියත හා උපකරණ

ඉඩම් හා ගොඩනැගිලි සමන්විත වන්නේ සම්ප්‍රේෂණාගාර සහ ප්‍රධාන කාර්යාලවලිනි. සියලු දේපළ පිරියත හා උපකරණ පවත්වාගෙන යන්නේ ඓතිහාසික පිරිවැය අඩු කිරීම ක්ෂය යන පදනමටය. ඓතිහාසික පිරිවැයට අදාළ වියදම් වනුයේ වත්කම අත්පත් කරගැනීමට ඍජුවම අදාළ වූ වියදම්ය.

යම් වත්කමක අනාගත ආර්ථික ප්‍රතිලාභ සංස්ථාව වෙත ලැබේ නම් සහ වත්කමේ පිරිවැය නිශ්චිතව ගණනය කළ හැකි නම් එවැනි වත්කම් සම්බන්ධයෙන් ඇතිවන පසුකාලීන වියදම් වත්කමේ පවත්වාගෙන යාමේ පිරිවැය වශයෙන් හෝ වෙනමම වත්කමක් වශයෙන් යන ආකාර දෙකෙන් සුදුසු

ආකාරයකට පවත්වා ගත හැක. ප්‍රතිස්ථාපනය කළ හැකි කොටස්වල පවත්වාගෙන යාමේ පිරිවැය මෙහි දී නොසැලකේ. අනෙකුත් සියලු අලුත්වැඩියා හා නඩත්තු වියදම්, වියදම දැරූ මූල්‍ය කාලපරිච්ඡේදයේ විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ දී සලකා බලනු ලැබේ.

ඉඩම් ක්ෂය කරනු නොලැබේ. අනෙකුත් වත්කම්වල පිරිවැයෙන් සුන්බුන් අගය අඩු කර ලැබෙන වටිනාකම එම වත්කම්වල ඵලදායී ජීවකාලය තුළ සරල මාර්ග ක්ෂය ක්‍රමය මගින් ක්ෂය කරනු ලැබේ.

## වගුව 1 - දේපල පිරියත හා උපකරණවල ක්ෂය අනුපාත

| | අනුපාත |
|---|---|
| ගොඩනැගිලි | 2% |
| පරිගණක | 20% |
| ගෘහභාණ්ඩ හා සවිකිරීම් | 10% |
| විදුලි උපකරණ | 20% |
| මෝටර් රථ | 25% |
| කාර්යාලීය උපකරණ | 20% |
| පුස්තකාල තොග | 20% |
| රූපවාහිනී යන්ත්‍ර | 20% |
| වෙනත් වත්කම් | 20% |

අවශ්‍ය නම් සෑම ගිණුම් වර්ෂයක් අවසානයේදීම වත්කමක අවශේෂ වටිනාකම සහ ඵලදායි ආයු කාලය නැවත ගණනය කර යාවත්කාලීන කිරීම සිදු කළ හැක.

වත්කමෙන් පවත්වාගෙනයාමේ පිරිවැය එම වත්කමේ ආපසු ලබාගත හැකි අගයට වඩා වැඩි නම් එම වෙනස ඉක්මනින් කපාහැරිය යුතුය. වත්කමේ විකිණීමේ ලාභය හෝ අලාභ ආදායම් ප්‍රකාශනයෙහි අනෙකුත් ලාභ / (අලාභ) යටතේ දැක්වේ.

## 3.4 මූල්‍ය සාධන පත්‍ර

### (ඒ) මූල්‍ය වත්කම්

### 3.4.1 වර්ගීකරණය

සංස්ථාව තම මූල්‍ය වත්කම් පහත පරිදි වර්ගීකරණය කරනු ලබයි. පරිණත දින දක්වා තබා ගන්නා මූල්‍ය සාධන පත්‍ර, ණය හා ලැබිය යුතු ගිණුම් හා විකිණීම සඳහා ඇති මූල්‍ය සාධන පත්‍ර වශයෙනි. වර්ගීකරණය රඳා පවතිනුයේ මූල්‍ය වත්කම් අත්පත් කරගත් අරමුණ අනුව හා කළමනාකරණයේ තීරණ මතය.

### (ඒ) පරිණත දින දක්වා තබා ගන්නා මූල්‍ය සාධන පත්‍ර

මෙය සමන්විත වනුයේ ස්ථාවර හෝ නිශ්චිත ගෙවීමක් ඇති සහ නිශ්චිත කල්පිරීමේ දිනයක් ඇති ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් සහිත ස්ථාවර තැන්පතුවලිනි. මේවා පරිණත දින දක්වා තබාගැනීමට සංස්ථාවේ කළමනාකරණයට හැකියාවක් මෙන් ම නියත අරමුණක් ඇත. (සටහන් 10 බලන්න)

### (බී) ණය හා ලැබිය යුතු ගිණුම්

ණය හා ලැබිය යුතු ගිණුම් යනු ක්‍රියාකාරී වෙළෙඳපොලේ මිල කිරීමක් නොකළ ස්ථිර හෝ නිශ්චිත ගෙවීමක් ඇති ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම්ය. මෙයට ගිණුම් වර්ෂය අවසානයේ මාස 12 කට අඩු පරිණත කාලයක් සහිත ජංගම වත්කම් අදාළ වේ. සංස්ථාවේ ශේෂ පත්‍රයේ ණය හා ලැබිය යුතු ගිණුම්වල ඇතුළත් වන්නේ "වෙළෙඳ හා වෙනත් ලැබිය යුතු දෑ" සහ මුදල් හා මුදල් සමාන දෑය.
(සටහන් 13 බලන්න)

### (සී) විකිණීම සඳහා ඇති මූල්‍ය සාධන පත්‍ර

මෙයට අයත් වන්නේ අනිකුත් වර්ගයකට අයත් නොවන සියලුම ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම්ය. එනම් ගිණුම්කරණ කාලපරිච්ඡේදය අවසානයේ මාස 12 ක් ඇතුලත කළමනාකරණය විසින් විකිණීමට තීරණය කරන්නේ නම් මිස නැතහොත් පරිණත දින දක්වා තබා ගන්නා ජංගම නොවන වත්කම් මෙයට ඇතුළත් වේ. එබැවින් මෙය සමන්විත වූයේ ලංකා පුවත් (පෞද්ගලික) සීමිත සමාගමේ මිල නොකළ කොටස්වලිනි.

### (බී) මූල්‍ය වගකීම්

IAS 39 අනුව වගකීම් වර්ගීකරණය කරනුයේ සාධාරණ අගයට ප්‍රත්‍යාගණනය කළ මූල්‍ය වගකීම් හා අනෙකුත් වගකීම් වශයෙනි.
ගෙවා අවසන් වූ අවලංගු කළ හා කල් ඉකුත් වූ වගකීම් සම්බන්ධයෙන් වන බැදියාව මූල්‍ය වගකීමක් වශයෙන් නොසැලකේ.

## 3.5 තොග

සංස්ථාවේ තොග වන්නේ පරිභෝජන භාණ්ඩ තොගයි. (සංස්ථාවේ තොග පවත්වාගෙන යනු ලබන්නේ පරිහරණය කිරීම සඳහා වන අතර එම තොග අලෙවි කරනු නොලැබේ.) එබැවින් තොග ඒවායේ පිරිවැය මත අගය කරනු ලැබේ. තොග අගය කරනු ලබන්නේ ප්‍රථම ලැබීම් ප්‍රථම නිකුතු පදනම අනුවය.

## 3.6 කල්බදු දේපල

කල්බදු පදනම මත ලබාගත් දේපළ, පිරියත හා උපකරණවල අයිතිය, ප්‍රතිලාභ හා අවදානම සංස්ථාව සතුවන බැවින් එය මූල්‍ය කල් බද්දක් වශයෙන් හැඳින්වේ.

පසුගිය වර්ෂ 04 තුළ දී කාර් රථ 03 ක් සහ වෑන් රථ 06 ක් මූල්‍ය කල්බදු ක්‍රමයට ලබාගෙන ඇති අතර අයිතිය ප්‍රතිලාභ හා අවදානම සංස්ථාව සතුවේ. මූල්‍ය කල්බදු ප්‍රාග්ධනිත කිරීම හා අනාවරණය කිරීම සිදු කර ඇත්තේ මෙම කාර් රථවල මුදල්මය වටිනාකම හා සංස්ථාව එම වත්කම ඵලදායි ආකාරයට භාවිතා කිරීමට බලාපොරොත්තු වන කාලය තුළ ක්ෂය කිරීම ආදිය දැක්වීම මගිනි.

ගෙවිය යුතු මූලික බදු වටිනාකම කාල විශ්ලේෂණය අනුව ජංගම වගකීම් හා ජංගම නොවන වගකීමක් ලෙස දක්වා ඇත. ඉතිරි කල්බදු ශේෂය මත ස්ථාවර අනුපාතයන් යටතේ අඩු කළ පොලිය හා මූලික බදු වටිනාකමින් අඩු වන කොටස වශයෙන් බදු වාරිකය කොටස්වලට බෙදේ. නියමිත බදු ප්‍රාග්ධන වටිනාකම (පොලිය හැර) අවුරුදු 05 පුරා ගෙවන පොලිය අවිනිශ්චිත පොලී ගිණුමකට මාරු කෙරේ. සෑම මූල්‍ය වර්ෂයකදී ම ගෙවන බදු වාරිකවල ඇතුලත් පොලිය එම වර්ෂයේ ආදායම් ප්‍රකාශයට අය කරනු ලැබේ.

## වගුව 2 - කල්බදු වාරිකවල කාල විශ්ලේෂණය

පහත වගුවේ දැක්වෙනුයේ වර්ෂයක කාලයක් තුළ දී හා වර්ෂයකට වැඩි කාලයක් තුළ දී ගෙවිය යුතු මූල්‍ය කල්බදු වාරික වටිනාකමයි.

රු.'000 වලින්

| | අවුරුදු 1 ට අඩු | අවුරුදු 1 ට වැඩි |
|---|---|---|
| පොලිය | 1,009,686 | 24,495 |
| කල්බදු වටිනාකම | 11,943,440 | 1,504,471 |
| කල්බදු ශේෂය - ලංකා බැංකුව | 12,953,126 | 1,528,966 |

## 3.7 වෙළෙඳ ණයගැතියෝ

### 3.7.1 ප්‍රතිපාදන - වෙළෙඳ ලැබීම් / සේවාදායක ණයගැතියන්

වෙළෙඳ ලැබීම් පවත්වාගෙන යනුයේ නැවත ලබාගතහැකියැයි අපේක්ෂා කරන වටිනාකමටය. සංස්ථාවට ලැබිය යුතු නියමිත වටිනාකම ලබාගත නොහැකි බවට පැහැදිලි සාක්ෂි පවතින අවස්ථාවල දී ඒ සඳහා ප්‍රතිපාදන පවත්වා ගනී. වෙළඳ ණයගැතියන් ප්‍රතිපාදන යටතේ අඩු කරනුයේ ණයගැතියන් විශාල මූල්‍ය අර්බුදයන්ට පත්ව ඇතිවිටෙක, ණයගැතියන් බංකොලොත්වීමේ සම්භාවිතාවයක් පවතින විට මූල්‍ය ප්‍රතිසංවිධානය වීමක දී ණය ගෙවීම් දීර්ඝ කාලයක් පැහැර හැරීම යන අවස්ථාවන්වලදීය. විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ ඇති බෙදාහැරීමේ වියදම් යටතේ වර්ෂයේ ඌණ ප්‍රතිපාදනය වියදමක් වශයෙන් දක්වන අතර අදාළ වත්කම් ගිණුමෙන් එම ප්‍රතිපාදනය අඩු කරනු ලැබේ. නැවත අයකරගත නොහැකි වෙළෙඳ ණයගැති ශේෂය ණයගැති ප්‍රතිපාදනයෙන් කපා හරිනු ලැබේ. එලෙස කපාහැරි ණයගැතියෝ පසු අවස්ථාවක අයකර ගත්විට එම ප්‍රමාණය ආදායම් ප්‍රකාශයේ බෙදාහැරීමේ වියදම් වලින් ඉවත් කරනු ලැබේ.

## 3 වගුව - සේවාදායක ණයගැති ප්‍රතිපාදනය - 2014/12/31

**රු.'000 වලින්**

| | |
|---|---|
| 2014/01/01 ප්‍රතිපාදනය | **64,162,205** |
| **2014 වර්ෂය සඳහා අයකිරීම්** | **6,882,456** |
| **2014 වර්ෂයේ කපා හැරීම්** | **(2,671)** |
| 2014/12/31 දිනට ප්‍රතිපාදනය | **71,041,991** |

## 3.7.2 විවිධ ණයගැතියන්ගේ ප්‍රතිපාදනය

## 4 වන වගුව - විවිධ ණයගැතියන්ගේ ප්‍රතිපාදනය - 2014/12/31

**රු.'000 වලින්**

| | |
|---|---|
| 2014/01/01 ප්‍රතිපාදනය | 18,578,482 |
| 2014 වර්ෂය සඳහා අයකිරීම් | 44,084 |
| **2014/12/31 දිනට ප්‍රතිපාදනය** | **18,622,566** |

## 3.7.3 – වෙනත් ලැබිය යුතු දෑ සඳහා ප්‍රතිපාදනය

### 3.7.3 1) සේවක ණය

සේවක ණයවලට පහත දැක්වෙන ණය වර්ගයන් යටතේ සුදුසුකම්ලත් සේවකයින් වෙත දෙනු ලැබූ මුදල් ඇතුළත්ය.

- ආපදා ණය
- විශේෂ ණය
- ප්‍රවාහන ණය
- නිවාස ණය
- වෙනත් ණය

සේවක ණය සම්බන්ධයෙන් බොල් ණය වශයෙන් පිළිබිඹු කෙරෙනුයේ සංස්ථාවේ තවදුරටත් සේවයේ නොමැති (විශ්‍රාම ගොස්, ඉල්ලා අස් වී හෝ මිය ගොස් ඇති) සේවකයින්ගේ නැවත අයකරගැනීමට අපහසු මුදල් සඳහා වූ ප්‍රතිපාදනයයි.

**5 වගුව - සේවක ණය සඳහා වෙන් කිරීම - 2014/12/31**

**රු. වලින්**

| | |
|---|---|
| **වෙන්කිරීම 2014/01/01** | **141,250** |
| 2014 වර්ෂය සඳහා අයකිරීම් | 111,122 |
| **වෙන්කිරීම 2014/12/31** | **252,372** |

## 3.7.3 2) සේවක අත්තිකාරම්

පහත දැක්වෙන අත්තිකාරම් ප්‍රභේද යටතේ සුදුසුකම් ලත් සේවකයින්ට ලබාදුන් මුදල් ප්‍රමාණයන්ගෙන් සේවක අත්තිකාරම් සමන්විත වේ.

- වැඩසටහන් සඳහා අත්තිකාරම්
- සේවකයින් සඳහා අත්තිකාරම් (විවිධ)
- විදේශ ගමන් සඳහා අත්තිකාරම්
- කාමර ගාස්තු සඳහා අත්තිකාරම්

ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ තවදුරටත් සේවයේ නොමැති (විශ්‍රාම ගොස් හෝ ඉල්ලා අස් වී හෝ මියගොස්) ඇති සේවකයින්ගෙන් නැවත අය කරගැනීමට අපහසු අත්තිකාරම් මුදල් පිළිබිඹු කෙරෙන සේ සේවක අත්තිකාරම් සඳහා බොල් ණය සඳහා වූ ප්‍රතිපාදනය වෙන් කර ඇත.

## 3.8 ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය

ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශයෙහි පෙර වර්ෂයට අදාල ප්‍රතිවෙළඳ ගිවිසුම් ගැලපීම් ලෙස රු.14,455,280 ක් සහ වෙළඳ ණයගැතියන්ට අදාල රඳවා ගැනීම් බදු ගැලපීම් ලෙස රු.159,579 ක් ද ඇතුළත් වේ.

## 3.9 මුදල් හා මුදල් සමාන දෑ

මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මුදල් හා මුදල් හා සමාන දෑ වලට ඇතුළත් වනුයේ අත ඇති මුදල් හා බැංකු ජංගම ගිණුමයි. මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ බැංකු අයිරාව පෙන්වා ඇත්තේ ජංගම වගකීම්වලට ඇති ණය ගැනීම් යටතේය.

## 3.10 වෙළෙඳ ගෙවීම් / වගකීම්

ජංගම වගකීම් වශයෙන් වර්ග කරන ගෙවිය යුතු දෑ වන්නේ වසරක් ඇතුළත හෝ ඊට අඩු කාලයක දී ගෙවිය යුතු ගෙවීම්ය. එසේ නොවන ගෙවීම් ජංගම නොවන වගකීම්ය. වෙළෙඳ ගෙවීම් මූලික වශයෙන් හඳුනාගන්නේ සාධාරණ අගයටය.

## 3.11 වර්තමාන හා විලම්භිත ආදායම් බදු

කාලපරිච්ඡේදයේ බදු වියදමට වර්තමාන හා විලම්භිත බදු අයත්වේ. ඍජුව හිමිකම සමඟ සම්බන්ධ හෝ අනෙකුත් කාලපරිච්ඡේදයක විස්තීර්ණ ආදායම් ප්‍රකාශයන් සමඟ සම්බන්ධ (ඉදිරියට කළ ගෙවීම්) නොවන කාලපරිච්ඡේදයට අදාළව ගෙවූ බදු ප්‍රමාණය ආදායම් ප්‍රකාශයට ගනු ලැබේ. මෙහිදී ඍජුව හිමිකම සමඟ සම්බන්ධ හෝ අනෙකුත් කාලපරිච්ඡේදයක විස්තීර්ණ ආදායම් ප්‍රකාශය සමඟ සම්බන්ධ බදු වෙන් වෙන්ව හඳුනාගැනීම අවශ්‍ය වේ.

වර්තමාන ආදායම් බද්ද ගණනය කරනු ලබන්නේ 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ විධිවිධානයන්ට හා පසුව සිදු කළ සංශෝධනයන්ට අනුවය. බදු රෙගුලාසි වලට අනුව බදු ගණනය කිරීමට යොදා ගන්නා දෑ කළමනාකරණය විසින් කලින් කලට සලකා බලනු ලැබේ. ඒ අනුව බදු අධිකාරියට ගෙවීමට නියමිත බදු ප්‍රමාණය ගණනය කෙරේ.

වගකීම් ක්‍රමය භාවිත කර විලම්භිත බදු ගණනය කරන්නේ වත්කම් හා වගකීම් අතර වෙනස බදු පදනමට සලකා එය එම වත්කම් හා වගකීම්වල මූල්‍ය වාර්තාවලට ගන්නා පවත්වාගෙනයාමේ වටිනාකම අතර වෙනස සලකා බලාය. විලම්භිත ආදායම් බද්ද ගණනය කිරීමේ දී ඉහත සඳහන් කළ වෙනස මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දිනට බලපැවැත්වෙන බදු ප්‍රතිශතයෙන් වැඩි කරනු ලැබේ. මෙහිදී උපලබ්ධික වූ උපචිත ආදායම් බදු වත්කම හෝ බේරුම් කළ උපචිත ආදායම් බදු වගකීම ලැබේ.

විලම්භිත ආදායම් බදු වත්කම පවත්වා ගැනීමෙන් අනාගතයේ දී බදු අය කළ හැකි ලාභය අඩු කිරීමට එය භාවිත කෙරේ. විලම්භිත ආදායම් බදු වත්කම සහ වගකීම එකිනෙකට හිලව් කිරීම නීතිය මගින් බලාත්මක අවස්ථාවල දී කළ හැකිය.

## 3.12 අසම්භාව්‍ය වගකීම්

සංස්ථාව පසුගිය අවස්ථාවන්වල දී සිදු කළ නීතිමය හා ගිවිසුම් ප්‍රකාර බැඳීම්වල ප්‍රතිඵලයක් ලෙස එම අවසන් කිරීමට ආර්ථිකමය ප්‍රතිලාභ පිටතට ගලායාමේ සම්භාවිතාවක් පවතින හා විශ්වාස කළ හැකි ඇස්තමේන්තුවක් එම බැඳියාවන් පිළිබඳව කළ හැකි වගකීම් අසම්භාව්‍ය වගකීම් වේ.

සංස්ථාවට එරෙහිව නඩු 5 ක් පවරා ඇත. සංස්ථාවට එරෙහිව දෙනු ලබන අධිකරණ නියෝගයක දී නඩු 5 සඳහාම පැමිණිලිකරුවන් වෙත ගෙවීමට සිදු විය හැකි යයි තක්සේරු කරන ලද වන්දි මුදල වන රු. 1, 270,000, 000 මූල්‍ය ප්‍රකාශනවල සටහන් යටතේ හෙළිදරව් කර ඇත.

## 3.13 විශ්‍රාම ප්‍රතිලාභ වගකීම

නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම යනු සේවකයෙකු විශ්‍රාම යෑමේ දී සාමාන්‍යයෙන් වයස, සේවා කාලය හා වන්දි මුදල යන සාධක එකක් හෝ කිහිපයක් පදනම් කරගෙන ලැබෙන විශ්‍රාම දීමනාවයි.

නිශ්චිත ප්‍රතිලාභ සැලැස්මට අනුව ශේෂ පත්‍රයට ඇතුළත් කරන පාරිතෝෂික වගකීම වනුයේ ශේෂ පත්‍ර දිනට නිශ්චිත ප්‍රතිලාභ සැලැස්මේ වර්තමාන අගයයි. නිශ්චිත ප්‍රතිලාභ ගණනය කිරීමේ දී හඳුනා නොගත් අතීත සේවා වියදම සැලකිල්ලට ගනියි. නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම ස්වාධීන ආයු ගණනයෙකු ලවා Projected unit credit ක්‍රමයට අනුව වාර්ෂිකව අගය තීරණය කිරීමට ඇස්තමේන්තුගත අනාගත මුදල් ගලායාමේ ප්‍රවාහයන් රජයේ බැඳුම්කර හා ක්‍රියාකාරී වෙළෙඳපොලේ පවතින ඉහළ තත්ත්වයේ සමාගම් බැඳුම්කර වල පොලී අනුපාතික යොදා ගෙන වට්ටම් කරනු ලැබේ.

මෙමගින් ඇතිවන ලාභය හෝ අලාභයන් ඉහත උපකල්පන වෙනස්වීමෙන් ඇතිවන වෙනසත් අදාළ වර්ෂයේ විස්තීර්ණ ආදායම් ප්‍රකාශයට ඇතුළත් කෙරේ. මෙහි දී අතීත සේවා වියදම විශ්‍රාම ප්‍රතිලාභ සැලැස්ම සකසන කාලපරිච්ඡේදය සඳහා සරල මාර්ග ක්‍රමයට එක් එක් වර්ෂයට අවශෝෂණය කළ යුතුය.

**6 වගුව - මූල්‍ය තත්ව ප්‍රකාශයෙහි දැක්වෙන වටිනාකම**

**රු. '000වලින්**

| | |
|---|---|
| **2014/01/01 දිනට ශේෂය** | **138,621,178** |
| 2014 වර්ෂය තුළ අරමුදලට කරන ලද බැරකිරීම් | - |
| 2014 වර්ෂය තුළ දී කල ගෙවීම් | (6,789,866) |
| **2014/12/31 දිනට ශේෂය** | **131,831,313** |

විශ්‍රාම ප්‍රතිලාභ වගකීම 2013 දෙසැම්බර් 31 වන දිනට Projected Unit Credit ක්‍රමය භාවිත කරමින් පියල් එස් ගුණතිලක මහතා විසින් සිදුකර ඇත.

මෙම ක්‍රමය යටතේ පාරිතෝෂික ප්‍රතිලාභ ගණනය කිරීමට යොදා ගත් ප්‍රධාන කල්පිතයන් පහත දැක්වේ.

i. වට්ටම් අනුපාතය11% කි. (අනාගත මුදල් ප්‍රවාහයෙහි වර්තමාන වටිනාකම ගණනය කිරීමට යොදා ගන්නා පොලී අනුපාතය)
ii. අනාගත වැටුප් වැඩිවීම් අනුපාතය 4% වශයෙනි.
iii. විශ්‍රාම ගැන්වීමේ වයස අවුරුදු 60 ක් වශයෙනි.

ආයතනය අඛණ්ඩව පවතීය යන සංකල්පය පදනම් කර ගැනීම.

2014 වර්ෂය සඳහාද ඉහත කල්පිතයන් භාවිත කරන ලදී. ඒ අනුව 2014 වර්ෂය සඳහා විශ්‍රාම ප්‍රතිලාභ ගණනය නොකරන ලදී.

## 3.14 ප්‍රදානයන්

දේපල, පිරියත හා උපකරණ සම්බන්ධ ප්‍රදානයන් ඇතුළත් වනුයේ ජංගම නොවන වගකීම්වල විලම්භිත ප්‍රදානයන් යටතේ වන අතර සරල මාර්ග ක්‍රමයට අනුව විස්තීර්ණ ආදායම් ප්‍රකාශයට එම වත්කමේ ඵලදායී ජීවිත කාලය පුරා හර කෙරේ.

## 3.14 -1 දේශීය ප්‍රදානයන්

ප්‍රදානයන් 20% වාර්ෂික අනුපාතයකට ක්‍රමක්ෂය කරනු ලැබේ.

## 3.14- 2 විදේශීය ප්‍රදානයන්

සංස්ථාවට උපකරණ වශයෙන් රු. 654,665,339 ක විදේශීය ප්‍රදානයක් ලැබී තිබිණි. මෙම මුදල අදාළ උපකරණවල ආයු කාලය මුළුල්ලේ ගෙවී යන සේ ක්‍රමක්ෂය කොට ඇති අතර 2014 වර්ෂයට අදාළ මුදල රු. 2,596,040.18 කි. මෙය ආදායම් ප්‍රකාශයට දී ඇති සටහන්වල විදේශීය ප්‍රදානයන් ක්‍රමක්ෂය කිරීම වශයෙන් වෙනම දක්වා ඇත.

ජපන් රජයේ ආධාරයක් වශයෙන් JICA ශ්‍රී ලංකා යටතේ 2012/12/27 වන දින රු. 66,773,684.69 ක් වටිනා උපකරණ සංස්ථාවට ලැබුණි. මෙම උපකරණ සංස්ථාවට ලැබුණේ 2 D සහ 3 D සජීවීකරණය

(සංස්කරණය) කිරීම සඳහාය. එම උපකරණවල ක්‍රමක්ෂය වටිනාකම 2013 වර්ෂයේ සිට එහි ඵලදායී ආයු කාලය (වසර 5) තුළ ක්‍රමක්ෂය කරනු ලැබේ.

## 3.15 - පිරිවැටුම

සංස්ථාවේ පිරිවැටුම ගිණුම් තබනුයේ උපචිත පදනමටය. ආයෝජන ආදායම ගිණුම් තබනුයේ ද එම පදනමටය.

පිරිවැටුම සැලකීමේ දී කාලපරිච්ඡේදයට අදාළව ලැබූ හා ලැබිය යුතු සියලු ආදායම්වල සාධාරණ අගය සැලකිල්ලට ගෙන ඇත. සංස්ථාව ආදායම් වශයෙන් සැලකිල්ලට ගන්නේ විශ්වාසයෙන් වටිනාකම මැනිය හැකි හා එම ආදායම්වල අනාගත ආර්ථික ප්‍රතිලාභ සංස්ථාවට ගලා එන්නේ නම් පමණි.

ගුවන්කාල අලෙවියෙන් ලැබෙන ආදායම සංස්ථාවේ ප්‍රධාන ආදායම් මූලාශ්‍රය වේ. ආදායම් ප්‍රකාශයේ ඇතුළත් අනෙකුත් ආදායම් මූලාශ්‍රයන් ආදායම් ප්‍රකාශයේ සටහන්වල දැක්වේ.

## 3.16 වියදම් පිළිබඳ ගිණුම් තැබීම

සංස්ථාවේ වියදම් උපචිත පදනමට ගිණුම් තබා ඇත. දෛනික මෙහෙයුම් සිදු කිරීම හා දේපල, පිරියත හා උපකරණ කාර්යක්ෂම ආකාරයට පවත්වාගෙනයාම සඳහා දෛනිකව වැය වන සියලු වියදම් ද මෙයට ඇතුළත් වේ.

අයිරා පොලී වියදම ඇති වූ අවස්ථාවන් හි දී එය මූල්‍ය ගෙවීම් යටතේ ආදායම් ප්‍රකාශයට ඇතුළත් කරනු ලැබේ.

## 3.17 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කරන්නේ වක්‍ර ක්‍රමය භාවිත කරමිනි. මුදල් හා මුදල් සමාන දෑ සමන්විත වනුයේ අත ඇති මුදල් හා බැංකු ජංගම ගිණුමේ ශේෂයෙනි.

## 3.18 ශේෂ පත්‍ර දිනෙන් පසු සිදුවීම්

ශේෂ පත්‍රය සකස් කළ පසු සිදු වූ සියලු ප්‍රමාණාත්මක සිදුවීම් සැලකිල්ලට ගෙන අනාවරණය කිරීම හෝ ගැලපීම සිදු කොට ඇත.

## 3.19 රූපවාහිනී සමාජ සුභසාධන අරමුදල (සුනාමි)

2004 වර්ෂයේ සුනාමි උවදුරෙන් අනතුරුව දියත් කළ විවිධ ව්‍යාපෘති මගින් පොදු මහජනතාවගෙන් එකතු කළ මුදලින් සමාජ සුභ සාධන අරමුදල සමන්විත ව ඇත.

**7 වගුව - 2014.12.31 දිනට සමාජ සුභ සාධන අරමුදලේ ශේෂය**

**රු.'000වලින්**

| | |
|---|---|
| 2014/01/01 දිනට ශේෂය | 1,037,094 |
| කාලපරිච්ඡේදය සඳහා පොලිය | 13,609 |
| 2014 වර්ෂය අවසානයේ අරමුදල් ශේෂය | 1,050,703 |

සමාජ සුභ සාධන අරමුදල මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ කොටසක් වශයෙන් ඇතුළත් කර ඇත.

## 4. අස්පෘශ්‍ය වත්කම් (කර්තෘභාගය වෙනුවෙන් ගෙවීම)

වැඩසටහන් විකාශන අයිතිය වෙනුවෙන් ගෙවීමට සිදුවන කර්තෘභාගය (දේශීය හෝ විදේශීය) හෝ සංස්ථාව නිෂ්පාදනය කරන නිෂ්පාදනවල (ටෙලි නාට්‍ය, චලන රූප, චිත්‍රපට හා වෙනත්) වියදම LKAS 38 ට අනුව අස්පෘශ්‍ය වත්කමක් ලෙස සලකන අතර එසේ සැලකීමට නම් හඳුනාගැනීමේ හැකියාව, පාලනය කළ හැකි බව සහ අනාගතයේ දී ආර්ථිකමය ප්‍රතිලාභ ලබාගත හැකිවීම යන සාධක 3 සම්පූර්ණ විය යුතුය. එසේ වන අස්පෘශ්‍ය වත්කම් පහත ප්‍රතිපත්තිවලට අනුව ක්‍රමක්ෂය කළ යුතු වේ.

**8 වගුව - ඒ - ලබාගත් හෝ මිල දී ගත් මෙන්ම සංස්ථාව තුළ නිපදවූ නිෂ්පාදන ක්‍රමක්ෂය කළ යුතු ප්‍රතිපත්තිය**

| වර්ගය | ක්‍රමක්ෂය ප්‍රතිපත්ති |
|---|---|
| ලබාගත් හෝ මිල දී ගත් දේශීය ටෙලි නාට්‍ය හා චිත්‍රපට | කොන්ත්‍රාත් ගිවිසුම් කාලපරිච්ඡේදය තුළ දී නියමිත වාර ගණන විකාශය කිරීමට නොහැකි වූ විට ඉතිරි වන කතෘභාග සඳහා වැය කළ වියදම ගිවිසුම් කාලපරිච්ඡේදය අවසානයේ වියදමක් වශයෙන් සැලකිය යුතුය. |
| ලබාගත් හෝ මිල දී ගත් දේශීය ටෙලි නාට්‍ය හා චිත්‍රපට නොවන දේශීය වැඩසටහන් | කොන්ත්‍රාත් ගිවිසුම් කාලපරිච්ඡේදය තුළ දී නියමිත වාර ගණන විකාශය කිරීමට නොහැකි වූ විට ඉතිරි වන කතෘභාග සඳහා වැය කළ වියදම ගිවිසුම් කාලපරිච්ඡේදය අවසානයේ වියදමක් වශයෙන් සැලකිය යුතුය. |
| ලබාගත් හෝ මිල දී ගත් විදේශීය චිත්‍රපට හෝ සංගීත වැඩසටහන් | කොන්ත්‍රාත් ගිවිසුම් කාලපරිච්ඡේදය තුළ දී නියමිත වාර ගණන විකාශය කිරීමට නොහැකි වූ විට ඉතිරි වන කතෘභාග සඳහා වැය කළ වියදම ගිවිසුම් කාලපරිච්ඡේදය අවසානයේ වියදමක් වශයෙන් සැලකිය යුතුය. |
| ලබාගත් හෝ මිල දී ගත් විදේශීය චිත්‍රපට හා සංගීත වැඩසටහන් නොවන විදේශීය වැඩසටහන් | කොන්ත්‍රාත් ගිවිසුම් කාලපරිච්ඡේදය තුළ දී නියමිත වාර ගණන විකාශය කිරීමට නොහැකි වූ විට ඉතිරි වන කතෘභාග සඳහා වැය කළ වියදම ගිවිසුම් කාලපරිච්ඡේදය අවසානයේ වියදමක් වශයෙන් සැලකිය යුතුය. |
| සංස්ථාව නිෂ්පාදනය කරන ටෙලි නාට්‍ය | පළමුවර විකාශය කරන විට වියදමෙන් 50% ක් ද, ඉතිරි 50% වසර 10 ඇතුළත සමාන වාරික වලින් ද ක්ෂය කළ යුතුය. |
| සංස්ථාව විසින් නිෂ්පාදනය කරන ටෙලි නාට්‍ය නොවන වැඩසටහන් | පළමුවර විකාශය කරන විට වියදමෙන් 50% ක් ද, ඉතිරි 50% වසර 10 ඇතුළත සමාන වාරික වලින් ද ක්ෂය කළ යුතුය. |

| | |
|---|---|
| **ගිවිසුමෙහි ගිවිසුම වලංගු කාලය පිළිබඳ සීමා කිරීමක් නොකළ මිල දී ගත් හෝ ලබාගත් විදේශීය චිත්‍රපට හා සංගීත වැඩසටහන්** | පළමුවර විකාශය කරන විට වියදමෙන් 50% ක් ද, ඉතිරි 50% වසර 10 ඇතුළත සමාන වාරික වලින් ද ක්ෂය කළ යුතුය. |
| **ගිවිසුමෙහි ගිවිසුම වලංගු කාලය පිළිබඳ සීමා කිරීමක් නොකළ මිල දී ගත් හෝ ලබාගත් විදේශීය චිත්‍රපට හා සංගීත වැඩසටහන් නොවන වැඩසටහන්** | පළමුවර විකාශය කරන විට වියදමෙන් 50% ක් ද, ඉතිරි 50% වසර 10 ඇතුළත සමාන වාරික වලින් ද ක්ෂය කළ යුතුය. |

හඳුනාගැනීමේ හැකියාව, පාලනය කළ හැකි බව හා අනාගතයේ දී ආර්ථිකමය ප්‍රතිලාභ ලබාගත හැකිවීම යන සාධක 3 න් එකක් හෝ කිහිපයක් සම්පූර්ණ නොවන වැඩසටහන්වල කර්තෘභාග වියදම (පළමු විකාශයෙන් පසු) ගිණුම්වලට සලකා බලයි.

## 9 වගුව - කර්තෘභාග ගාස්තු

**රු.'000වලින්**

| | මිල දී ගත් ටෙලි නාට්‍ය | මිල දී ගත් විදේශීය වැඩසටහන් | සංස්ථාව නිෂ්පාදනය කළ ටෙලි නාට්‍ය | දේශීය වැඩසටහන් විකාශය නොවූ | නොනිමි තොගයේ ඇතුළත් දේශීය වැඩසටහන් | සංස්ථාව නිපදවන වෙනත් නිෂ්පාදන |
|---|---|---|---|---|---|---|
| **2014/01/01 ශේෂය** | 148,614,535 | 27,277,479 | 35,828,846 | 7,200,060 | 2,070,127 | 20,737,482 |
| **එකතු කිරීම** | 72,655,766 | 15,672,992 | 4,794,717 | 2,989,847 | - | 10,834,414 |
| **2014 වර්ෂය සඳහා ක්‍රමක්ෂය** | (73,616,002) | (13,328,535) | (3,815,787) | (7,200,060) | (2,070,127) | (2,191,220) |
| **2014/12/31 ශේෂය** | **147,654,299** | **29,621,936** | **36,807,776** | **2,989,847** | **-** | **29,380,676** |

## 5. අයිරා පහසුකම් සඳහා වූ සුරකුම්

අයිරා පහසුකමෙහි හා ණයවර ලිපියේ ශුන්‍ය ආන්තිකයේ ප්‍රමාණය මත පදනම්ව, බැංකුව වෙත සංස්ථාව විසින් යම් සුරකුමක් ලබාදීම අවශ්‍ය විය හැක.එබැවින්, අයිරා පහසුකම් හා ණයවර ලිපි ශුන්‍ය ආන්තික පහසුකම ලබාගනු පිණිස බැංකුව වෙත (ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 1 ප්‍රකාර) සුරකුම් වශයෙන් සංස්ථාව විසින් රු. මිලියන 113 ක ස්ථාවර තැන්පතු ප්‍රමාණයක් හා රු. මිලියන 150 ක වටිනාකමකින් යුත් භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණයක් ලබාදෙන ලදී.

## 6. ආයෝජන ආදායම්

**10 වගුව - ආයෝජන ආදායම් 2014**

| ආයෝජන වර්ගය | වටිනාකම |
|---|---|
| භාණ්ඩාගාර බිල්පත් (ලංකා බැංකුව) | 13,353,648 |
| ස්ථාවර තැන්පතු (ලංකා බැංකුව) | 14,196,720 |
| රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ ස්ථාවර තැන්පතු | 1,783,348 |
| රාජ්‍ය ආයතනවල අතිරික්ත අරමුදල් සඳහා වන තාවකාලික භාරකාර අරමුදල | 2,780,123 |
| විශේෂ නිවාස ණය යෝජනා ක්‍රමය (රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව) | 60,310 |
| ඉතිරි කිරීමේ ගිණුම (ලංකා බැංකුව) | 2,260 |
| **මුළු ආයෝජන ආදායම** | **32,176,410** |

## 7.තීරණාත්මක ගිණුම්කරණ ඇස්තමේන්තු හා තීන්දු

ඇස්තමේන්තු හා තීන්දු නොකඩවා ඇගයීමට ලක් කෙරෙන අතර පවත්නා තත්ත්වයන් යටතේ යුක්ති සහගත යැයි විශ්වාස කරන්නාවූ අනාගත සිදුවීම් පිළිබඳ අපේක්ෂාවන්ද ඇතුළත් ඓතිහාසික අත්දැකීම් හා සෙසු සාධක මත පදනම් වේ.

## තීරණාත්මක ගිණුම්කරණ ඇස්තමේන්තු හා උපකල්පන

සංස්ථාව විසින් අනාගතයට අදාළ වන්නාවූ ඇස්තමේන්තු හා උපකල්පනයන්සිදු කරනු ලබයි. එහි ප්‍රතිඵලයක් ලෙස ඇතිවන්නාවූ ගිණුම්කරණ ඇස්තමේන්තු නිර්වචනානුකූලවම, ආශ්‍රිත සැබෑ ප්‍රතිඵලයනට සමාන වනුයේ කලාතුරකිනි.එළැඹෙන මූල්‍ය වර්ෂය ඇතුළත පවත්නා ආශ්‍රිත වත්කම් හා බැරතම් ප්‍රමාණයන් කෙරෙහි ද්‍රව්‍යාත්මක ගැලපීමක් සිදුකිරීමේ සැලකිය යුතු අවදානමක් ඇති ඇස්තමේන්තු හා උපකල්පනයන් පහත ආමන්ත්‍රණය කරනු ලැබ ඇත.

### (අ) ආදායම් බදු

විවිධාකාර වූ අධිකරණමය බල ක්ෂේත්‍ර වෙත ආදායම් බදු ගෙවීමට සංස්ථාව යටත් වේ. ආදායම් බදු සඳහා වූ ලෝක ව්‍යාප්ත ප්‍රතිපාදන තීරණය කිරීම උදෙසා සැලකිය යුතු තීන්දු, තීරණ ගැනීමේ හැකියාවක් පැවතිය යුතුය. අවසන් බදු පිළිබඳ තීරණය අවිනිශ්චිත වූ බොහෝ ගනුදෙනු හා ගණනය කිරීම් පවතී. සමාගම විසින් අතිරේක බදු ගෙවීමට සිදුවනු ඇත්තේද යන්න පිළිබඳව වූ ඇස්තමේන්තු මත පදනම්ව අපේක්ෂිත බදු විගණන ගැටලු ආශ්‍රිත වගනීම් හඳුනාගනු ලබයි.ආරම්භක වශයෙන් සටහන් කරන ලද්දාවූ සංඛ්‍යාවනට වඩා මෙකී කරුණුවලට අදාළ අවසන් බදු ප්‍රතිඵලය වෙනස් වන්නාවූ තැන්හි, එබදු විෂමතාවයන් එම තීරණ ගනු ලැබූ කාලයට අදාළ ජංගම හා උපලබ්ධිගත ආදායම් බදු වත්කම් වෙත බලපෑමක් සිදු කරනු ඇත.

### (ආ) විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ

විශ්‍රාම වැටුප් බැඳීම්හි වර්තමාන වටිනාකම උපකල්පන ගණනාවක් භාවිතයෙන් ආයුසණක පදනමක් මත තීරණය කරන්නාවූ සාධක ගණනාවක් මත රඳා පවතී. විශ්‍රාම වැටුප් සඳහා වූ ශුද්ධ පිරිවැය (ආදායම) තීරණය කිරීමෙහි ලා භාවිත කෙරෙන උපකල්පන තුළට වට්ටම් අනුපාතද ඇතුළත් වේ. මෙකී උපකල්පනයන්හි යම් වෙනස්වීමක් සිදු වුවහොත් එය විශ්‍රාම වැටුප් පිළිබඳ වගකීම්හි පවත්නා ප්‍රමාණයට බලපානු ඇත.

සංස්ථාව විසින් ඒ ඒ වර්ෂයාවසානයේදී සුදුසු වට්ටම් අනුපාතය තීරණය කරනු ලබයි. මෙය වූ කලී විශ්‍රාම වැටුප් වගකීම් පියවීම සඳහා අවශ්‍ය වනු ඇතැයි අපේක්ෂා කරන්නාවූ ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයේ වර්තමාන අගය තීරණය කිරීමට භාවිත කළ යුතු පොළී අනුපාතිකයයි.

විශ්‍රාම වැටුප් වගකීම් ආශ්‍රිත සෙසු ප්‍රධාන උපකල්පන යම් පමණකට වර්තමාන වෙළඳපළ තත්ත්වයන් මත පදනම් වේ.

### (ඇ) ව්‍යුත්පන්නයන්ගේ හා සෙසු මූල්‍යායෝපකරණයන්ගේ සාධාරණ අගය

සක්‍රිය වෙළඳපලක් තුළ අලෙවි නොකෙරෙන මූල්‍ය උපකරණයන්හි සාධාරණ අගය තක්සේරු ශිල්ප ක්‍රම භාවිතයෙන් තීරණය කෙරේ. ක්‍රම ගණනාවක් තෝරා ගැනීමට හා වාර්තාකරනු ලබන ඒ ඒ කාල

පරිච්ඡේදය අවසන පවත්නා වෙළඳපල තත්ත්වයන් මත ප්‍රධාන වශයෙන් රඳා පවත්නා උපකල්පන සිදු කිරීමට සංස්ථාව විසින් ස්වකීය තීන්දු භාවිත කරනු ලබයි. සක්‍රීය වෙළඳපලයන්හි ආලෙවි නොකෙරෙන්නාවූ අලෙවිය සඳහා පවත්නා විවිධ මූල්‍යමය වත්කමක් සඳහා සංස්ථාව විසින් වට්ටම්ගත මුදල් ප්‍රවාහ විග්‍රහය යොදාගෙන ඇත.

## 8. මූල්‍ය අවදානම් කළමනාකරණය

### 8.1 මූල්‍ය අවදානම් සාධක

සංස්ථාවේ ක්‍රියාකාරකම් විසින් එය මූල්‍යමය අවදානම් ගණනාවක් වෙත නිරාකරණය කරනු ලබයි. වෙළඳපල අවදානම, ණය අවදානම හා ද්‍රවශීලතා අවදානම වශයෙනි. අවදානම් කළමනාකරණය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරනු ලබන ප්‍රතිපත්ති යටතේ කළමනාකාරිත්වය විසින් සිදු කරනු ලබයි. කළමනාකාරිත්වය නිතිපතා මූල්‍ය අවදානම් තත්ත්ව හඳුනාගැනීම හා ඇගයුම්කරණය කරයි.

### 8.2 වෙළඳපල අවදානම්

**i) විදේශ විනිමය අවදානම**

ආයතනයේ ක්‍රියාත්මක නොවන මුදල් වර්ගයක් මගින් අනාගතයේ හඳුනාගත් වත්කම් හා වගකීම් දැක්වෙන අවස්ථාවන්හි විදේශ විනිමය අවදානම ඉස්මතු වේ.සංස්ථාව සතුව විදේශ මුදල් මගින් පෙන්වනු ලබන ලැබිය යුතු හෝ ගෙවිය යුතු දේ නොමැති බැවින් සංස්ථාව විදේශ විනිමය අවදානමකට නිරාවරණයව නොපවතී

**ii) පොළී අනුපාතික අවදානම**

නිරපේක්ෂ පොළී අනුපාතික මට්ටමෙහි සිදුවන විපර්යාස හේතුකොට සිදුවන හානිකර මූල්‍ය බලපෑමක අවදානම පොළී අනුපාතික අවදානම වශයෙන් හැඳින්වේ.සංස්ථාව විෂයයෙහි ශේෂ පත්‍ර දිනය වන විට පොළී ගෙවිය යුතුව පවත්නා ණය ගැනීම් නොමැත. පොළීගෙවිය යුතුව පවත්නා එකම උපකරණය වන භාණ්ඩාගාර බිල්පත් මත කර ඇති ආයෝජනය හා කල්බදු වගකීම එතරම් වැදගත් නොවේ. එබැවින් පොළී අනුපාතික අවදානම දැරිය හැකි මට්ටමක පවතී.

**iii) මිල අවදානම**

වෙළඳ භාණ්ඩයන්හි හා සම කොටස් මිල ගණන්වල වෙනස්වීම් හේතුකොට ඇතිවන්නාවූ හානිකර මූල්‍ය බලපෑමේ අවදානම මිල අවදානම වශයෙන් හැඳින්වේ.අලෙවිය සඳහා පවත්නා කොටස් වශයෙන් කාණ්ඩගත ලැයිස්තුගත නොකළ කොටස්හි සංස්ථාව විසින්

ආයෝජනය කර ඇත්තේ වුවද, මෙකී කොටස් සක්‍රීය වෙළඳපලක අලෙවි නොකරන බැවින් සංස්ථාව මිල අවදානමකට නිරාවරණයව නොමැත.

### 8.3 ණය අවදානම

මුදල් හා මුදල් සමාන දේ, බැංකු හා මූල්‍යායතනයන්හි තැන්පතු මෙන්ම ශේෂව පවත්නා ලැබිය යුතු දේ හා ඉටුකළ ගනුදෙනුද ඇතුළත් පාරිභෝගිකයන් වෙත වූ ණය නිරාවරණයන්ද වෙතින් ණය අවදානම ඉස්මතු වේ. ප්‍රමිතිගත ගෙවීම් හා සේවා සම්පාදන නියමයන් හා කොන්දේසි ලබා දීමට ප්‍රථම ස්වකීය එක් එක් නව සේවාදායකයා වෙත ණය අවදානම කළමනාකරණය හා විග්‍රහ කිරීම ඒ ඒ නිලධාරියාගේ වගකීම වේ.

| | 2014 | 2013 |
|---|---|---|
| | රු. 000 | රු. 000 |
| ණය කාලසීමාව ඇතුළත | | |
| මාස 0 – 1 | 153,791 | 161,421 |
| පෙර සිට අයවිය යුතු | | |
| මාස 1 – 3 | 255,100 | 288,710 |
| මාස 3 – 6 | 46,424 | 31,407 |
| මාස 6 ට වැඩි | 108,135 | 99,092 |
| ලැබිය යුතු සමස්ත වෙළඳ අය | 563,450 | 580,630 |
| අපචය | (71,042) | (64,162) |
| ශුද්ධ වෙළඳමය ලැබිය යුතු දේ | 492,408 | 516,468 |
| | ====== | ====== |

**9. ආශ්‍රිත පාර්ශව හෙළිදරව් කිරීම්**

ශ්‍රී.ල.ගි.ප්‍ර 24 ට අනුව සම්බන්ධිත පාර්ශව සමඟ සංස්ථාව සිදු කරන සාමාන්‍ය ව්‍යාපාරික ගනුදෙනු පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| අනු අංකය | නම | තනතුර | ආශ්‍රිත පාර්ශවවල ගනුදෙනුවේ ස්වභාවය | ලිපිනය |
|---|---|---|---|---|
| 01 | විමලසේන රූබසිංහ මහතා | සභාපති | ආශ්‍රිත පාර්ශව වල ගනුදෙනු නැත. | නො. 101/24, D,3 වන පටුමග,එගොඩවත්ත පාර, බොරලැස්ගමුව. |
| 02 | එඩ්වඩ් ජයකොඩි මහතා | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික සහකාර අධ්‍යක්ෂ - අධ්‍යාපන අමාත්‍යාංශය | 1. රණවිරු රියල් ස්ටාර් වැඩසටහනේ විනිශ්චය මණ්ඩල සාමාජිකයෙකු ලෙස කටයුතු කිරීම රු. 2,037,825/- | 52,ආරියදාස පීරිස් මාවත, නුගේගොඩ |
| 03 | මහාචාර්ය රෝහණ ලක්ෂ්මන් පියදාස | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය | මාධ්‍ය හා සංවර්ධන මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ ජනරාල් ලෙස, එම ආයතනය විසින් නිෂ්පාදිත වාර්තා වැඩසටහනක් සඳහා කතෘභාගය - රු.1,649,975.01 | 37, පළමු පටුමග, අරුප්පොල, නුවර |
| 04 | අනුලා හරස්ගම මිය | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික අධ්‍යක්ෂ ජනරාල් (තොරතුරු තාක්ෂණ හා කළමනාකරණ දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරය) | ආශ්‍රිත පාර්ශව ගනුදෙනු නැත. | අධ්‍යක්ෂ ජනරාල්, තොරතුරු හා කළමනාකරණ දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරය, කොළඹ 01. |
| 05 | හඩ්සන් සමරසිංහ මහතා | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික සභාපති - ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව | ආශ්‍රිත පාර්ශව ගනුදෙනු නැත. | නො.255/B11,ටොරින්ටන් උද්‍යානය,ටොරින්ටන් ඇවනියු, කොළඹ 07 |

| | | | | |
|---|---|---|---|---|
| **06** | අශෝක සේරසිංහ මහතා | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික සභාපති - ජාතික චිත්‍රපට සංස්ථාව | ආශ්‍රිත පාර්ශව ගනුදෙනු නැත. | නො. 30, පාසල් පටුමග, කළුබෝවිල |
| **07** | චන්ද්‍රපාල ලියනගේ මහතා | අධ්‍යක්ෂ ජනරාල් | ආශ්‍රිත පාර්ශව ගනුදෙනු නැත. | 43/23 A, පැපිලියාන මාවත,කොහුවල |
| **08** | ගාමිණී සෝමචන්ද්‍ර රාසපුත්‍ර මහතා | ප්‍රධාන විධායක නිලධාරි | ආශ්‍රිත පාර්ශව ගනුදෙනු නැත. | "වනමලී", පරණ පාර, බරවාකුඹුක |
| **09** | රොහාන් සරත්චන්ද්‍ර පෙරේරා මහතා | නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (ඉංජිනේරු) | ආශ්‍රිත පාර්ශව ගනුදෙනු නැත. | 24, ශ්‍රී සුමංගල පාර, රත්මලාන |
| **10** | එම්.එස්.දළුගොඩ මහතා | ප්‍රධාන ගණකාධිකාරී | ආශ්‍රිත පාර්ශව ගනුදෙනු නැත. | නො. 24/3B, 1වන හරස් වීදිය, පාගොඩ පාර, නුගේගොඩ |
| **11** | පී බී ජී සුමේධ අතුලසිරි මහතා | නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (නිෂ්පාදන සේවා) | ආශ්‍රිත පාර්ශව ගනුදෙනු නැත. | 234/J, කදුරුගහවත්ත වීදිය, කොටිකාවත්ත |
| **12** | නිශාන්ත උබයවංශ මහතා | නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (වැඩසටහන්) | ආශ්‍රිත පාර්ශව ගනුදෙනු නැත. | 71 ඊ , ඉහළගම, ගම්පහ |
| **13** | ජී. සී. රෝෂන් මහතා | අධ්‍යක්ෂ (පරිපාලන) | ආශ්‍රිත පාර්ශව ගනුදෙනු නැත. | 723/2/3, ලේක් ටෙරස්, අතුරුගිරිය. |
| **14** | එන්. ඒ.අයි.එන්. කේ. නිශ්ශංක මහතා | අධ්‍යක්ෂ (ප්‍රවෘත්ති හා කාලීන සිදුවීම්) | ආශ්‍රිත පාර්ශව ගනුදෙනු නැත | 366 C 10, සුභද්‍රපුර,හොරණ පාර, ගෝනපොල. |
| **15** | සනත් දළුවත්ත මහතා | අධ්‍යක්ෂ (අලෙවි) | ආශ්‍රිත පාර්ශව ගනුදෙනු නැත. | නො.128, අල්විස් ටවුන්, වත්තල. |
| **16** | එරින් විජේකෝන් මිය | අධ්‍යක්ෂ (අධ්‍යාපන වැඩසටහන්) | ආශ්‍රිත පාර්ශව ගනුදෙනු නැත. | නො. 29, යූ. ඊ. පෙරේරා මාවත, රාජගිරිය. |

# මූල්‍ය ප්‍රකාශ හා සම්බන්ධිත සටහන්

## 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

| | 2014 දෙසැම්බර් 31 | 2013 දෙසැම්බර් 31 |
|---|---|---|
| **01.** ආදායම | | |
| රූපවාහිනී ගුවන්කාල අලෙවිය - චැනල් 1 | 1,428,421,321 | 1,622,049,189 |
| රූපවාහිනී ගුවන්කාල අලෙවිය - චැනල් අයි | 328,932,740 | 221,848,566 |
| රූපවාහිනී ගුවන්කාල අලෙවිය - ප්‍රති වෙළඳ ගිවිසුම් | 46,566,500 | 80,022,125 |
| ගුවන්කාල අලෙවිය මත ජාතිය ගොඩනැගීමේ බද්ද | 29,757,120 | 31,944,567 |
| මුළු ආදායම | **1,833,677,681** | **1,955,864,447** |
| **02.** වෙනත් මෙහෙයුම් ආදායම් | | |
| නිෂ්පාදන ආදායම | 87,345,686 | 90,131,922 |
| ආයෝජන ආදායම (8 වන වගුව බලන්න) | 32,176,410 | 50,484,233 |
| හුවමාරු ගාස්තු | 731,788 | 1,034,018 |
| වත්කම් විකිණීමෙන් ලාභය | 999 | 439,858 |
| ආපනශාලාවෙන් කුලිය | 39,000 | 36,000 |
| දෙපාර්තමේන්තුවේ දඩ මුදල් | 1,512,342 | 1,445,872 |
| සේවක ණය පොලිය | 6,838,119 | 6,532,566 |
| විවිධ ආදායම් | 3,339,997 | 6,843,085 |
| විදේශ ආධාර ක්‍රමක්ෂය | 15,903,664 | 15,903,664 |
| ආපසු නොගෙවන ටෙන්ඩර් තැන්පතු | 292,475 | 357,232 |
| ලියාපදිංචි කිරීමේ ගාස්තු | 196,968 | 171,993 |
| වැඩසටහන් ද්‍රව්‍ය අලෙවිය | 2,717,919 | 4,062,519 |
| ලියාපදිංචි කිරීමේ ගාස්තුව රූපවාහිනී අලෙවිකරුවන් | 4,000 | 19,030 |
| සංස්ථා පහසුකම් පරිහරණය (විදේශීය) | 1,055,495 | 1,084,498 |
| සංස්ථා පහසුකම් පරිහරණය (දේශීය) | 5,974,963 | 10,781,615 |
| දැයට කිරුළ පොත් සහරා විකිණීමෙන් ලද ආදායම | 325,759 | 575,775 |
| නැණ මිහිර ප්‍රශ්න පත්‍ර විකිණීමෙන් ලද ආදායම | 3,612,254 | 3,008,967 |
| විනිමය හුවමාරු ලාභය | 585 | 98 |

| | | |
|---|---|---|
| සහරා අලෙවිය | - | 2,411 |
| අලෙවි ප්‍රවර්ධන ආදායම් | 136,804 | 5,306,357 |
| සේවාලාභීන් ප්‍රතිපූර්ණය කළ වෙනත් ගාස්තු | - | 471,005 |
| රජයේ ප්‍රදානය | - | 9,000,000 |
| ඩිප්ලෝමා පාඨමාලා පැවැත්වීමෙන් ලද ආදායම | 975,684 | - |
| **මුළු වෙනත් මෙහෙයුම් ආදායම්** | **163,180,910** | **207,692,717** |
| **3.විකුණුම් පිරිවැය** | | |
| **3.1 අධ්‍යාපන වැඩසටහන් වියදම්** | | |
| ශිල්පීය ගාස්තු | 6,459,530 | 7,213,447 |
| සංග්‍රහ වියදම් | 1,781,234 | 2,.600,517 |
| වේශ නිරූපන ද්‍රව්‍ය | 171,963 | 292,869 |
| වෙනත් වියදම් | 462,106 | 426,177 |
| මාධ්‍යරූප හා සජීවීකරණ ද්‍රව්‍ය | 3,357 | 65,729 |
| වේදිකා නිර්මාණය | 2,511,820 | 3,528,342 |
| දෘශ්‍ය කැසට්පට සහ ටේප් | 591,045 | 932,128 |
| ප්‍රවාහන පහසුකම් කුලියට ගැනීම | 337,380 | 724,000 |
| උපකරණ කුලියට ගැනීම | 3,203,498 | 1,768,189 |
| පහසුකම් (රඟහල) කුලියට ගැනීම | 895,153 | 1,755,655 |
| ශබ්ද උපකරණ කුලියට ගැනීම | 258,500 | 69,843 |
| විදුලිය | 11,800 | 36,000 |
| මෝටර් රථ සඳහා ඉන්ධන | 9,993 | - |
| ජෙනරේටර් සඳහා ඉන්ධන | 10,000 | - |
| නවාතැන් | 3,163,480 | 3,224,707 |
| නිශ්චල ඡායාරූප | 1,000 | - |
| ගමන් වියදම් හා යැපීම් දීමනා | 1,598,155 | 1,887,619 |
| වැඩසටහන් පිටපත් හා රූපවාහිනී විකාශන අයිතිය මිල දී ගැනීම | 4,830,000 | - |
| රූගත ස්ථාන කුලියට ගැනීම | 4,000 | 55,500 |
| විශේෂ අයිතම | 1,441,825 | 1,964,000 |
| **අධ්‍යාපන වැඩසටහන් වියදම්** | **27,745,839** | **26.544.722** |

| | | |
|---|---|---|
| වැනල් අයි | | |
| ශිල්පීය ගාස්තු | 5,583,483 | 4,763,625 |
| පූර්ව දර්ශන හා නිරීක්ෂණ ගාස්තු | - | 10,000 |
| සංග්‍රහ වියදම් | 629,450 | 246,780 |
| උපකරණ කුලියට ගැනීම | 1,488,500 | 1,736,750 |
| නිශ්චල ඡායාරූප | 50,000 | - |
| ශබ්ද උපකරණ කුලියට ගැනීම | 98,300 | 1,030,600 |
| විදුලිය | 13,000 | - |
| වෙනත් වියදම් | 379,968 | 477,.869 |
| ගමන් වියදම් හා යැපීම් දීමනාව | 604,931 | 450,400 |
| ලිපි ද්‍රව්‍ය | - | 1.160 |
| වැඩසටහන් ද්‍රව්‍ය මිලදී ගැනීම (විදේශීය) | 27,490,946 | 25,239,343 |
| නවාතැන් | 963,375 | 557,600 |
| දෘශ්‍ය කැසට් පට සහ ටේප් | 184,262 | 243,756 |
| ගුවන් විදුලි සංස්ථාවේ විකාශණ කුළුණ භාවිතා කිරීමේ කුලිය | 3,575,476 | 3,524,694 |
| විදුලි බිල්පත් ප්‍රතිපූර්ණය - ගුවන් විදුලි සංස්ථාව | 2,167,539 | 2,101,026 |
| වේදිකා නිර්මාණය හා පසුතල නිර්මාණය | 725,595 | 79,464 |
| පහසුකම් කුලියට ගැනීම (වේදිකා/ශබ්ද) | 683,016 | - |
| රූගත ස්ථාන කුලියට ගැනීම / ඉසව් | 20,000 | 3,000 |
| මාධ්‍යරූප හා සජීවිකරණ ද්‍රව්‍ය | 3,357 | - |
| විශේෂ අයිතම | 800,000 | - |
| විශේෂ ගෙවීම - ඉංග්‍රීසි ප්‍රවෘත්ති | 621,600 | - |
| **වැනල් අයි වැඩසටහන් වියදම්** | **46,082,798** | **40,466,067** |
| **3.2 විවිධ වැඩසටහන් වියදම්** | | |
| ශිල්පීය ගෙවීම් | 23,709,816 | 29,093,396 |
| පූර්ව දර්ශන හා නිරීක්ෂණ ගාස්තු | 303,200 | 449,900 |
| සංග්‍රහ වියදම් | 3,383,033 | 4,337,515 |
| වැඩසටහන් පිටපත් හා රූපවාහිනී විකාශන අයිතිය මිල දී ගැනීම | 187,805,137 | 128,465,381 |
| වේදිකා නිර්මාණය, රූගත ස්ථාන පසුතල ආම්පන්න | 2,131,046 | 1,795,633 |
| වේශ නිරූපන ද්‍රව්‍ය | 124,171 | 292,869 |

| | | |
|---|---|---|
| දෘශ්‍ය කැසට් පට සහ ටේප් | 2,561,349 | 1,608,847 |
| මාධ්‍යරූප හා සජීවීකරණ ද්‍රව්‍ය | 2,793 | 65,729 |
| නිශ්චල ඡායාරූප | 95,587 | 65,426 |
| උපකරණ පහසුකම් කුලියට ගැනීම | 7,504,385 | 6,993,405 |
| වෙනත් වියදම් | 2,199,250 | 2,225,489 |
| වැඩසටහන් ද්‍රව්‍ය මිලදී ගැනීම (විදේශීය) | 8,121,142 | 8,665,371 |
| ගමන් වියදම් හා යැපීම් දීමනාව | 3,633,177 | 3,194,493 |
| විශේෂ අයිතම | - | 181,311 |
| නවාතැන් ගාස්තු | 5,564,664 | 5,506,148 |
| විදුලිය | 251,907 | 384,133 |
| චිත්‍රාගාර පහසුකම් කුලියට ගැනීම (ශබ්ද) | 1,781,455 | 1,095,311 |
| ශබ්ද උපකරණ කුලියට ගැනීම | 619,350 | 1,405,500 |
| ප්‍රවාහන පහසුකම් කුලියට ගැනීම | 790,100 | 2,013,453 |
| ජෙනරේටර් සඳහා ඉන්ධන | 14,520 | - |
| රූගත කරන ස්ථාන කුලියට ගැනීම/ඉසව් | 471,845 | 628,328 |
| චන්ද්‍රිකා පිරිවැය | 2,400 | - |
| **විවිධ වැඩසටහන් වියදම්** | **251,070,327** | **198,467,637** |
| **3.3 ප්‍රවෘත්ති වැඩසටහන් වියදම්** | | |
| ප්‍රවෘත්ති ඉදිරිපත් කරන්නන් /සංස්කාරකවරුන් වෙත ගෙවීම් | 6,212,300 | 6,419,135 |
| ප්‍රවෘත්ති රැස්කිරීම - දේශීය | 21,607,500 | 19,763,900 |
| ප්‍රවෘත්ති රැස්කිරීම - විදේශීය | 4,651,589 | 4,393,215 |
| වෙනත් වියදම් | 549,477 | 352,598 |
| මෝටර්රථ සඳහා ඉන්ධන | 20,000 | - |
| චන්ද්‍රිකා හා ආශ්‍රිත ගාස්තු - විදේශීය | 4,652,217 | 2,359,536 |
| ආසියානු ගුවන් විදුලි සංගමයේ ස්ථාවර හා විචල්‍ය ගාස්තු | 2.912,048 | 4,220,157 |
| කාලීන සිදුවීම් (පොදු) | 3,357 | 65,729 |
| ප්‍රවාහන පහසුකම් ගැනීම | 11,418,728 | 12,040,413 |
| වෙබ් ධාරාගත කිරීමේ සේවාවන් | 2,095,658 | 2,357,148 |
| දෘශ්‍ය පටි සහ ටේප් | 456,721 | 1,045,225 |
| සංග්‍රහ වියදම් | 1,534,726 | 2,139,064 |

| | | |
|---|---|---|
| ප්‍රවෘත්ති පසුතල නිර්මාණය | 178,187 | 3,927 |
| ශිල්පීය ගෙවීම් | 29,399,070 | 37,930,161 |
| උපකරණ පහසුකම් කුලියට ගැනීම | 23,842,142 | 20,609,643 |
| ශබ්ද උපකරණ කුලියට ගැනීම | 832,806 | 2,812,500 |
| ගමන් වියදම් හා යැපීම් දීමනාව | 2,631,850 | 2,294,468 |
| නවාතැන් පහසුකම් | 2,745,040 | 2,579,500 |
| පසුතල සහ වේදිකා නිර්මාණය | 6,424,401 | 7,740,065 |
| ප්‍රවාහන පහසුකම් කුලියට ගැනීම - කාලීන සිදුවීම් | - | 2,993,700 |
| පහසුකම් කුලියට ගැනීම (වේදිකා/ශබ්ද) | 1,134,223 | 1,164,535 |
| නිශ්චල ඡායාරූප | 110,000 | 100,000 |
| පසුතල හා රූගත ස්ථාන කුලියට ගැනීම (කාලීන සිදුවීම්) | 2,142,207 | - |
| සජීවී ධාරාගත කිරීම් | 1,656,000 | 1,656,000 |
| විශේෂ අයිතමය | 3,875,027 | 1,355,771 |
| **ප්‍රවෘත්ති වැඩසටහන් වියදම්** | **131,085,274** | **136,396,389** |
| **3.4 වාණිජ වැඩසටහන් නිෂ්පාදන වියදම්** | | |
| ශිල්පීය ගෙවීම් | 856,420 | 867,000 |
| සංග්‍රහ වියදම් | 281,180 | 115,510 |
| වේදිකා නිර්මාණය / රූගත ස්ථාන හා පසුතල ආම්පන්න | 1,217,048 | 554,300 |
| ප්‍රවාහන පහසුකම් සඳහා කුලිය | | |
| උපකරණ සඳහා කුලිය | 1,993,204 | 493,960 |
| වෙනත් වියදම් | 20,500 | 1,800 |
| ගමන් වියදම් හා යැපීම් දීමනා | 425,466 | 196,207 |
| නවාතැන් හා ඉසව් | 621,000 | 456,000 |
| ශබ්ද උපකරණ කුලියට ගැනීම | - | 20,000 |
| දෘශ්‍ය පටි හා ටේප් | 213,549 | 191,363 |
| විශේෂ අයිතමය | 43,000 | - |
| **වාණිජ වැඩසටහන් වියදම්** | **5,671,367** | **2,896,139** |
| **3.5 වෙනත් නිෂ්පාදන වියදම්** | | |
| වැටුප් හා වෙනත් දීමනා (නිෂ්පාදන කාර්යය මණ්ඩලය) | | |
| වැටුප් දීමනා - ස්ථිර සේවක | 289,676,355 | 263,789,780 |
| වැටුප් දීමනා - කොන්ත්‍රාත් | 27,431,804 | 23,337.474 |
| වැටුප් දීමනා - සහන | 12,225,733 | 13,011,855 |

| | | |
|---|---|---|
| අතිකාල | 129,014,136 | 113,827,792 |
| සේවක අර්ථ සාධක අරමුදල් සංස්ථා දායකය | 44,626,433 | 41,252,981 |
| සේවක භාරකාර අරමුදල් සංස්ථා දායකය | 8,920,606 | 8,239,787 |
| නිවාඩු දින දීමනා | 30,719,107 | 28,292,464 |
| සති අන්ත දීමනාව (විධායක) | 4,456,163 | 4,422,113 |
| දුෂ්කරතාවය/උච්චය/බරවැඩ | 4,800,709 | 4,714,991 |
| කාර්යභාර නිලධාරි/ඉංජිනේරු දීමනා | 1,218,413 | 1,122,750 |
| දිරි දීමනා | 25,034,686 | 24,649,538 |
| ආහාර දීමනාව - විධායක නොවන | 7,576,875 | 7,342,391 |
| ප්‍රවාහන දීමනාව | 15,047,464 | 15,788,537 |
| ඉතිරි වෛද්‍ය නිවාඩු සඳහා ගෙවීම් | 15,691,001 | 15,179,082 |
| ප්‍රසාද දීමනා | 33,992,711 | 33,233,389 |
| විදුලිය - (75%) | 89,998,685 | 83,763,157 |
| විදුලි ජනක යන්ත්‍ර සඳහා ඉන්ධන පිරිවැය | 1,380,855 | 1,883,404 |
| ධාවන වියදම් (75%) | 16,619,155 | 14,986,491 |
| සම්ප්‍රේෂණාගාර කුලී වියදම් | 1,931,678 | 2,218,229 |
| අලුත්වැඩියා හා නඩත්තු වියදම් - උපකරණ | 8,642,029 | 12,219,385 |
| විදේශ වැඩසටහන් මත වන බද්ද | 1,967,500 | 427,500 |
| ප්‍රති වෙළෙඳ ගිවිසුම් මත වන වියදම් | 49,112,441 | 104,335,844 |
| සංඛ්‍යාත වියදම් | 4,411,693 | 4,384,061 |
| 9 MHZ චන්ද්‍රිකා තරංග කල්බදු වියදම් | - | - |
| කොළඹ - පලාලි දෘශ්‍ය සම්ප්‍රේෂණ සබඳතාව | 1,133,330 | 1,408,786 |
| Fiber Optic සබඳතාවය කුලියට ගැනීම | 112,882 | - |
| තෙවන පාර්ශවයකින් යටිතල පහසුකම් කුලියට ගැනීම | 353,825 | 272,378 |
| | **826,096,265** | **824,104,158** |
| **3.6 ක්ෂය** | | |
| ක්ෂය | 104,135,532 | 110,728,564 |
| **මුළු විකුණුම් පිරිවැය** | **1,391,887,402** | **1,339,603,675** |
| **4.බෙදාහැරීමේ වියදම්** | | |
| නියෝජිත කොමිස් | 223,089,962 | 247,371,796 |
| ප්‍රවර්ධන වියදම් | 23,442,840 | 9,593,213 |

| | | |
|---|---|---|
| අඩමාන ණය ප්‍රතිපාදනය | | |
| - සේවක | 111,122 | 65,163 |
| - විවිධ | 44,084 | (250,225) |
| - සේවාදායක | 6,882,456 | (9,379,454) |
| **බෙදාහැරීමේ වියදම්** | **253,570,463** | **247,400,493** |
| **5.පරිපාලන වියදම්** | | |
| සාමාජික පාරිතෝෂිකය | 1,563,479 | 1,487,100 |
| වැටුප්/දීමනා - ස්ථිර කාර්ය මණ්ඩලය | 96,558,785 | 87,929,927 |
| වැටුප් / දීමනා - කොන්ත්‍රාත් | 9,143,935 | 7,779,158 |
| වැටුප් / දීමනා - සහන කාර්ය මණ්ඩලය | 4,075,244 | 4,337,285 |
| අතිකාල | 43,004,712 | 37,942,597 |
| සේවක අර්ථ සාධක අරමුදලේ සංස්ථා දායකත්වය | 14,875,478 | 13,750,994 |
| සේවක භාරකාර අරමුදලේ සංස්ථා දායකත්වය | 2,973,535 | 2,746,596 |
| නිවාඩු දින දීමනාව | 10,239,702 | 9,430,821 |
| විධායක නිලධාරීන් සඳහා සති අන්ත ගෙවීම් | 1,485,388 | 1,474,038 |
| දුෂ්කරතාව/උච්චය/ බරවැඩ | 1,600,236 | 1,571,664 |
| කාර්යභාර නිලධාරි/ ඉංජිනේරු ගාස්තු | 406,138 | 374,250 |
| වෘත්තීයවේදී විධායකයින් සඳහා සාමාජික ගාස්තු | 26,016 | 70,029 |
| විශ්‍රාම වැටුප්, වැන්දඹු හා අනත්දරු අරමුදල් සඳහා දායකත්වය | - | - |
| දිරි දීමනා | 8,344,895 | 8,216,513 |
| ආහාර දීමනා - විධායක නොවන ශ්‍රේණි සඳහා | 2,525,625 | 2,447,464 |
| ප්‍රවාහන දීමනාව | 5,015,821 | 5,262,846 |
| ඉතිරි වෛද්‍ය නිවාඩු සඳහා ගෙවීම් | 5,230,334 | 5,059,694 |
| දිරි දීමනා , පාරිතෝෂික හා වන්දි | 375,000 | 300,000 |
| ප්‍රසාද දීමනා | 11,330,904 | 11,077,796 |
| කාර්ය මණ්ඩල සුබසාධනය | 55,116 | 130,500 |
| ක්‍රීඩා සුබසාධනය සඳහා | 196,700 | 110,000 |
| කාර්ය මණ්ඩලය සඳහා නිල ඇඳුම් | 59,250 | 100,925 |
| රක්ෂණ වාරිකය - වෛද්‍ය | 30,760,681 | 29,359,410 |
| රක්ෂණ වාරිකය - හදිසි අනතුරු හා ජීවිත | 1,113,279 | 957,416 |

| | | |
|---|---|---|
| ගමන් වියදම් හා යැපීම් දීමනාව - දේශිය | 2,586,870 | 2,219,466 |
| ගමන් වියදම් හා යැපීම් දීමනාව - සැතපුම් කුලී දීමනාව | 4,143,246 | 4,310,451 |
| ගමන් වියදම් හා යැපීම් දීමනාව - විදේශිය | 16,887,496 | 5,911,159 |
| වෙනත් වියදම් - විදේශිය ගමන් | 1,278,811 | 344,009 |
| සංස්ථා සංග්‍රහ හා විනෝද කටයුතු | 2,486,256 | 1,563,252 |
| කුලී , වරිපනම් හා බදු | 15,397,605 | 15,496,073 |
| විදුලිය හා බලශක්තිය | 29,999,562 | 27,921,052 |
| දුරකථන ගාස්තු ස්ථාවර ගෙවීම් | 10,143,923 | 9,204,848 |
| ආරක්ෂක සේවා | 12,146,250 | 13,050,000 |
| තැපැල් | 943,884 | 827,691 |
| මුද්‍රණය හා ලිපිද්‍රව්‍ය | 9,006,784 | 8,777,705 |
| පුවත්පත් සහ වාර සඟරා | 2,128,433 | 2,309,175 |
| කාර්යාල අවශ්‍යතා | 1,369,264 | 2,388,430 |
| වත්කම් විකිණීමේ අලාභය | 63,915 | 3,040 |
| විනිමය හුවමාරු අලාභයන් | 21,088 | 179,718 |
| විවිධ වියදම් | 6,514,899 | 5,993,102 |
| ටෙන්ඩර් හා බඳවාගැනීම් සඳහා ප්‍රචාරක දැන්වීම් | 974,615 | 1,746,393 |
| අධිකරණයේ නඩුවලට වන්දි | 125,890 | - |
| මෝටර් වාහන ධාවන වියදම් | 5,539,718 | 4,995,497 |
| මෝටර් වාහන කුලී වියදම් | 10,240,021 | 7,215,391 |
| රක්ෂණය - ගොඩනැගිලි හා වෙනත් වත්කම් | 7,397,778 | 5,184,466 |
| බලපත්‍ර හා රක්ෂණය - මෝටර් වාහන | 1,942,955 | 1,549,004 |
| අලුත්වැඩියා සහ නඩත්තුව - ගොඩනැගිලි | 8,055,893 | 11,094,168 |
| අලුත්වැඩියා සහ නඩත්තුව - භූමිය | 1,459,359 | 1,482,867 |
| අලුත්වැඩියා සහ නඩත්තුව - වෙනත් වත්කම් | 981,253 | 1,258,863 |
| ජලය | 3,509,379 | 3,125,001 |
| අන්තර්ජාල පහසුකම් සඳහා ගාස්තු | 6,532,806 | 6,470,473 |
| පරිගණක අවශ්‍යතා | 720 | 6,925 |
| මයික්‍රොසොෆ්ට් නිෂ්පාදන සඳහා බලපත්‍ර ගාස්තුව හා වෙනත් වියදම් | 325,000 | 323,400 |
| සම්මන්ත්‍රණ හා පුහුණු වැඩසටහන් - පොදු | 866,676 | 322,675 |
| සංවත්සර සැමරුම | 1,255,325 | 1,490,177 |

| | | |
|---|---|---|
| මහජන ඇමතුම් පද්ධතිය - ගාස්තු හා කුලිය | 94,313 | 164,976 |
| මෝටර් වාහන අලුත්වැඩියාවන් | 6,578,840 | 10,270,389 |
| ප්‍රචාරණය හා ප්‍රවර්ධන වැඩකටයුතු | 190,648 | 422,771 |
| පුහුණු වියදම් (අභ්‍යන්තරික) | 1,668,601 | 1,277,417 |
| නැණමිහිර ප්‍රශ්නපත්‍ර මුද්‍රණ වියදම් | 2,678,571 | - |
| පරිත්‍යාග | 683,150 | 1,300,150 |
| පොදු රාජ්‍ය මණ්ඩලය උළෙලේ වියදම් | 676,470 | 4,798,523 |
| ජාතික අවශ්‍යතා | 2,518,539 | 1,336,126 |
| දායක මුදල් - AIBD ආයතනය | 2,468,521 | 4,950,094 |
| ක්ෂය | 49,382,768 | 49,903,130 |
| ජාතික ගොඩනැගීමේ බද්ද | 36,820,433 | 39,117,289 |
| | **519,046,780** | **492,222,353** |
| විශ්‍රාම පාරිතෝෂිකය | - | 23,758,779 |
| **පරිපාලන වියදම්** | **519,046,780** | **515,981,132** |
| **6.මූල්‍ය සහ වෙනත් ගාස්තු** | | |
| බැංකු ගාස්තු | 803,505 | 1,113,289 |
| බැංකු පොලිය -OD | 8,385,155 | 1,669,908 |
| කල්බදු පොලිය - මෝටර් රථ | 2,441,330 | 3,700,623 |
| විගණන ගාස්තු | 350,000 | 350,000 |
| නීති ගාස්තු | 2,329,673 | 4,749,097 |
| මුද්දර බද්ද | 38,485 | 51,800 |
| මූල්‍ය සහ වෙනත් කපාහැරීම් | 158,468 | - |
| උපද්ශක හා වෙනත් වෘත්තීය ගාස්තු | 328,096 | 1,068,700 |
| **මූල්‍ය සහ වෙනත් ගාස්තු** | **14,834,711** | **12,703,416** |
| **7.බදුකරණය** | | |
| **බද්දෙන් නිදහස් ලාභ සහ ආදායම්** | | |
| නැවත ආයෝජනය කරන ලද භාණ්ඩාගාර බිල්පත් වලින් 1/9 | 1,483,739 | 2,419,050 |
| හඳුනාගත් සත්‍ය උපයා ගැනීම් | | 19,912,273 |
| | **1,483,739** | **22,331,323** |

| | | |
|---|---|---|
| බද්දට පෙර ලාභය | (182,480,765) | 47,868,447 |
| ක්ෂය | 153,518,300 | 160,631,695 |
| පොලී ගෙවීම් | 10,826,485 | 5,370,531 |
| සංස්ථා සංග්‍රහ | 2,486,256 | 1,563,252 |
| පරිත්‍යාග | 683,150 | 1,300,150 |
| ප්‍රචාරය හා ප්‍රචාරක ව්‍යාපාර (25%) | 47,662 | 105,693 |
| වාණිජ ප්‍රවර්ධන වියදම් (25%) | 5,860,710 | 2,398,303 |
| වෛළෙද ප්‍රතිගිවිසුම් වියදම් (50% ක්) | 24,556,221 | 52,167,922 |
| වත්කම් ඉවත් කිරීමේ ලාභය / අලාභය | 62,916 | (436,818) |
| වත්කම් ඉවත් කිරීම් මත බදු ආශ්‍රිත ලාභය/ අලාභය | (69,019) | 411,051 |
| සංවත්සර සැමරුම් | 1,255,325 | 1,490,177 |
| පාරිතෝෂික දීමනා සඳහා ප්‍රතිපාදනය | - | 23,758,779 |
| ගෙවන ලද පාරිතෝෂිකය | (6,771,266) | (4,865,307) |
| බොල් ණය සඳහා ප්‍රතිපාදනය - විවිධ ණයගැතියෝ | 44,084 | (250,225) |
| -සේවාදායක | 6,882,456 | (9,379,454) |
| - සේවක | 111,122 | 65,163 |
| කපා හරින ලද නිශ්චිත අඩමාන ණයගැතියෝ | 158,468 | - |
| පොලී ආදායම | (32,176,410) | (50,484,233) |
| වෙනත් ආදායම | (25,909,876) | (35,392,665) |
| ප්‍රාග්ධන භාණ්ඩ සඳහා රජයේ දීමනාවෙහි ක්‍රමක්ෂය | - | (9,000,000) |
| ප්‍රාග්ධන දීමනාව | (219,136,781) | (198,640,489) |
| විදේශ ප්‍රදානයන්හි ක්‍රමක්ෂය | (15,903,664) | (15,903,664) |
| **ව්‍යාපාරික ලාභය /අලාභය** | **(275,954,628)** | **(27,221,692)** |
| පොලී ආදායම | 30,692,671 | 48,065,184 |
| වෙනත් ආදායම | 25,909,876 | 35,392,665 |
| **මුළු ව්‍යවස්ථාපිත ආදායම** | **56,602,547** | **83,457,848** |
| අලාභ (ව්‍යවස්ථාපිත ආදායමෙන් 35%) | (19,810,891) | (29,210,247) |
| පොලී ගෙවීම් | - | - |
| **තක්සේරු කළ ආදායම** | **36,791,656** | **54,247,601** |
| සුදුසුකම් ලබන ගෙවීම් - (රජයට කළ ප්‍රදානයන්) | (15,000) | (500,000) |
| **බද්දට යටත් ආදායම** | **36,776,656** | **53,747,601** |
| ආදායම් බද්ද (28%) | 10,297,464 | 15,049,328 |

| | | |
|---|---|---|
| ආදායම් බදු වගකීම් | 10,297,464 | 15,049,328 |
| විලම්භිත බද්ද | (17,646,368) | 16,269,194 |
| **ආදායම් බද්ද** | **(7,348,904)** | **31,318,522** |

# දේපල - පිරියත හා උපකරණ

රු.'000 වලින්

| සටහන | 2014.01.01 දිනට ශේෂය | එකතුවීම් | ගැලපීම් | ඉවත් කිරීම් | 2014.12.31 දිනට ශේෂය |
|---|---|---|---|---|---|
| ඉඩම් | 7,660,503 | - | | - | 7,660,503 |
| ගොඩනැගිලි | 259,330,888 | 6,386,774 | | - | 265,717,662 |
| ගෘහ භාණ්ඩ හා සවිකිරීම් | 48,060,233 | 3,312,036 | | - | 51,372,269 |
| පිරියත හා උපකරණ | 2,787,165,173 | 144,355,694 | - | (5,391) | 2,931,515,476 |
| කාර්යාලීය උපකරණ | 49,526,377 | 1,744,374 | - | - | 51,270,751 |
| විද්‍යුත් උපකරණ | 7,494,304 | 161,095 | - | - | 7,655,399 |
| රූපවාහිනී යන්ත්‍ර | 22,419,903 | 1,363,878 | - | (197,672) | 23,586,109 |
| පුස්තකාල ග්‍රන්ථ | 2,140,328 | 18,971 | - | - | 2,159,299 |
| ලුහු මෙවලම් හා උපකරණ | 3,764,478 | 184,680 | - | - | 3,949,157 |
| පරිගණක | 99,035,463 | 7,775,776 | - | - | 106,811,239 |
| වෙනත් වත්කම් | 4,124,456 | 222,054 | - | - | 4,346,510 |
| ගිණුම්කරණ මෘදුකාංග | 9,298,190 | 96,000 | - | - | 9,394,190 |
| එන්.ටී.වී චැනලය සඳහා ගත් උපකරණ | 33,159 | - | - | - | 33,159 |
| මෝටර් වාහන | 102,461,866 | - | - | - | 102,461,866 |
| සංගීත උපකරණ | 170,037 | - | - | - | 170,037 |
| කැරවෑන් රථ | 162,142 | - | - | - | 162,142 |
| ආරක්ෂිත උපකරණ | 2,169,763 | - | - | - | 2,169,763 |
| JICA ව්‍යාපෘතිය යටතේ ලද උපකරණ | 66,773,685 | - | - | - | 66,773,685 |
| Container | 1,052,000 | - | - | - | 1,052,000 |
| **වත්කම්වල මුළු වටිනාකම** | **3,472,842,947** | **165,621,332** | | **(203,063)** | **3,638,261,216** |

# ක්ෂය

රු.'000 වලින්

| සටහන | 2014.01.01 දිනට ශේෂය | එකතුවීම් (වර්ෂයට අදාල ක්ෂය) | ගැලපීම් | ඉවත් කිරීම් | 2014.12.31 දිනට ශේෂය |
|---|---|---|---|---|---|
| ඉඩම් | - | - | - | - | - |
| ගොඩනැගිලි | 104,877,813 | 5,219,518 | - | - | 110,097,331 |
| ගෘහ භාණ්ඩ හා සවිකිරීම් | 28,152,192 | 3,842,788 | - | - | 31,994,980 |
| පිරියත හා උපකරණ | 2,489,586,188 | 104,135,532 | - | (2,874) | 2,593,718,846 |
| එන්.ටී.වී චැනලය සඳහා උපකරණ | 26,527 | 6,631 | - | - | 33,158 |
| කාර්යාලීය උපකරණ | 43,741,442 | 1,581,496 | - | - | 45,322,938 |
| විද්‍යුත් උපකරණ | 7,431,116 | 83,206 | - | - | 7,514,323 |
| රූපවාහිනී යන්ත්‍ර | 20,093,927 | 1,034,799 | - | (123,382) | 21,005,344 |
| පුස්තකාල ග්‍රන්ථ | 2,050,347 | 52,134 | - | - | 2,102,481 |
| ලුහු මෙවලම් හා උපකරණ | 2,756,033 | 218,032 | - | - | 2,974,065 |
| පරිගණක | 71,996,052 | 10,307,819 | - | - | 82,303,871 |
| වෙනත් වත්කම් | 3,125,902 | 372,452 | - | - | 3,498,354 |
| ගිණුම්කරණ මෘදුකාංග | 6,225,172 | 1,176,423 | - | - | 7,401,594 |
| මෝටර් වාහන | 86,067,787 | 12,096,893 | - | - | 98,164,680 |
| සංගීත උපකරණ | 170,028 | - | - | - | 170,028 |
| කැරවෑන් රථ | 162,140 | - | - | - | 162,140 |
| ආරක්ෂිත උපකරණ | 2,169,761 | - | - | - | 2,169,761 |
| JICA ව්‍යාපෘතිය යටතේ ලද උපකරණ | 13,354,737 | 13,354,737 | - | - | 26,709,474 |
| Container | 33,091 | 35,840 | - | - | 68,931 |
| **මුළු ක්ෂය** | **2,882,020,254** | **153,518,300** | **-** | **(126,256)** | **3,035,412,297** |

**වත්කම්වල ශුද්ධ පොත් අගය**

**රු.'000 වලින්**

| සටහන | 2014.01.01 දිනට ශේෂය | 2014.12.31 දිනට ශේෂය |
|---|---|---|
| පිරිවැය | 3,472,842,947 | 3,638,261,216 |
| ක්ෂය | (2,882,020,254) | (3,035,412,297) |
| **දේපල, පිරියත හා උපකරණවල ශුද්ධ පොත් අගය** | **590,822,693** | **602,848,919** |

**නොනිමි වැඩ**

**රු. '000 වලින්**

| සටහන | **2014.01.01 දිනට ශේෂය** | **එකතුවීම්** | **මාරු කිරීම්** | **2014.12.31 දිනට ශේෂය** |
|---|---|---|---|---|
| නොනිමි වැඩ | 3,815,904 | 4,269,658 | (7,770,385) | 315,176 |

**රු.'000 වලින්**

| සටහන | **2014.01.01 දිනට ශේෂය** | **2014.12.31 දිනට ශේෂය** |
|---|---|---|
| දේපල, පිරියත හා උපකරණවල ශුද්ධ පොත් | 590,822,693 | 602,848,919 |
| නොනිමි වැඩ | 3,815,904 | 315,176 |
| **මුළු වත්කම්** | **594,638,597** | **603,164,095** |

## ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව

## මූල්‍ය ප්‍රකාශන සටහන්

රු.'000 වලින්

| සටහන | 2014.12.31 | 2013.12.31 |
|---|---|---|
| **9. අස්පෘශ්‍ය වත්කම්** | | |
| මිල දී ගත් ටෙලි නාට්‍ය | 147,654,299 | 148,614,535 |
| සංස්ථාව නිපද වූ ටෙලි නාට්‍ය | 36,807,776 | 35,828,846 |
| සංස්ථාව නිපද වූ අනෙකුත් දෑ | 29,380,676 | 20,737,482 |
| විදේශයන්ගෙන් මිල දී ගත් වැඩසටහන් අමුද්‍රව්‍ය | 29,621,936 | 27,277,479 |
| දේශීය වැඩසටහන් (විකාශය නොවූ) | 2,989,847 | 7,200,060 |
| දේශීය වැඩසටහන් (නොනිමි) | - | 2,070,127 |
| **අස්පෘශ්‍ය වත්කම්** | **246,454,534** | **241,728,529** |
| **10. පරිණත දිනය දක්වා තබාගන්නා මූල්‍ය සාධන පත්‍ර** | | |
| ස්ථාවර තැන්පතු (ලංකා බැංකුව) | 117,091,257 | 198,727,501 |
| ස්ථාවර තැන්පතු (රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව) | 18,723,317 | 16,967,211 |
| | **135,814,574** | **215,694,712** |
| **11. තොග** | | |
| මුද්‍රණ හා ලිපි ද්‍රව්‍ය | 3,168,216 | 4,081,613 |
| අමතර කොටස් - ඉංජිනේරු 1 | 18,052,749 | 18,052,749 |
| අමතර කොටස් - ඉංජිනේරු 11 | 176,784,325 | 175,922,296 |
| මාධ්‍යරූප ද්‍රව්‍ය | 75,891 | 76,455 |
| වේශ නිරූපන ද්‍රව්‍ය | 1,430,709 | 1,902,467 |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 62,448 | 27,420 |
| මෝටර් වාහන ද්‍රව්‍ය | 2,535,098 | 2,403,924 |
| ඩීසල් තොග | 1,556,886 | 1,218,470 |
| කාර්යාලවලට අවශ්‍ය භාණ්ඩ (මුද්‍රණ හා ලිපිද්‍රව්‍ය හැර) | 34,315 | 27,090 |
| විවිධ දෑ | 146,733 | 72,520 |
| ප්‍රධාන ගබඩාවේ ඇති දෘශ්‍ය පට හා ටේප් | 2,357,006 | 479,056 |

| | | |
|---|---|---|
| විද්‍යුත් පාරිභෝජන ද්‍රව්‍ය | 284,315 | 808,326 |
| පුස්තකාලයේ ඇති දෘශ්‍ය පට හා ටේප් | 3,221,250 | 2,304,008 |
| පටිගත කළ කැසට්පට | 278,113 | 311,500 |
| අමතර කොටස් ඊ එන් ජී සහ ඉංජිනේරු | 268,086 | - |
| රූපවාහිනී යන්ත්‍ර | - | 34.998 |
| **තොග** | **210,256,140** | **207,722,893** |
| **12. වෙළඳ ලැබිය යුතු දේ** | | |
| සේවාදායක ණයගැතියෝ | 563,449,868 | 580,630,658 |
| අගරු චෙක්පත් | 56,190 | - |
| අඩුකලා - සේවාදායක ක්‍රමක්ෂය | (71,041,991) | (64,162,205) |
| **වෙළඳ ණයගැතියෝ** | **492,464,068** | **516,468,453** |
| **13. ණය හා වෙනත් ලැබිය යුතු දෑ** | | |
| **13.1. භාණ්ඩාගාර බිල්පත්** | | |
| **භාණ්ඩාගාර බිල්පත්** | 181,538,877 | 211,815,715 |
| **13.2. ණයගැතියෝ - සේවක** | | |
| රූපවාහිනී ණය - වෙනත් ණය | 40,568 | 42,065 |
| ආපදා ණය | 104,290,603 | 104,989,861 |
| උත්සව අත්තිකාරම් | 368,550 | 381,300 |
| ප්‍රවාහන ණය | 57,173,155 | 50,651,041 |
| විශේෂ ණය | 27,513,046 | 22,546,775 |
| රෙදිපිළි ණය | 2,758,671 | 2,929,671 |
| වෙනත් ණය | 195,000 | 276,428 |
| නිවාස ණය | 51,631,199 | 46,737,242 |
| **සේවක ණයගැතියෝ** | **243,970,792** | **228,554,383** |
| **(-) සේවක ණය ක්‍රමක්ෂය** | (252,372) | (141,250) |
| | **243,718,420** | **228,413,133** |
| **ණය සහ වෙනත් ලැබිය යුතු දෑ** | **425,257,298** | **440,228,849** |
| **14. වෙනත් ලැබිය යුතු දෑ** | | |
| **14.1. අත්තිකාරම් හා තැන්පතු** | | |
| රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව නිවාස ණය අරමුදල | 6,946,813 | 7,664,740 |

| | | |
|---|---|---|
| මාර්ගස්ථ තොග | 3,048,471 | 42,550,185 |
| සැපයුම්කරුවන් වෙත අත්තිකාරම් - මිලට ගැනීම් (දේශීය ආයතන) | 3,631,577 | 1,309,750 |
| සැපයුම්කරුවන් වෙත අත්තිකාරම් (වැඩසටහන් නිෂ්පාදන) | 1,495,005 | 428,069 |
| සේවකයින් වෙත අත්තිකාරම් - විවිධ | 1,516,183 | 580,918 |
| සේවකයින් වෙත අත්තිකාරම් - වැඩසටහන් අත්තිකාරම් අත්තිකාරම් | 4,420,013 | 1,998,780 |
| සේවාවන් සඳහා තැන්පතු - ආපසු ගෙවීම් | 4,302,254 | 4,199,754 |
| කාමර ගාස්තු සඳහා අත්තිකාරම් | 1,375,250 | 462,000 |
| විදේශ මිල දී ගැනීම් අත්තිකාරම් - අමතර කොටස් | 13,154,488 | 1,633,537 |
| කොන්ත්‍රාත්කරුවන්ට දුන් අත්තිකාරම් | - | 450,000 |
| සේවකයින්ට දුන් අත්තිකාරම් මිල දී ගැනීම | 1,300,492 | 903,989 |
| සුළු මුදල් අග්‍රිමය - පරිපාලන අංශය | 34,940 | 17,055 |
| රඳවා තබාගැනීමේ බද්ද | 38,773,827 | 38,347,986 |
| ආර්ථික සේවා ගාස්තු | - | 12,019,382 |
| **තැන්පතු හා අත්තිකාරම්** | **79,999,312** | **112,566,146** |
| **14.2. විවධ ණයගැතියෝ** | | |
| විවිධ ණයගැතියෝ | 823,936 | 511,337 |
| විශ්‍රාම ලත් /ඉල්ලා අස් වූ සේවකයින්ගෙන් ලැබිය යුතු දෑ | 111,684 | 111,684 |
| ලැබිය යුතු ආදායම්( දේශීය ආදායම් හා අනෙකුත් ආයතන) | 24,765,148 | 22,247,221 |
| ලැබිය යුතු ආදායම් - ආයෝජන ආදායම් | 6,132,735 | 13,966,740 |
| සේවක ණයගැතියෝ - විවිධ | 70,627 | 47,498 |
| රක්ෂණ සංස්ථාව - වෛද්‍ය යෝජනා ක්‍රමය | 230,129 | 441,039 |
| කාසි ගැලපුම් | 32,468 | 33,032 |
| කුලී පිට ගැනුම් පොලී අවිනිශ්චිත ගිණුම | 1,034,182 | 3,475,512 |
| විවිධ ණයගැතියෝ | **33,200,909** | **40,834,062** |
| අඩු කළා - විවිධ ණයගැති ක්‍රමක්ෂය | (18,622,566) | (18,578,482) |
| | **14,578,343** | **22,255,580** |

| | | |
|---|---|---|
| **වෙනත් ලැබිය යුතු දෑ** | **94,577,655** | **134,821,726** |
| **15. මුදල්,බැංකු ශේෂය හා ඒක්ෂණ තැන්පතු** | | |
| ලංකා බැංකු ඉතුරුම් ගිණුම | 57,733 | 55,473 |
| ලංකා බැංකු ගිණුම ටොරින්ටන් ශාඛාව | 1,673,346 | 1,872,806 |
| **මුදල්,බැංකු ශේෂය හා ඒක්ෂණ තැන්පතු** | **1,731,079** | **1,928,280** |
| **16.විශ්‍රාමික පාරිතෝෂික** | | |
| විශ්‍රාමික පාරිතෝෂික | 131,831,313 | 138,621,178 |
| **විශ්‍රාමික පාරිතෝෂික** | **131,831,313** | **138,621,178** |
| **17.වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දේ** | | |
| ණයහිමි සේවාදායක | 43,101,050 | 47,015,473 |
| ගෙවිය යුතු නියෝජිත කොමිස් මුදල | 58,636,554 | 54,624,263 |
| සේවාදායක මාරුකිරීම්/ආපසු ගෙවීම් | 1,030,952 | 681,952 |
| **වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දේ** | **102,768,557** | **102,321,689** |
| **18.වෙනත් මූල්‍ය වගකීම්** | | |
| උපචිත වියදම් | 58,460,686 | 52,684,574 |
| ලබා නොගත් වැටුප් හා වේතන | 181,350 | 119,920 |
| රඳවා ගත් මුදල් - කොන්ත්‍රාත් | 207,489 | 870,999 |
| ඇපකර - කොන්ත්‍රාත් හා සැපයුම් | 69,241 | 1,779,241 |
| ණයහිමි පාලනය | 7,921,211 | 6,593,972 |
| අවලංගු වූ චෙක්පත් - ආයතනික ශාඛාව | 4,695,010 | 261,441 |
| ශිල්පීය ගෙවීම් (අවලංගු වූ චෙක්පත්) | 225,161 | 331,684 |
| රඳවාගත් මුදල් - ශ්‍රී.ලං.රූ.සංස්ථා - සේවකයෝ | 7,000 | 7,000 |
| ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථා | 24,405 | 16,770 |
| කලින් ලැබීම් | 4,445,176 | - |
| නැවත ගෙවන ටෙන්ඩර් තැන්පතු | 552,314 | 532,855 |
| ගෙවිය යුතු වැටුප් | 43,999,697 | 40,121,527 |
| රූපවාහිනී කෞතුකාගාරය සඳහා අරමුදල | 10,002 | 10,002 |
| සී.අයි.ආර්. මුද්දර බද්ද | 18,925 | 58,484 |
| රාජ්‍ය අමාත්‍යාංශය | 1,093,810 | 962,559 |
| පාරිතෝෂික මත දඩ සඳහා ප්‍රතිපාදනය | 73,745 | 73,745 |

| | | |
|---|---|---|
| ගෙවිය යුතු විවිධ වියදම් - සුව සහන | 73,574 | 73,574 |
| ලාභාංශ ප්‍රතිපාදනය (රජයට) | 32,368,342 | 33,195,838 |
| **වෙනත් මූල්‍ය වගකීම්** | **154,427,137** | **137,694,185** |
| **19.වෙනත් ගෙවිය යුතු දෑ** | | |
| ආදායම් මත රඳවා ගැනීමේ බදු | 1,548,315 | 1,548,315 |
| ආදායම් බදු | 10,297,464 | 15,049,328 |
| එකතු කළ අගය මත බදු පාලන ගිණුම | 3,648,370 | 6,672,894 |
| රඳවා ගත් පිරිවැටුම් බද්ද | 4,397 | 4,372 |
| උපයන විට ගෙවීම් බද්ද | 1,740,960 | 1,513,306 |
| **වෙනත් ගෙවිය යුතු දෑ** | **17,239,505** | **24,788,215** |
| **20.බැංකු අයිරාව - ලංකා බැංකු ආයතනික ශාඛාව** | | |
| බැංකු අයිරාව - ලංකා බැංකු ආයතනික ශාඛාව | 135,658,642 | 45,780,210 |
| **බැංකු අයිරාව - ලංකා බැංකු ආයතනික ශාඛාව** | **135,658,642** | **45,780,210** |
| **21.මූල්‍ය කල්බදු** | | |
| 21.1 වසරක් තුළ ගෙවිය යුතු මූල්‍ය කල්බදු | 1,528,966 | 13,260,468 |
| 21.2 වසරකට වඩා ගෙවිය යුතු මූල්‍ය කල්බදු | 12,953,126 | 14,482,092 |
| **මූල්‍ය කල්බදු** | **14,482,092** | **27,742,560** |

මගේ අංක : ටීඑම්/ඊ/එස්එල්ආර්සී/1/14/53 දිනය: 2015ජූලි 15 දින

සභාපති,

ශ්‍රී ලංකා රූපවාහිනි සංස්ථාව.

**ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී)වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1982 අංක 6 දරන ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථා පනතේ 16(3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්ති ප්‍රකාර සංස්ථාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් සංස්ථාවේ සභාපති වෙත 2015 ජූලි 07 දින නිකුත් කරන ලදී

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිති වලට( ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳව සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත්වේ.තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සංස්ථාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශය කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තු වල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වන වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

ප්‍රමිති වලට අනුකූලව කටයුතු නොකළ අවස්ථා පහත දැක්වේ.

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 02 ට (LKAS -2) අනුව තොග ශුද්ධ උපලබ්ධි අගය හෝ පිරිවැය යන වටිනාකම් දෙකෙන් අඩු වටිනාකමට අගය කර මූල්‍ය ප්‍රකාශනයන්හි දැක්විය යුතු වුවද සංස්ථාව විසින් තොගවල ශුද්ධ උපලබ්ධි අගය ඇස්තමේන්තු කිරීමකින් තොරව රු 210,256,140 ක්වූ පිරිවැය මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.එසේම මෙම තොගයෙහි වර්ෂ 10කට වඩා පැරණි චලනය නොවන රු 18,052,749 ක තොග ශේෂයක්ද ඇතුලත් වී තිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 08ට ( LKAS - 8) අනුව පෙර කාලපරිච්ඡේද වලට අදාල වැරදි ඒවා සොයාගැනීමෙන් පසුව නිතුත් කිරීම සඳහා අනුමත කරන පළමු මූල්‍ය ප්‍රකාශන කට්ටලයෙහි වරද සිදුවූ කාලපරිච්ඡේද සඳහා ඉදිරිපත් කර ඇති සංසන්දනාත්මක අගයන් නැවත සංශෝධනය කර දැක්විය යුතු වුවද, ඉකුත් වර්ෂයේ ප්‍රතිවෙළඳ ගිවිසුම් යටතේ දරන ලද රු. 14,455,280 ක වියදමක් සමාලෝචිත වර්ෂයේ හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශයට ගලපා තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 16 ට (LKAS - 16) අනුව සම්පූර්ණයෙන් ක්ෂය කළ එහෙත් දැනට මෙහෙයුම් කටයුතු සඳහා භාවිතා කරන වත්කම් පිළිබඳ විස්තර මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කළ යුතු වුවද ගත්මිල රු. 2,530,748,888ක්වූ සම්පූර්ණයෙන්ම ක්ෂය කර ඇති එහෙත් දැනට මෙහෙයුම් කටයුතු සඳහා භාවිතා කරන ස්ථාවර වත්කම් අයිතම 369ක් පිළිබඳ මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 18 ට (LKAS - 18) අනුව සේවා සැපයීම හා සම්බන්ධිත ආදායම් හඳුනා ගැනීමේදී ප්‍රතිවෙළඳ ගිවිසුම් යටතේ සිදුකරන ලද ගනුදෙනුවලින් ලැබී තිබුණු රු.46,566,500 ක් සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස හඳුනාගෙන තිබුණද, එම ගනුදෙනු සම්පූර්ණ කිරීමට දරන ලද වියදම් හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවල ගලපා නොතිබුණි.

(ඉ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 39 ට (LKAS - 39) අනුව සංස්ථාව විසින් රාජ්‍ය පුවත්පත් සමාගමක කර තිබුණු රු .1,104,000ක ආයෝජන එහි සාධාරණ අගයට (Fair value) ගණනය කර ආයෝජනයෙහි අගය අඩුවීම හෝ වැඩිවීම හඳුනාගෙන අදාල ප්‍රමාණය මූල්‍ය ප්‍රකාශන වල ගැලපීමට කටයුතු කර නොතිබුණි.

2.2.2 <u>ගිණුම්කරණ අඩුපාඩු</u>

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සංස්ථාව විසින් ගිවිසුම්ගත බැඳීමක් නොමැතිව කොකාවිල් සම්ප්‍රේෂණ කුළුණෙහි පහසුකම් ලබාදීම වෙනුවෙන් පෞද්ගලික රූපවාහිනී ආයතනයකින් අයවිය යුතු රු.7,750,720 ක් ලැබියයුතු ආදායමක් ලෙස මූල්‍ය ප්‍රතාශනවල ඇතුළත් කර නොතිබුණි.

(ආ) රාජ්‍ය ආයතනයක ප්‍රචාරක කටයුතු සඳහා සංස්ථාව වෙත ලද රු. 9,344,832 ක් සඳහා විකාශන කටයුතු සිදුකර නොතිබුණු නමුත් එම ප්‍රමාණය ආපසු ගෙවීමේ වගකීම පැවතියදීත් සමාලොචිත වර්ෂයේ ආදායමක් වශයෙන් ගිණුම් ගත කර ඒ වෙනුවෙන් රු. 658,500 ක නියෝජිත කොමිස් මුදලක්ද ගෙවා තිබුණි.

**2.2.3. <u>පැහැදිලි නොකළ වෙනස්කම්</u>**

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව සේවාදායක ණයගැති ශේෂයන්ගේ එකතුව රු .563,449,868 ක් වුවත් ඊට අනුරූපීව සේවාදායක ණයගැති උපලේඛනයේ ශේෂයන්ගේ එකතුව රු. 563,266,849 ක් වුයෙන් මූල්‍ය ප්‍රකාශන හා ණයගැති උපලේඛනය අතර, රු.183,019 ක වෙනසක් නිරීක්ෂණය විය.

**2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම**

පහත සඳහන් ගනුදෙනු සම්බන්ධව විගණන සාක්ෂි ඉදිරිපත් නොවීම නිසා නිවැරදිතාවය තහවුරුකර ගැනීමට නොහැකි විය.

(අ) කෙරීගෙන යන වැඩ රු. 132,125 ක් සම්බන්ධ විස්තරාත්මක උපලේඛන.

(ආ) කැසට් සහ ටේප් (පුස්තකාලය) / cassetes & tapes (library) සහ recorded cassettes තොග පිළිවෙලින් රු. 3,221,250 ක් හා රු. 278,113 ක් ලෙස ලෙජර් ගිණුම්වල දක්වා තිබුණද, එම තොග වටිනාකම්වල නිවැරදිතාව තහවුරු කර ගැනීම සඳහා වටිනාකම් සහිත තොග සමීක්ෂණ වාර්තාවන් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

**2.3 ලැබිය යුතු සහ ගෙවියයුතු ගිණුම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) **සේවාදායක ණයගැතියෝ - ගුවන් කාලය ණයට විකිණීම**

i. එකතුව රු. 563,449,868 ක්වූ සේවාදායක ණයගැතියන් අතුරින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හානිකරණ ගැලපීම රු 71,041,991 ක් හෙවත් සියයට 13 ක් විය. මෙම තත්ත්වය ආයතනයේ ද්‍රවශීලතාවය කෙරෙහි අහිතකර ලෙස බලපා ඇති බව නිරීක්ෂණය විය.

ii. සේවාදායක ණයගැතියන්ට ණය දීමේ ප්‍රතිපත්තිය අනුව, එක් මාසයක කාලසීමාවක් තුළ ණය අයකරගත යුතු වුවත්, එම ණයගැතියන්ගෙන් මාසයකට වැඩි ණයගැති ප්‍රමාණය මුළු ණයගැතියන්ගෙන් සියයට 72 ක් හෙවත් රු 409, 475,448 ක් ද මාස තුනකට වැඩි ණයගැති ප්‍රමාණය මුළු ණයගැතියන්ගෙන් සියයට 19 ක් හෙවත් රු. 107,951,654 ක් විය. තවද මුළු ණයගැතියන්ගෙන් වසර තුනකට හා වසර පහකට වැඩි සේවාදායක ණයගැති ශේෂයන් පිළිවෙලින් රු.10,554,683 ක් සහ රු 66,250,180 ක් විය.

iii. සේවාදායක ණයගැතියන්ගෙන් රු. 53,886,160 ක් අයකරගත නොහැකි හා කාලාවරෝදයට අයත් ණය ශේෂ වූ අතර නීතිමය ක්‍රියාමාර්ග ගෙන තිබුණු ණය ප්‍රමාණය රු. 24,405,255 ක් පමණක් විය.

iv. සාමාන්‍ය වෙළඳ ගිවිසුම් සඳහා මුදල් අයකර ගැනීමේ සංස්ථා ප්‍රතිපත්තිය අනුව ගිවිසුමට අදාළ සම්පූර්ණ ගුවන් කාලය සැපයීමෙන් පසුව ඉන්වොයිස් පත් නිකුත් කර මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.මෙම ප්‍රතිපත්තිය සංස්ථාවට අයවිය යුතු ණය මුදල් අයකර ගැනීම කෙරෙහි අහිතකර ලෙස බලපා ඇති බව විගණනයේදී නිරීක්ෂණය විය.

**(ආ) විවිධ ණයගැතියෝ**

දේශිය ආදායම් දෙපාර්තමේන්තුවෙන් අයවිය යුතු රු.17,858,971 ක් වූ මුදල් ලබාගැනීම සඳහා බදු අභියාචනයක් ඉදිරිපත් කිරීමට කටයුතු කළයුතු වුවද සංස්ථාව විසින් එලෙස කටයුතු කර නොතිබුණි.

**(ඇ) අත්තිකාරම්**

සංස්ථාවේ මාණ්ඩලික නිවේදනයන්ට අනුව ලබාගන්නා අත්තිකාරම් අදාල වැඩසටහන අවසාන වී දින 14ක් ඇතුළත නිරවුල් කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂය තුළ ලබාගත් රු. 6,000,313 ක් වූ අත්තිකාරම් 2015 ජූනි 05 දිනවන විටත් නිරවුල් කර නොතිබුණි.

**2.4. <u>නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම</u>**

පහත සඳහන් නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම නිරීක්ෂණය විය.

| | නීති, රීති , රෙගුලාසි හා කළමණාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1982 අංක 06 දරන ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථා පනත | ක්‍රියාකාරි අධ්‍යක්ෂවරයෙකු පත්කිරීම සඳහා පනතේ ප්‍රතිපාදන සලකා නොතිබුණද සමාලෝචිත වර්ෂයේ අවස්ථා දෙකකදි පත්වීම් සිදුකර වැටුප් හා දීමනා වශයෙන් එකතුව රු. 545,402 ක් ගෙවා තිබුණි. |

| | | |
|---|---|---|
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය 11 වැනි පරිච්ඡේදයේ 7.1 වගන්තිය | විනය පරීක්ෂණයකින් අනතුරුව සේවය අවසන් කරනු ලැබුවා වූ පුද්ගලයෙක් අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියකින් තොරව අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සංස්ථාවේ නිෂ්පාදක තනතුරට කොන්ත්‍රාත් පදනම මත මාස 6ක කාලයක් සඳහා බඳවාගෙන ඔහුට 2014 අගෝස්තු සිට 2015 පෙබරවාරි දක්වා එකතුව රු. 246,665 ක් වැටුප්, දීමනා හා ප්‍රසාද දීමනා වශයෙන් ගෙවා තිබුණි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| | (i) මුදල් රෙගුලාසි 71(1) | අරමුදලේ ප්‍රභවය කුමක් වුවත් නව දීමනා ඇති කිරීමේදී හා ප්‍රතිශෝධනය කිරීමේදී භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ පූර්ව අනුමැතිය ලබාගත යුතු වුවත් ඊට අනුකූලව කටයුතු නොකර සමාලෝචිත වර්ෂයේදී ඉන්ධන හා ප්‍රවාහන දීමනා වශයෙන් නිළධාරීන් 188 ක් වෙත රු. 21,532,320 ක් ගෙවා තිබුණි. |
| | (ii) මුදල් රෙගුලාසි 105 සිට 110 | සමාලෝචිත වර්ෂයේ අවස්ථා 16 කදී වාහන 15 ක් අනතුරු වලට භාජනය වී තිබුණු අතර මේ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි අනුව කටයුතු කර නොතිබුණි. |
| | (iii) මුදල් රෙගුලාසි 155 | නිකුත් කරන ලද විගණන විමසුම් 12 ක් සඳහා පිළිතුරු ලබා දී නොතිබුණි. |

| | |
|---|---|
| (iv) මුදල් රෙගුලාසි 156(3) සහ මුදල් රෙගුලාසි 446(2) | අවස්ථා 1866 කට අදාලව රු. 194,002,129 ක ගණුදෙනු මුදල් පොතෙහි සටහන් කිරීමේදී බලයලත් නිලධාරියකුගේ අත්සන සදහන්ව නොතිබුණු අතර මෙහි වටිනාකම මෙහි වටිනාකම රු .100,000 ක සීමාව ඉක්මවන රු. 179,873,550 ක ගණුදෙනු 184 ක් ඇතුළත්ව තිබුණි. |
| (v) මුදල් රෙගුලාසි 156(6) | ගිණුම් පිළිබද වූ සියලුම ලිපිලේඛන, පොත්පත්, වාර්තා සටහන් , ලේඛන යනාදිය විධිමත් වූ පරිදි බැහැර කරනු ලබන තෙක් නිසි පිළිවෙලට හා මනා තත්වයෙන් සුරක්ෂිත භාරයේ තබා ගත යුතු බව සදහන් කලද සංස්ථාවේ ගෙවීම් මුදල් පොත්හි එක් දිනක ගෙවීම් වලට අදාල කොටසෙහි සටහන් අපහැදිලි හා විකෘති වන ආකාරයෙන් නිලධාරියකු විසින් සටහන් තබා තිබුණි. |
| (vi) මුදල් රෙගුලාසි අංක 371 (2) ඇ හා ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථා මාණ්ඩලික නිවේදන අංක 964 (අතිරේක 04) | (i) තත් කාර්යය අතුරු ආග්‍රිමයන් දෙන ලද කාර්යය නිමකළ විගසම හා අදාළ වැඩසටහන අවසාන වී දින 14ක් ඇතුළත පියවිය යුතු වුවද අවස්ථා 26 කට අදාළ එකතුව රැ. 1,737,750 ක තත් කාර්යය අතුරු අග්‍රිමයන් පියවීමේදී අදාල කාර්යය නිමවී දින 03 සිට 75 දක්වා කාල ප්‍රමාදයකින් පියවීම් කර තිබුණි.<br><br>(ii) සමාලොචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට නොපියවූ අත්තිකාරම් එකතුව රු. 1,375,250 ක් වූ අතර ඉන් අවස්ථා 15 කදී ලබාදි තිබුණු රු. 1,033,250 ක් 2015 මාර්තු 30 |

| | |
|---|---|
| | දිනවන විටත් පියවා නොතිබුණි. එම අත්තිකාරම් ලබා දි දින 62 සිට දින 127 ක කාලසීමාවක් ගතවී තිබුණි. |
| | (iii) අවස්ථා 09කදී ලබාදුන් එකතුව රු.158,250 ක් වටිනා අත්තිකාරම් මුදල් කිසිදු කාර්යයකට නොයොදවා දින 01 සිට දින 60 ක් දක්වා කාලයක් ලඟ රදවාගෙන පියවීම් කර තිබුණි. |
| (vii) මුදල් රෙගුලාසි 757 (අ)සහ (ආ) | පිරිවැය රු. 194,837,074 ක් වූ ඉංජිනේරු අංශයේ පැවති අමතර කොටස් තොගය වාර්ෂික තොග සමීක්ෂනයට ඇතුලත් කර නොතිබුණි. |
| (ඇ) 2003 මාර්තු 28 දිනැති මුදල් අමාත්‍යාංශ ලේකම්වරයාගේ අංක එම්එෆ්/ටීආර්/1/2003 දරන ලිපිය | ගෙවිය හැකි අවම මාසික කුළිය ඉක්මවා කුළී වාහන 04 ක් වෙනුවෙන් රු. 915,000 ක් වැඩිපුර ගෙවා තිබු ණි. |
| (ඉ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/ 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රෙල්ඛය | |

| | |
|---|---|
| (i) 6.5.1 වගන්තිය | සමාලෝචිත වර්ෂයේ කෙටුම්පත් වාර්ෂික වාර්තාව මුදල් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද ඊට අනුකූලව කටයුතු කර නොතිබුණි. |
| (ii) 8.3.5 වගන්තිය | නිලවාහන සඳහා හිමිකම් නොමැති නිළධාරීන් 02 දෙදෙනෙක් වෙනුවෙන් වාහන වෙන්කර තිබුණු අතර ලබාදී තිබුණු ඉන්ධන වටිනාකම රු. 514,880 ක් විය. |
| (ඊ) 2008 ජූලි 28 දිනැති අංක පිඊඩී/50 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය සහ 2008 ජූනි 26 දිනැති අංක14/2008 හා 1999 ඔක්තෝබර් 08 දිනැති අංක 22/99 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | චක්‍ර ලේඛ නියමයන්ට පටහැනිව නිලධාරීන් 13 දෙනෙකුට වාහන හා ඉන්ධන දීමනා ලෙස සමාලෝචිත වර්ෂයේදී එකතුව රු. 7,222,800 ක් ගෙවා තිබුණි. |
| (උ) 2011 පෙබරවාරි 09 දිනැති අංක 13/2008 (iv) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය . | මාසිකව හිමි ඉන්ධන ලීටර ප්‍රමාණය ඉක්මවා නිළධාරීන් පස්දෙනෙකුට වැඩිපුර සපයා තිබුණු ඉන්ධන ප්‍රමාණයේ වටිනාකම රු. 1,194,390 ක් විය. |

## 2.5 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මාසයේදී හදිසි අවශ්‍යතාවයක් බව දක්වමින් ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන්ද බැහැරව මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ එකඟතාවය ලබාගත යුතු බවට අමාත්‍ය මණ්ඩලය ලබාදී තිබුණු නියෝගයද නොසලකා ලිඛිත ගිවිසුමකට එළඹීමකින්ද තොරව ජාතික රූපවාහිනිය සැටලයිට් තාක්ෂණය ඔස්සේ විදේශ රටවල විකාශය කිරීම වෙනුවෙන් පෞද්ගලික සමාගමක් වෙත රු. 3,454,279 ක් ගෙවා තිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා සංස්ථාවේ බදු පෙර අලාභය රු. 182,480,765 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ බදු පෙර ලාභය රු. 47,868,447 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 230,349,212 ක් හෙවත් සියයට 481 ක පිරිහීමක් නිරීක්ෂණය විය.සමාලෝචිත වර්ෂයේ ආදායම පෙර වර්ෂයට වඩා සියයට 8 කින් අඩුවීම හා වියදම් සියයට 3 වැඩිවීම මෙම පිරිහීමට ප්‍රධාන හේතුව විය.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

සමාලෝචිත වර්ෂයේ සංස්ථාවේ බදු පෙර අලාභය රු. 182,480,765 ක් වුවද , ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 20 හි සඳහන් පරිදි ප්‍රාග්ධන ප්‍රවේශය අනුගමනය කිරීම නිසා ආදායමට ගලපන ලද රු.15,903,664 ක ප්‍රමාණය හා ස්කන්ධ ප්‍රකාශයෙහි ගලපන ලද රු. 14,455,280 ක් වූ පෙර වර්ෂ ප්‍රති වෙළඳ වියදම ගැලපූ විට අලාභය රු. 212,839,709 දක්වා, එනම් සියයට 17 කින් වැඩිවන බව නිරීක්ෂණය විය. මෙයට අනුරූපීව ඉකුත් වර්ෂයේ කළ ගැලපීම් හේතුවෙන් ඉකුත් වර්ෂයේ රු. 47,869,000 ක් වූ ලාභය රු. 22,965,000 ක් දක්වා අඩුවන බවද නිරීක්ෂණය විය.

## 3.3 සංස්ථාවට එරෙහිව හෝ සංස්ථාව විසින් ආරම්භකර ඇති නෛතික සිද්ධි

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සංස්ථාවට එරෙහිව බාහිර පාර්ශවයන් විසින් නඩු 10 ක් පවරා තිබූ අතර , සංස්ථා කාර්ය මණ්ඩලය විසින් නඩු 06 ක් පවරා තිබුණි. මෙම නඩු සඳහා සමාලොචිත වර්ෂය තුළ නීතිඥ ගාස්තු වශයෙන් රු. 1,151,320 ක මුදලක් ගෙවා තිබුණි. බාහිර පාර්ශවයන් පවරන ලද නඩු 06 කට අදාළව පැමිණිලි පාර්ශවය විසින් ඉල්ලා තිබුණු වන්දි මුදල රු.1,270,000,000 ක් විය.

(ආ) සංස්ථාව විසින් බාහිර පාර්ශවයන්ට එරෙහිව නඩු 27 ක් පවරා තිබුණු අතර එයින් නඩු 05 කින් රු.1,340,735 ක් ලැබී තිබුණි.එක් නඩු නිමිත්තක් කාලාවරෝධ නීතියට හසුවී ඇති හෙයින් නිෂ්ප්‍රභා කර තිබුණි. ඉතිරි නඩු 21න් සංස්ථාව අයකර ගැනීමට බලාපාරොත්තු වන මුදල රු. 16,904,142 ක් විය.මෙම නඩු සඳහා සමාලෝචිත වර්ෂය තුළ නීතිඥ ගාස්තු වශයෙන් රු. 766,490 ක මුදලක් ගෙවා තිබුණි.

## 3.4 කාරක ප්‍රාග්ධන කළමනාකරණය

විධිමත් කාරක ප්‍රාග්ධන කළමනාකරණ යාන්ත්‍රණයක් ක්‍රියාත්මක නොකිරීම සහ ණය අයකර ගැනීමේ කාර්යක්ෂමතාව හේතුවෙන් බැංකු අයිරා පහසුකම් ලබාගැනීමට සංස්ථාවට සිදුවී තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණු අයිරා පොළිය රු. 8,385,155 ක් විය. සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 වන දින වන විට මුදල් පොතට අනුව බැංකු අයිරාව රු. 135,658,642 ක් විය.

# 4. මෙහෙයුම් සමාලෝචනය

## 4.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ප්‍රතිවෙළඳ ගිවිසුම් යටතේ වෙනත් මාධ්‍ය ආයතන සමඟ අන්‍යෝන්‍ය වශයෙන් ප්‍රචාරණ කටයුතු කර ගැනීමේ අරමුණ ඇතිව එම මාධ්‍ය ආයතන සමඟ සංස්ථාව ප්‍රතිවෙළඳ ගිවිසුම් ඇතිකරගෙන ඒවා ක්‍රියාත්මක තර තිබුණි. මෙම ගිවිසුම ක්‍රියාත්මක කිරීම සම්බන්ධව පහත කරුණු විගණනයේදී නිරීක්ෂණ විය.

(i) සමාලෝචිත වර්ෂය තුළදී සංස්ථාව විසින් ලිඛිත ගිවිසුම් වලට එළැඹීමෙන් තොරව පුවත්පත් ආයතන වලට ලබාදී තිබුණු ගුවන්කාල වටිනාකම රු. 68,366,257 ක්වූ අතර ඒ වෙනුවෙන් රු. 44,128,126 ක පුවත්පත්දැන්වීම් පළ කර තිබුණි. ලබාදුන් ගුවන් කාල වටිනාකමට සමානව සංස්ථාවට වාසිදායක වන අයුරින් පුවත්පත් දැන්වීම් පළකරවා ගැනීම කෙරෙහි කළමනාකරණය අවධානය යොමුකර නොතිබීමෙන් ප්‍රතිවෙළඳ ගිවිසුම් හරහා සේවාවන් ලබාගැනීම වඩා ලාභදායි හා කාර්යක්ෂම ආකාරයෙන් කළමනාකරණය කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

(ii) සංස්ථාව විසින් පුවත්පත් ආයතන වෙත යොමුකරන ලද දැන්වීම් වලින් පලකරන ලද දැන්වීම් වලට අදාළව පුවත්පත් ආයතන විසින් එවන ලද ඉන්වොයිස්වල නිවැරදිතාව පරීක්ෂා කළහැකි වන පරිදි ලිපිගොනු නඩත්තු කර නොතිබුණි.මෙම නිසා ප්‍රතිවෙළඳ ගිවිසුම්වලට අදාළ රු. 46,566,500 ක්වූ වියදම්වල නිවැරදිතාව පරීක්ෂා කළ නොහැකි විය.

(iii) සංස්ථාව එලඹ තිබුණු සෑම ප්‍රතිවෙළඳ ගිවිසුමකටම අදාලව මාසික ගිණුම් වාර්තා දෙපාර්ශවය විසින් නිකුත් කළ යුතුව තිබුණද ඒ අනුව කටයුතු කර නොතිබුණි. 2015 අප්‍රේල් මාසය අවසන් වන විටත් පුවත්පත් ආයතන 04 කට අදාලව සමාලෝචිත වර්ෂයට අදාළ මාස 09 ක ගිණුම් වාර්තා ලබාගෙනද නොතිබුණි.

(ආ) 1985 හා 1992 වර්ෂ වලදී ලංකා පුවත් ආයතනයේ රු. 1,104,000 ක් ආයෝජනය කර තිබුණ නමුත් සමාලෝචිත වර්ෂය දක්වාම කිසිදු ලාභාංශ ආදායමක් ලැබී නොතිබුණු නමුත් එම ආයෝජන තවදුරටත් එසේම පවත්වා ගෙන ගොස් තිබුණි.

(ඇ) බාහිර පාර්ශවයන්ගෙන් මිලදී ගනු ලැබූ ටෙලිනාට්‍ය/ වැඩසටහන්වල විකාශනය කිරීමේ වාර ගණන තවදුරටත් ඉතිරිව ඇතැත් ගිවිසුම් කාලයේදී අදාළ වාර ගණන විකාශනය නොකිරීම නිසා සමාලෝචිත වර්ෂය තුළදී වියදම් ලෙස ටෙලිනාට්‍ය/ වැඩසටහන් 19 කට අදාලව රු. 50,531,902 ක් කපාහැර තිබුණි.

(ඇ) 2014 දෙසැම්බර් 31 දිනට සංස්ථාවේ රු. 33,200,909 ක්වූ විවිධ ණයගැතියන්ගේ හානිකරණ වටිනාකම රු. 18,622,566 ක් හෙවත් සියයට 56 ක් ලෙස වෙන්කරීම හේතුකොට ගෙන සංස්ථාවේ ණය අයකර ගැනීම පිළිබඳ පාලනය දුර්වල මට්ටමක පවතින බව නිරීක්ෂණය විය. එම ශේෂය තුළ වර්ෂ 1-9 අතර කාලයක සිට පැවත එන ණයගැතියන්ගෙන් අයවිය යුතු රු. 146,863 ක් ද, වර්ෂ 5 -7 ත් අතර කාලයක සිට පැවත විශ්‍රාම ගිය / සේවයෙන් ඉවත්වූ සේවකයන්ගෙන් අයවිය යුතු රු. 111,684 ක්ද, විදේශීය රූපවාහිනී ආයතනයන්ගෙන් අයවිය යුතු රු.542,554 ක්ද, දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවෙන් අයවිය යුතු රු.17,858,971 ක්ද වෛද්‍ය බිල්පත් ප්‍රතිපූරණය කිරීමේදී රක්ෂණ සමාගම් වෙතින් අයවිය යුතු රු. 558,602 ක ශේෂයක්ද ඇතුළත්වී තිබුණි.

## 4.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශක්‍යතා අධ්‍යයනයකින් තොරව 2009 වර්ෂයේ විකාශනය ආරම්භ කරන ලද National Television (NTV) නාලිකාව වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ රු. 5,743,015 ක් වියදම් කර ඇති නමුත් එමගින් කිසිදු ආදායම් ඉපයීමක් කර නොතිබුණි.

(ආ) සමාලොචිත වර්ෂයේ අවසන් දිනට නිළධාරීන් 18 දෙනෙකු විසින් පුස්තකාලයෙන් බැහැර ගෙන ගොස් ආපසු භාර නොදුන් කැසට් සංඛ්‍යාව 723 ක්වූ අතර එම කැසට්පටවලින් 412 ක් 2013 වර්ෂයට පෙර පුස්තකාලයෙන් ලබා දී තිබුණි.

## 4.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) (i) සංස්ථාව විසින් ජනාධිපතිවරණයේදී එක් ජනාධිපති අපේක්ෂකයකු වෙනුවෙන් වටිනාකම රු. 34,719,750 ක ගුවන් කාලයක් නොමිලේ ලබාදී තිබුණු අතර එම වටිනාකම අපේක්ෂකයා මුදල් ගෙවා ලබාගන්නා ලද ගුවන් කාලය මෙන් සියයට 60 විය. එසේම මෙම අපේක්ෂකයා වෙත රාජ්‍ය ආයතනයක අනුග්‍රහය යටතේ රු. 3,286,750 ක ගුවන් කාලයක් ලබාදී තිබුණි. තවද මුදල් ගෙවන ලද ප්‍රචාරණ කටයුතු වෙනුවෙන් මෙම අපේක්ෂකයාට පමණක් සියයට 50 වට්ටමක් ලබා දී තිබුණු අතරඑහි වටිනාකම රු. 9,088,000 ක් විය.

(ii) එසේම ජනාධිපතිවරණයට අදාළව රු. 5,202,750 ක දැන්වීම් ප්‍රචාරණය කිරීමට සංස්ථාව අපොහොසත් වී තිබුණු අතර ඉන් රු. 1,000,000 ක දැන්වීම් සඳහා මුදල් ලැබී තිබියදීත් ගුවන් කාලය නොදීම හේතුවෙන් එම මුදල් නැවත ගෙවීමට සිදුවී තිබුණි.

(ආ) වැඩසටහන් විකාශය පිළිබඳ නියැදි පරීක්ෂාවකට අනුව ගිවිසුම් වලට එළඹීමකින් තොරව සංස්ථා වැඩසටහන් ලෙස උපලේඛනගත කර රු. 2,146,650 ක් වටිනා තත්පර 2,602 ක විකාශන කාලයක් ජනාධිපති අපේක්ෂකයකුගේ ප්‍රවර්ධන කටයුතු සඳහා යොදා ගෙන තිබුණි.

## 4.4 ද්‍රව්‍ය අක්‍රමිකතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කිරීමකින් තොරව සංස්ථාව විසින් අනුමත නොකරන ලද නාමික අලෙවි ප්‍රවර්ධන වැඩසටහනක් සඳහා රු. 990,000 ක් වැය කර තිබූ අතර එම වියදමට අදාල භාණ්ඩ සංස්ථාවට 2015 අප්‍රේල් 30 දින වන විටත් ලැබී නොතිබුණි.

(ආ) සංස්ථාවට අහිතකර කොන්දේසි සහිත ගිවිසුම් මත අනාගත තාක්ෂණ පරිවර්තනයන්ට නොගැලපෙන භාවිතා කර ඇති සම්ප්‍රේෂක 2 ක් රු. 16,928,653 කට මිලදී ගෙන තිබුණි.

(ඇ) අයවැය ලේඛනය මඟින් මුදල් වෙන් නොකරන ලද අභ්‍යන්තර මාර්ග නවීකරණය කිරීමේ කොන්ත්‍රාත්තුව සඳහා තරඟකාරී මිළ ගණන් කැඳවීමකින් තොරව රු. 5,617,377 ක මුදලකට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණි. විගණනය පෙන්වා දුන් ඉටුනොකළ කාර්යයන් වෙනුවෙන් රු. 116,171 ක් කොන්ත්‍රාත්කරුගෙන් නැවත අයකර ගැනීමට කටයුතු කර තිබුණු නමුත් බස්නාහිර පළාත් මහාමාර්ග ඉදිකිරීම් ප්‍රමිත මිළගණන්වලට වඩා සියයට 60කට වැඩි මිලකට එනම් රු. 1,882,440 ක වැඩි වටිනාකමට කොන්ත්‍රාත්තුව පවරා ඇති අතර එම පාඩුව වගකිවයුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට සංස්ථාව අපොහොසත් වී තිබුණි.

## 4.5 වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබා දුන් සම්පත්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සංස්ථාව විසින් කොන්ත්‍රාත් පදනම මත බඳවා ගෙන අමාත්‍යාංශයේ සේවය සඳහා මුදාහැර තිබුණු නිලධාරීන් 06 දෙනෙකුට සමාලෝචිත වර්ෂය තුළදී වැටුප් හා දීමනා සහ අතිකාල දීමනා වශයෙන් පිළිවෙලින් රු. 3,073,361 ක් හා රු. 1,406,360 ක් ගෙවා තිබුණු අතර එම වියදම් ප්‍රතිපූර්ණය කරගෙන නොතිබුණි.

(ආ) රූපවාහිනී අභ්‍යාස ආයතනයේ සභාපතිගේ රාජකාරි වෙනුවෙන් නිදහස්කර තිබුණු කුළී වාහනයක් වෙනුවෙන් වියදම්කරන ලද රු. 188,140 ක්වූ මුදල ප්‍රතිපූර්ණය කර ගැනීමට තීරණය කර ඇතත් ඒ පිළිබඳව ගිණුම් තබා නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ නොවැම්බර් හා දෙසැම්බර් මාසවල සංස්ථාව සතු වෑන්රථ 2ක් ජනමාධ්‍ය අමාත්‍යාංශය වෙත ලබාදී තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ අවසන් කාර්තුවේදී ජනාධිපති ලේකම් කාර්යාලය සතු වෑන් රථයක් හා ජීප් රථයක් සංස්ථාව වෙත ලබාගෙන තිබුණි.

(ඈ) සංස්ථාව විසින් ජනාධිපති මාධ්‍ය ඒකකයට මාධ්‍ය උපකරණ 06 ක් ලබා දී තිබුණු අතර ඉන් උපකරණ 03 ක වටිනාකම රු1,823,079 ක් විය.

## 4.6 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) රූපවාහිනි ශ්‍රව්‍ය දෘශ්‍ය පුස්තකාලයේ කටයුතු විධිමත්ව හා කාර්යක්ෂමව සිදුකිරීම සඳහා එහි කටයුතු පරිගණක ගත කිරීම පිණිස රු. 1,734,000 ක් වැයකර ස්වයංක්‍රීය බාර්කෝඩ් පද්ධතියක් 2005 වර්ෂයේ මිලට ගෙන තිබුණි. මෙම පද්ධතියේ කොටස් කිහිපයක් හා විද්‍යුත් කැසට් ආරක්ෂණ පද්ධතිය ප්‍රයෝජනයට නොගෙන නිෂ්ක්‍රීයව තබා තිබුණු අතර මේ වන විට අපහරණය කිරීම සඳහා කටයුතු කර තිබුණි.

(ආ) ඉංජිනේරු අංශයෙහි රු. 18,052,749 ක්වූ අමතර කොටස් චලනය නොවන තොග ලෙස වර්ෂ 10කට වැඩිකාලයක් පැවතුණු අතර වාර්ෂික තොග සමීක්ෂණයටද භාජනය කර නොතිබුණි.

4.7 **ප්‍රමාද වූ ව්‍යාපෘති**

ප්‍රවෘත්ති අංශයේ ඉදිකිරීම් කටයුතු කිරීම සදහා 2005 හා 2006 වර්ෂයන්හිදී උපදේශක ගාස්තු හා පස් සාම්පල් පරීක්ෂණ කටයුතු වෙනුවෙන් රු. 183,051 ක් වියදම් කර තිබුණු නමුත් අදාල ඉදිකිරීම් කටයුතු ආරම්භ කර නොතිබුණි.

4.8 **කාර්ය මණ්ඩල පරිපාලනය**

සංස්ථාවේ අනුමත කාර්ය මණ්ඩලය 985 ක් වුවද සමාලොචිත වර්ෂයේ අවසන් දිනට තථ්‍ය කාර්ය මණ්ඩලය 996 ක් විය. HM හා MM කාණ්ඩයේ තනතුරුවල කාර්ය මණ්ඩලයේ 32 කුගේ අතිරික්තයක් නිරීක්ෂණය විය. අනුමත කාර්ය මණ්ඩලයේ නොමැති අනියම්/ තාවකාලික පදනම මත 63 දෙනෙකු සේවයේ යොදවා තිබුණි.

4.9 **වාහන උපයෝජනය**

පහත සදහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී සිදුවු වාහන අනතුරු 16 කින් 5ක් සදහා රු. 695,604 ක අළුත්වැඩියා වියදම් වශයෙන් දරා තිබුණද රු. 669,620 ක් පමණක් රක්ෂණ වන්දි ලෙස ලැබී තිබුණි. තවද අවස්ථා 11කදී වාහනවල අදාළ අළුත්වැඩියාවන් සිදුකර රක්ෂණ වන්දි ලබාගැනීමට හෝ වගකිවයුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි.

(ආ) සංස්ථාව සතු ප්‍රවාහන ඇණියට සංස්ථා වාහන 47 ක් හා කුළී පදනම මත ලබාගත් වාහන සංඛ්‍යාව 17ක් තිබුණි. නිළධාරීන්ට වෙන්කළ වාහන සංඛ්‍යාව 10ක් විය. සමාලෝචිත වර්ෂය තුළදී සංස්ථා වාහන වලින් කි.මි. 1,004,908 ක් ද කුළී පදනම මත ලබාගත් වාහන වලින් කි.මි 576,115 ක් ද වශයෙන් ධාවනය කර තිබුණු මුළු දුර ප්‍රමාණය කිලෝ මීටර 1,581,023 ක් විය. සමාලොචිත වර්ෂයේ ඉන්ධන හා නඩත්තු වියදම් පිළිවෙලින් රු.22,158,873 ක් හා රු.8,521,794 ක් වූයෙන් කිලෝමීටරයකට දරන ලද ඉන්ධන හා නඩත්තු වියදම රු. 19.41 ක් විය. සමාලෝචිත වර්ෂය තුළදී කුළි පදනම මත ලබාගත් වාහන රු.23,135,387 ක් ගෙවා තිබුණි.

(ඈ) වර්ෂය තුළදී වාහන 05 ක් ධාවනයට යොදවා නොතිබුණු අතර , ඉන්ධන රහිතව රියදුරු මහතෙකු වෙත ලබාදී තිබුණු යතුරු පැදියක් විගණිත දිනය වන විටත් සංස්ථාව වෙත භාරදී නොතිබුණි.

5 ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

5.1 ක්‍රියාකාරී සැලැස්ම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය පරිදි ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන අයවැය මඟින් ශබ්දාගාර හා බාහිර විකාශන පහසුකම් පුනරුත්තාපනය හා නවීකරණය වෙනුවෙන් රු. මිලියන 206 ක් වෙන් කර තිබුණි. කෙසේ වුවද සමාලොචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය වෙනුවෙන් පිළියෙල කරන ලද ප්‍රගති වාර්තාව අනුව මෙම අංශයට අදාළ එකදු ව්‍යාපෘතියක්වත් අවසාන කර නොතිබුණු අතර වර්ෂය තුළ නිමකළ යුතු ව්‍යාපෘති 12 න් ව්‍යාපෘති 07 ක් අදාළ වර්ෂය තුලදී ආරම්භ කර හෝ නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ අයවැය මඟින් ප්‍රධාන පාලක මැදිරිය වෙනුවෙන් වර්ෂය තුළදී නිම කළ යුතු ප්‍රාග්ධන ව්‍යාපෘති 07ක් සඳහා රු. මිලියන 89 ක් වෙන්කර තිබූ අතර ඉන් රු. මිලියන 55ක් වටිනා ව්‍යාපෘති 04 ක් ක්‍රියාත්මක කිරීමට ආරම්භ කර තිබුණි. ආරම්භ කරන ලද ව්‍යාපෘති 4 න් ව්‍යාපෘති 02 ක භෞතික ප්‍රගතිය සියයට 50 ක මට්ටමක වූ අතර අනෙක් ව්‍යාපෘති දෙකේ භෞතික ප්‍රගතිය සියයට 10 විය. එසේම රු. මිලියන 34 ක් වටිනා ව්‍යාපෘති 03ක් ආරම්භ කිරීමට හෝ කටයුතු කර නොතිබුණි.

(ඈ) දැනට පවතින විකාශන ජාලය සංවර්ධනය කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන අයවැය මඟින් ව්‍යාපෘති 04ක් වෙනුවෙන් රු. මිලියන 54 ක් වෙන්කර තිබුණි. ඉන් එක් ව්‍යාපෘතියක් පමණක් සම්පූර්ණයෙන්ම නිම කර තිබූ අතර තවත් ව්‍යාපෘති 02 ක් ආරම්භ කිරීමට හෝ කටයුතු කර නොතිබුණි. සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු. මිලියන 29ක් වූ ව්‍යාපෘතියක භෞතික ප්‍රගතිය සියයට 20 ක් පමණක් විය.

(ඉ) රූපවාහිනී ගොඩනැගිලි සංවර්ධන ව්‍යාපෘතිය යටතේ සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන අයවැය මගින් News Studio and Server Room ඉදිකිරීම සඳහා රු. මිලියන 60 ක ව්‍යාපෘති 02 ක් සැලසුම් කර තිබූ නමුත් අදාල වර්ෂයේදී මෙම ව්‍යාපෘති ආරම්භ කිරීමට හෝ කටයුතු කර නොතිබුණි.

(ඊ) සංස්ථාවෙහි තොරතුරු තාක්ෂණය වැඩිදියුණු කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන අයවැය මගින් රු. මිලියන 08 ක් ව්‍යාපෘති 02 ක් වෙනුවෙන් වෙන්කර තිබුණි. ඉන් එක් ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට කටයුතු කර නොතිබූ අතර අනෙක් ව්‍යාපෘතියෙහි කටයුතු ඉටුවීමේ භෞතික ප්‍රගතිය සියයට 20 පමණක් විය.

## 5.2 අභ්‍යන්තර විගණනය

සංස්ථාවේ ස්ථිර අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපිත කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ පළමු අර්ධ වර්ෂයේදී විගණන විමසුම් හා වාර්තා 18ක්ද දෙවන අර්ධ වර්ෂයේදී විගණන විමසුම් හා වාර්තා 18 ක් ද නිකුත් කර තිබුණු නමුත් එම විමසුම් හා වාර්තා වලින් පෙන්වා දුන් කරුණු නිවරදි කිරීමට කටයුතු කර නොතිබුණි.

## 5.3 අයවැය ලේඛනමය පාලනය

අයවැයගත ආදායම් වියදම් සහ තථ්‍ය ආදායම් වියදම් අතර සැලකිය යුතු විචලනයක් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගැනීමට කටයුතු කර නොතිබූ බව නිරීක්ෂණය විය.

6. **<u>පද්ධති හා පාලනයන්</u>**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු සංස්ථාවේ සභාපතිවරයා වෙත වරින්වර පෙන්වා දෙන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුවේ.

(අ) ණයගැති / ණයහිමි පාලනය

(ආ) අයවැය පාලනය

(ඇ) ගිණුම්කරණය

(ඈ) සේවක ණය

(ඉ) අත්තිකාරම් ලබාදීම

(ඊ) ප්‍රතිවෙළඳ ගිවිසුම්

(උ) ගුවන් කාලය විකිණීමේ ආදායම් රැස්කිරීම

(ඌ) සේවක කළමනාකරණය

(එ) ණය අයවීම

ඩබ්ලිව්.පී.සී වික්‍රමරත්න

විගණකාධිපති(වැඩබලන)